# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
*WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2014** අගෝස්තු **05** වන අඟහරුවාදා
2014 ஆவணி 05 செவ்வாய்க்கிழமை
Tuesday 05th August 2014

බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.39** ට පළාත් සභාව රැස් විය.
*மு.ப. 09.39 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.39 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා]** මූලාසනාරූඪ විය.
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services and Information)

ගරු සභාපතිතුමනි, *"2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය"* මම ඉදිරිපත් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.) [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *"කාර්ය පටිපාටි රීති (සංශෝධනය) 2011 කෙටුම්පත"* මම ඉදිරිපත් කරනවා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා [කාරක සභාවේ සභාපති]
Hon. Sisira Jayakody - Chief Government Whip [Chairman of the COmmittee]

ගරු සභාපතිතුමනි, 2014.07.16 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.07.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මීරිගම, කණ්ඩලම, අංක 49/2 හි පදිංචි ඩබ්ලිව්.පී. තිලකසිරි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එතුමා සභාවේ නොමැති නිසා මම පිළිතුරු සභාගත කරනවා.

***[සභාගත කරන ලද පිළිතුරු]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

අ. *කොළඹ 11, ඕල්කොට් මාවතට මුහුණලා වෙළඳ කටයුතු කරන වෙළඳ ප්‍රජාව ඉවත් කිරීමට සැලසුම් කරන බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

අ. *ඔව්.*

***ප්‍රශ්නය :***

ආ. *ඔවුන් වෙළඳාම් කරන එම භූමිය අයිතිව ඇත්තේ කා හටද?*

***පිළිතුර :***

ආ. *වැඩි ප්‍රමාණයක් දුම්රිය දෙපාර්තමේන්තුවට හා අඩු ප්‍රමාණයක් කොළඹ මහ නගර සභාවට*

***ප්‍රශ්නය :***

ඇ. *ඔවුන්ට විකල්ප වශයෙන් ලබා දෙන වෙළඳ කුටි සහිත භූමිය දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමියක් බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

ඇ. *වාර්තා වී ඇති පරිදි දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ව තිබූ භූමියක් බව දනිමි.*

***ප්‍රශ්නය :***

ඈ. *ඉහත විකල්ප වෙළඳ කුටි පිහිටා ඇත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමි දුර සීමාව ඇතුළත නම් උක්ත වෙළඳ කුටි නීති විරෝධී බව ඔබතුමා පිළිගන්නේද?*

***පිළිතුර :***

ඈ. *නාගරික සංවර්ධන අධිකාරි අනුමත සැලසුම් යටතේ එම අධිකාරිය විසින් ඉදිකරනු ලබන හෙයින් පිළිගත නොහැක.*

***ප්‍රශ්නය :***

ඉ. *ඕල්කොට් මාවතේ වෙළඳ ප්‍රජාව වර්ෂ 60 කට අධික කාලයක් තිස්සේ වෙළඳාම් කටයුතු කරමින් සිටින බව ඔබතුමා පිළිගන්නේද?*

***පිළිතුර :***

ඉ. *වාර්තා වී ඇති පරිදි දීර්ඝ කාලයක් වෙළඳ කටයුතුවල නිරත වී ඇති පිරිස් සිටින බව පිළිගනිමි.*

***ප්‍රශ්නය :***

ඊ. *ඉවත් කිරීමක් සිදුවන්නේ නම් ඔවුන් සිටි කාලය හා වෙළෙඳාම සැලකිල්ලට ගෙන වන්දි මුදලක් ප්‍රදානය නොකරන්නේ මන්ද?*

***පිළිතුර :***

ඊ. *වන්දි මුදල් ප්‍රදානය කරන්නේද නැද්ද යන්න නොදනිමි. කෙසේ වෙතත් කොළඹ මහ නගර සභාවට අදාළ දේපළ තුළ වෙළෙඳ ප්‍රජාව සමග බැඳී ඇති පදික කුළී ගිවිසුම ප්‍රකාරව නගර සංවර්ධන කටයුතු සඳහා එක් මසක දැනුම්දීමකින් වෙළෙඳ කටයුතුවලින් ඔවුන් ඉවත් කිරීමට බලය ඇති බව වාර්තා වී ඇත.*

***ප්‍රශ්නය :***

උ. *විකල්ප කඩ කාමර වෙනුවෙන් අය කිරීමට යන මූලික මුදල සහ බදු මුදල තීරණය කරන ලද්දේ කුමන පදනමක් මතද?*

***පිළිතුර :***

උ. *නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන්නක් බැවින් ඒ සම්බන්ධයෙන් නොදනිමි.*

** **[පසුබිම් වාර්තාව]***
*[Background Report]*

*කොළඹ 15, ඕල්කොට් මාවතට මුහුණ ලා වෙළෙඳාම් කටයුතු කරන වෙළෙඳ ප්‍රජාව නගර සංවර්ධන වැඩ සටහන යටතේ ඉවත් කර ඔවුන් වෙනුවෙන් පහසුකම් සහිත වෙළෙඳ සංකීර්ණයක් ඉදි කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනට කටයුතු සිදු කරමින් පවතියි.*

*ඔවුන් විසින් දැනට වෙළෙඳාම් කටයුතු කරනු ලබන භූමියෙහි වැඩිමනත් ප්‍රදේශයක් දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති අතර, සීමිත කොටසක් පමණක් කොළඹ මහ නගර සභාවට අයිතිව ඇත. එලෙස කොළඹ මහ නගර සභාව සමග බැදී ඇති පදික කුලී ගිවිසුම ප්‍රකාරව එකී ඉඩම් කොටසේ සිටින වෙළෙඳ ප්‍රජාව නගර සංවර්ධන කාර්යයන් උදෙසා එක් මාසයක කල්දීමෙන් පසු ඉවත් කිරීමට ප්‍රතිපාදන ඇත.*

*කෙසේ වෙතත් දැනටමත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගත් ස්ථාන කිහිපයක අදියර කිහිපයක් යටතේ ඔවුන් වෙනුවෙන් ද විකල්ප වශයෙන් ලබා දෙන වෙළෙඳ කුටි ඉදි කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර, එසේ ඉදි කිරීම් සිදු වන එක්තරා භූමියක් දුම්රිය දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ භූමියක් බව වාර්තා වී ඇත.*

*කෙසේ වෙතත් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කොළඹ නගර සංවර්ධන සැලසුම් ප්‍රකාරව ඉදිවන එකී ඉදි කිරීම් නීති විරෝධී ඉදි කිරීම් ලෙස සැලකීමට කරුණු නොමැත.*

*කොළඹ මහ නගර සභාවට අයත් ඉඩම් කොටසෙහි වෙළෙඳාම් කරන ලද වෙළෙඳ ප්‍රජාව සමග බැදී ඇති ගිවිසුම ප්‍රකාරව එක් මසක දැනුම් දීමකින් නගර සංවර්ධනය උදෙසා ඔවුන් ඉවත් කිරීමේ හැකියාව පවත්නා තත්ත්වයක වන්දි ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති අතර, මෙම සියලු කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සිදු වන තත්ත්වය තුළ ඒ සම්බන්ධයෙන් නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.*

*තවද ඉදි කරනු ලබන කඩ කාමර සම්බන්ධයෙන් අය කරනු ලබන මුදල් තීරණය කිරීම නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සිදු වන හෙයින් ඒ සම්බන්ධයෙන් නිශ්චිතව කරුණු ප්‍රකාශ කළ නොහැකි බව කාරුණිකව පෙන්වා දෙමි.*

# බස්නාහිර පළාතේ පාසල්
SCHOOLS OF WESTERN PROVINCE

** **[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**02.**

**මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/24)**

අ. බස්නාහිර පළාත තුළ පළාත් සභා පාසල් හා ජාතික පාසල් වෙන් වෙන් වශයෙන් කොපමණ සංඛ්‍යාවක් තිබේද?

ආ. පාසල් වර්ගීකරණයට අනුව 1. A B, 1C, 2 වර්ගයට අයත් පාසැල් සංඛ්‍යාව කොපමණද?

ඇ. 1961 පාසැල් පවරා ගැනීමේ පනත අනුව ආගමික අනුපාතය පවත්වා ගත යුතු බස්නාහිර පළාතට අයත් පළාත් සභා පාසල් සංඛ්‍යාව කොපමණද ?

ඈ. ආගමික අනුපාතය පවත්වා ගත යුතු පාසල්වල අදාළ ආගමික අනුපාතයට අවශ්‍ය සිසුන් නොමැති කල්හි වෙනත් ආගමික දරුවන් බඳවා ගැනීමට බාධාවක් තිබේද?

ඉ. පාසල් පවරා ගැනීමේ පනත යටතේ පවරා ගනු නොලැබූ අනිකුත් පාසල්වල අනුපාතයක් පවත්වා ගත යුතු නොවන බව ඔබතුමා දන්නෙහිද?

ඊ. එසේ නම්, එකී පාසල් සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. පළාත් පාසල් 1270 කි.
ජාතික පාසල් 71 කි. (ඇමුණුම - 1) [1]

ආ. 1 AB පාසල් 171 කි.
1 C පාසල් 264 කි.
TYPE 2 පාසල් 542 කි. (ඇමුණුම - 1)

ඇ. 701.

ඈ. නැත.
අධ්‍යාපන ලේකම්ගේ අංක 23/2013 චක්‍රලේඛයේ 3.2 ඡේදයේ එය පැහැදිලිව සඳහන්ව ඇත. (ඇමුණුම - 2) [2]-

ඉ. දනිමි.

ඊ. සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය හා පවරා ගනු නොලැබූ පාසල්වල ශිෂ්‍ය අනුපාතය අනුව බඳවා ගැනීම් සිදු කරයි.

**WESTERN PROVINCE**

SCHOOL CENSUS 2013/06/01

අ. (2) (A) NO. OF SCHOOL BY NATIONAL/ PROVINCIAL

| DISTRICT | NS | PS | TOTAL SCHOOLS |
|---|---|---|---|
| COLOMBO | 36 | 367 | **403** |
| GAMPAHA | 17 | 514 | **531** |
| KALUTARA | 18 | 389 | **407** |
| **WESTERN PROVINCE** | **71** | **1270** | **1341** |

ආ. (2) (B) NO. OF SCHOOLS BY SCHOOL CLASSIFICATION

| DISTRICT | 1AB | 1C | TYPE 2 | TYPE 3 | TOTAL SCHOOLS |
|---|---|---|---|---|---|
| COLOMBO | 72 | 81 | 162 | 88 | **403** |
| GAMPAHA | 54 | 113 | 210 | 154 | **531** |
| KALUTARA | 45 | 70 | 170 | 122 | **407** |
| **WESTERN PROVINCE** | **171** | **264** | **542** | **364** | **1341** |

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.
[2] හැන්සාඩ් අංශයේ තබා ඇත.

# පළාතේ පාසල්වල විදුහල්පති පුරප්පාඩු පිරවීම
# FILLING PRINCIPAL-POST VACANCIES IN PROVINCIAL SCHOOLS

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**03.**

**මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/25)**

අ. බස්නාහිර පළාතේ පාසල්වල විදුහල්පති පුරප්පාඩු පිරවීමේදී 1998/23 චක්‍රලේඛයට අනුව අයදුම්පත් කැඳවා විධිමත්ව විදුහල්පති පුරප්පාඩු පිරවිය යුතු බව ඔබතුමා පිළිගන්නෙහිද?

ආ. මේ වන විට බස්නාහිර පළාත් සභාවට අයත් විදුහල්පති පුරප්පාඩු ඇති පාසල් සංඛ්‍යාව කොපමණද?

ඇ. 2014.06.04 දින රජයේ පුවත්පත්වල විදුහල්පති පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමේදී සමස්ත පුරප්පාඩු ඇති පාසල් සංඛ්‍යාව ඇතුළත් වී නොමැති බව ඔබතුමා දන්නෙහි ද?

ඈ. එසේ ඇතුළත්ව නොමැති පාසල්වල විදුහල්පති පුරප්පාඩු පිරවීමට ගන්නා කඩිනම් පියවර කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. පිළිගනිමි.

ආ. 64.

ඇ. ඔව්.
2014.06.04 දින රජයේ පුවත්පත්වල පළ කළේ 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා විදුහල්පති පුරප්පාඩු පවතින හා ඇති වන පාසල්ය. (2014.06.04 දින රජයේ පුවත්පත්වල පළ කළ විදුහල්පති පුරප්පාඩු සඳහා පාසල්

කිහිපයකටම කිසිදු ඉල්ලුම්පතක් ලැබී නොමැත. (අදාළ පාසල්වල නාම ලේඛනය අමුණා ඇත.[3])

ඈ. 2010 වර්ෂයේ සිට පාසල්වල වැඩ බලන විදුහල්පතිවරු සිටින අතර එම පාසල් සක්‍රීයව ක්‍රියාත්මක වේ. නමුත් එම පාසල්වල යම් පිරිහීමක් තිබේ නම්, එම විදුහල්පතිවරු ඉවත් කර අවස්ථානුකූලව තීරණ ගනු ලැබේ.

**2014.06.04 දින පුවත්පත් දැන්වීමට අනුව විදුහලල්පති පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් ලැබී නොමැති පාසල් නාම ලේඛනය**

| අනු අංකය | පාසලේ නම |
|---|---|
| 01. | කළු/සරික්කමුල්ල රෝමානු කතෝලික ප්‍රා.වි. |
| 02. | කළු/අලවියා මුස්ලිම් විද්‍යාලය |
| 03. | හො/යටවර කනිෂ්ට විද්‍යාලය |
| 04. | හො/මිල්ලෑව දෙමළ විදුහල |
| 05. | හො/වෙනිවැල්පිටිය කනිෂ්ට විද්‍යාලය |
| 06. | මතු/පරෙයිගම මහ විදුහල |
| 07. | මතු/උඩුගම කනිෂ්ට විද්‍යාලය |
| 08. | මතු/ගුරුඑබැද්ද ප්‍රාථමික විදුහල |
| 09. | මතු/ගම්මන මහ විදුහල |
| 10. | පිළි/පුන්‍යකාමී විදුහල |
| 11. | පිළි/කොරළවැල්ල රෝමානු කතෝලික විදුහල |
| 12. | හෝ/කහතුඩුව කනිෂ්ට විද්‍යාලය |
| 13. | මීග/කුඩුපාටුව සිංහල මිශ්‍ර විදුහල |
| 14. | මීග/සාන්ත ෆ්‍රැන්සිස් ද සාලේස් ද.ද්වි. විදුහල |
| 15. | මීග/පිටිපන මහ විදුහල |
| 16. | මීග/ජිනරාජ ප්‍රාථමික විදුහල |
| 17. | මීග/පමුණුගම මහ විදුහල |
| 18. | මිනු/හඟවත්ත ප්‍රාථමික විදුහල |
| 19. | මිනු/රදාවඩුන්න සිරි මිහිඳු මහ විදුහල |
| 20. | කැල/එච්.කේ. ධර්මදාස ප්‍රාථමික විදුහල |
| 21. | කැල/බුලත්පිටිය මහ විදුහල |
| 22. | කැල/දික්ඕවිට ශාස්ත්‍රාලෝක කනිෂ්ට විද්‍යාලය |
| 23. | කැල/මත්තුමල රෝමානු කතෝලික විදුහල |
| 24. | කැල/දළුපිටිය ප්‍රාථමික විදුහල |
| 25. | ගම්/වැලිකඩ ධර්මපාල කනිෂ්ට විද්‍යාලය |
| 26. | ගම්/ලුණුගම සිරි පැරකුම්බා මහ විදුහල |
| 27. | ගම්/පැලහැර ශ්‍රී රාහුල ප්‍රාථමික විද්‍යාලය |
| 28. | ගම්/පැපිලියවල කනිෂ්ට විද්‍යාලය |

[3] පිළිතුර අවසානයේ පළ කර ඇත.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් අහනවා. කඩිනමින් පියවර ගන්න සාමාන්‍යයෙන් සති කීයක් වාගේ යනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක පුළුවන්තරම් කඩිනමින් කරනවා ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට මම පෙන්වන්නම්. අපි ඉල්ලුම් පත්‍ර කැඳවපු පාසල් අතර එකම ඉල්ලුම් පත්‍රයක්වත් ආපු නැති පාසල් තිබෙනවා. එතැන පාසල් 28 ක් තිබෙනවා. ඒ වාගේ අවස්ථාවලදී ඉල්ලුම්පත් නොමැති නම් අපි ඒකට විකල්ප වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා.

## පාමංකඩ සංඝමිත්තා විදුහලේ ගොඩනැගිලි පැවරීම : ජාතික ශිෂ්‍ය භට බලකා මූලස්ථානය

## ASSIGNING BUILDINGS OF SANGHAMITTHA SCHOOL PAMANKADA: NATIONAL CADET OFFICERS' HEADQUARTERS

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**04.**

**ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/26)**

අ. 2004.09.06 පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයකට අනුව ජාතික ශිෂ්‍ය භට බලකා මූලස්ථානයට බප/පිළි/පාමංකඩ සංඝමිත්තා විද්‍යාලයේ ගොඩනැගිල්ල සහිත භූමිය වසර 25 ක කාලයකට ලබා දී ඇති බව පිළිගන්නේද?

ආ. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි එකඟතාවයෙන් තොරව කිසිම භෞතික වෙනස් කිරීමක් නොකළ යුතුය යන්න එහි කොන්දේසියක් බව පිළිගන්නේද?

ඈ. අදාළ කොන්දේසි කඩකරමින් භෞතික වෙනස් කිරීම් සිදු කර ඇති බව දන්නෙහිද?

ඇ. මේ වන විට අදාළ ස්ථානයේ සිදු කරනු ලබන කාර්යයන් පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණට එකඟවන්නෙහිද?

ඉ. නොඑසේනම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. පිළිගනිමි. (ඇමුණුම - 1)[4]

ආ. පිළිගනිමි. (ඇමුණුම - 1)

ඈ. වාර්තා වී නැත. එහෙත් එවැනි සිදුවීමක් සිදුව ඇතිනම් ස්ථානීය පරීක්ෂාවක් සිදු කරවා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.

ඇ. ඔව්. (ඇමුණුම - පසුබිම් වාර්තාව) [5]

ඉ. අදාළ නොවේ.

***[පසුබිම් වාර්තාව]***
*[Background Report]*

*2004.09.06 දින පැවති පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී බප/පිළි/සංඝමිත්තා විදුහලේ ගොඩනැගිල්ලක් සහිත භූමිය ජාතික ශිෂ්‍ය භට බලකා මූලස්ථානය පවත්වාගෙන යාම සඳහා වසර 25 කට ලබා දීමට ගරු අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.*

*ඒ අනුව දෙහිවල ජාතික ශිෂ්‍ය භට බලකා මූලස්ථානයේ ලුතිනන් කර්නල්, එන්.එම්.බී. වීරකෝන් මහතා අමතන ලද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ 2004.10.04 දිනැති ලිපියෙන් කොන්දේසි 6 ක් සහිතව ඉහත පවරාදීම සිදු කර ඇත. එහි තුන්වන කොන්දේසියට අනුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි බලධාරීන්ගේ එකඟතාවයකින් තොරව කිසිම භෞතික වෙනස් කිරීමක් නොකළ යුතු බව සඳහන්ව ඇත.*

*ඉහත සඳහන් බ.ප. අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලිපියේ 03 ඡේදය මගින් දන්වා ඇති පරිදි දිවයිනේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන අවුරුදු 14 ත් 20 ත් අතර සිසුන්ගේ පෞරුෂය හා නායකත්ව ගුණාංග වැඩි දියුණු කිරීම තුළින් රටට වැඩදායක පුද්ගලයන් බිහි කිරීමේ ප්‍රධාන අරමුණින් මෙම ගොඩනැගිලි සහිත භූමිය ලබා දී ඇත. එම කාර්යය සඳහා පමණක් මෙම විදුහල ගොඩනැගිල්ල සහිත ඉඩම යොදා ගන්නා බවට ජාතික ශිෂ්‍ය භට බලකායේ අධ්‍යක්ෂ, මේජර් ජෙනරල් පී.ඩී.ඩබ්ලිව්. ජයසුන්දර මහතා විසින් පළාත් අධ්‍යාපන ලේකම් වෙත යවා ඇති 2013.05.30 දාතමැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව මෙම ස්ථානයේ සිදු කරනු ලබන කාර්යය බ.ප. අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණට අදාළ බව පැහැදිලි වේ.*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේ පිළිතුරට අදාළව අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා පවසන්නේ, මේ සම්බන්ධව වෙනස් කිරීම් සිදු කිරීම පිළිබඳව වාර්තා වී නැහැයි කියලා. ඒක හොඳින් පෙනෙනවා. වෙනස් කිරීම් කරලා තිබෙනවා. එහෙම සිද්ධ වෙන්නේ කොහොමද කියලා - ඒ කියන්නේ, මගේ ළඟ තිබෙනවා, ඒ එකඟතාවය. මේ පාසල ලබා දීමේදී ඇති වුණු එකඟතාවය. ඒ එකඟතාවය අනුව සඳහන් වෙනවා මේකේ මොකක් හෝ දෙයක් වෙනස් කිරීමක් කරනවා නම් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අනුමැතියක් ගන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අනුමැතියක් ගන්න ඕනෑ. එහෙම අනුමැතියකින් තොරව තමයි ඒවා කරලා තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා, ස්ථානගත පරීක්ෂණයක් පවත්වන්න කටයුතු කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ වාගේම ගරු සභාපතිතුමනි, දැනට ශිෂ්‍යය භටයින් පුහුණු කිරීමේ කටයුතු තමයි මෙය පවරා ගැනීමේදී

[4] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[5] පිළිතුර අවසානයේ පළ කර ඇත.

ප්‍රධාන වෙලා තිබෙන්නේ. නමුත් අපට වාර්තා වන අන්දමට එහෙම කිසිම දෙයක් මෙතැන වෙන්නේ නැහැ. ඒ නිසා ඒකත් අධීක්ෂණයට ලක් වෙන්න ඕනෑ කාරණයක්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒකත් සොයා බලන්න කටයුතු කරනවා.

# රුහුණු මහ කතරගම දේවාලයේ ඇසළ මංගල්‍යය : රාජකාරී නිවාඩු ගැනීම

ESALA FESTIVAL OF RUHUNU MAHA KATHARAGAMA TEMPLE: OBTAINING DUTY LEAVE

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**05.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/27)**

අ. i. රුහුණු මහ කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ මහා මංගල්‍ය පෙරහැර බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජකාරී කටයුත්තක් ලෙස ඔබතුමා පිළිගන්නේද?

ii. එසේ පිළිගන්නේ නම් ඒ කුමන රාජකාරියක්ද? යන වගත්, කුමන චක්‍ර ලේඛයකට අනුව එය රාජකාරියක් වන්නේද? යන වගත්, මෙම සභාවට පැහැදිලි කරන්නේද?

ආ. i. එය රාජකාරී කටයුත්තක් නොවන්නේ නම් බස්නාහිර පළාත් අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් /වේළුවනවිද්‍යාලය,කො/සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.වි. හෝ ඉලුක්ඕවිට ක.වි හෝ/මිල්ලෑව ම.වි යන පාසල්වල සේවක මහතුන් හතර දෙනෙකුට හා නර්ථන උපදේශිකාවකට 2014.06.28 සිට 2014.07.13 දක්වා රාජකාරී නිවාඩු අනුමත කර ඇත්තේ කුමන පදනමකින්ද?

ii. එමෙන්ම උක්ත නර්ථන උපදේශිකාවට 2014.06.19 හා 20 දෙදින රාජකාරී නිවාඩු ලබා දීම අනුමත කර ඇත්තේ කුමන පදනමකින්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. i. නැත.

ii. අදාළ නොවේ.

ආ. i. මෙම නර්තන උපදේශිකාව හා සේවක මහත්වරුන් 04 දෙනා බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම මත එම අමාත්‍යාංශය හරහා බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය වෙත අනුයුක්ත කර ඇත. (ඇමුණුම 1 ABCDEFG) [6]

ජාතික උත්සවයක් වන රුහුණු මහා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ පෙරහැර සඳහා බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය විසින් ඉදිරිපත් කරන නර්තන කණ්ඩායමෙහි සාමාජිකයන් වන මෙම සේවක මහත්වරුන්ට හා නර්තන උපදේශිකාවට රාජකාරී නිවාඩු ලබා දෙන ලෙස බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් වෙතින් කළ ඉල්ලීම අනුව රාජකාරී නිවාඩු අනුමත කර ඇත. (ඇමුණුම 2 ABC)[7]

ii. උක්ත (ආ) i හි පිළිතුර අදාළ වේ.

---

[6] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[7] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න අංක 'අ' i හා ii ට අදාළව පැහැදිලි කළේ, මේ රුහුණු මහ කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ මහ මංගල්‍ය පෙරහැරට කිසිදු රාජකාරී කටයුත්තක් නොවෙයි කියලා. නමුත් මම අහන්නේ - ඊට පස්සේ ඔබතුමාම කියනවා, නමුත් කරපු ඉල්ලීමකට අනුව මේ හතර දෙනාට රාජකාරී නිවාඩු අනුමත කරලා තිබෙනවා කියලා. මා සතුව තිබෙනවා රාජකාරී නිවාඩු අනුමත කළ ලිපිය. මම අහන්නේ, එහෙම නම් මොන පදනමකින්ද රාජකාරී නිවාඩු අනුමත කළේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් ඔබතුමාගේ ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවල පැහැදිලිව කියලා තිබෙනවා, මෙම හතර දෙනා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම මත එම අමාත්‍යාංශයේ සෞන්දර්ය නිකේතනය වෙත අනුයුක්ත කරලා තිබෙන අය කියලා. එතකොට ඒ අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද ඉල්ලීමක් අපි අනුමත කරලා තිබෙනවා. ඒ අනුව කතරගම රුහුණු මහ දේවාලයේ වාර්ෂික පෙරහැර ජාතික උත්සවයක් නිසා ඒක අනුමත කරන්න අමාත්‍යාංශය කටයුතු කරලා තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක තමයි මම අහන්නේ, කතරගම ඇසළ මහ පෙරහැරට රාජකාරී නිවාඩු අනුමත කරන්න, කුමන චක්‍රලේඛයකින්ද අවසර දීලා තිබෙන්නේ කියන ප්‍රශ්නය තමයි මට තිබෙන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

චක්‍රලේඛයක් අවශ්‍ය නැහැ. අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි.

# පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීම් හා මාරු කිරීම්

## APPOINTMENTS AND TRANSFERS IN PROVINCIAL PUBLIC SERVICE

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**06.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **(ප්‍ර/VI(1)/14/28)**

අ. i. පළාත් රාජ්‍ය සේවයේ පත්කිරීම් හා මාරු කිරීම් විනය බලධාරීත්වය සම්බන්ධව ව්‍යවස්ථාපිත බලධාරියා කවුද?

ii. ඔහුගේ එකී බලය ක්‍රියාත්මක කිරීමට කිසියම් අභිනියෝජිතයකු හෝ අභිනියෝජිතයින් පත් කර තිබේද?

iii. එසේ නම් ඔවුන් කවුරුන්ද?

ආ. i. විදුහල්පතිවරුන් පත් කිරීම, මාරු කිරීම සම්බන්ධ ව්‍යවස්ථාපිත බලධාරියා කවුද?

ii. පළාත තුළ විදුහල්පතිවරුන් පත් කර තිබෙන්නේ, එකී ව්‍යවස්ථාපිත බලයට අනුකූලවදැයි පැහැදිලි කරන්නේ ද?

iii. කළුතර මුස්ලිම් විද්‍යාලයේ හා කළුතර ජීලාන් මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරුන් පත් කර තිබෙන්නේ ව්‍යවස්ථාපිත බලයට අනුවද?

iv. පළාතේ මුස්ලිම් පාසල්වල විදුහල්පතිවරුන් ගුරුවරුන් පත් කිරීම හා මාරු කිරීමට අදාළ බලතල ගරු ආණ්ඩුකාරතුමා වෙත පවරා තිබේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. i. බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා.

ii. ඔව්.

iii. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරා දී ඇති පරිදි බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්, බස්නාහිර පළාත් සභා ලේකම්, බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, බස්නාහිර පළාත් පළාත් පාලන කොමසාරිස්, බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් ආයුර්වේද කොමසාරිස්, බස්නාහිර පළාත් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, බස්නාහිර පළාතේ මහ නගර සභා නාගරික කොමසාරිස්වරුන්, බස්නාහිර පළාතේ නගර සභා සහ ප්‍රාදේශීය සභාවල ලේකම්වරුන්.

ආ. i. පළාත් සභාවේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

ii. පවරා ඇති බලතල අනුව විදුහල්පතිවරු පත් කිරීම කරනු ලැබේ.

iii. ඔව්.

iv. නැත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, කළුතර මුස්ලිම් විද්‍යාලය 1AB පාසලක්. ඒක ඔබතුමා පිළිගන්නවා. එතකොට මේ පාසලේ දැනට ඉන්න විදුහල්පතිවරයා II(II) ශ්‍රේණියේ. නමුත් ඒ පාසලේම I ශ්‍රේණියේ විදුහල්පතිවරයෙක් ඉන්නවා. එසේ තිබියදී තමයි II(II) ශ්‍රේණියේ විදුහල්පතිවරයෙක් මේ පාසලට පත් කරලා තිබෙන්නේ. ඒ කුමන ව්‍යාවස්ථාපිත බලයක් අනුවද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පසුව සිදු කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මීට කලිනුත් පසුව පිළිතුරු දෙනවා කියපු ප්‍රශ්නවලට මට උත්තර නම් ලැබුණේ නැහැ. මීට කලින් ප්‍රශ්නවලදී පසුව පිළිතුරු දෙනවා කියලා කල් දාපු ඒවාට මට උත්තර ලැබුණේ නැහැ. ඒක න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලාත් නැහැ. ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නේ කොහොමද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. මීට කලින් අතුරු ප්‍රශ්න අහද්දිත් ගරු ප්‍රධාන ඇමැතිතුමා සඳහන් කළා, පසුව පිළිතුරු දෙනවා කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ සම්බන්ධව මම සොයා බලන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

***න්‍යාය පත්‍රයේ අංක 07 යටතේ ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට මාසයක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය අදාළ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon.Lakshman Nipuna Arachchi, Member, under item No. 07 of the agenda, was presented to Hon. Minister of Transport and as one month time was asked for, Hon. Chairman ordered the question to be referred to the relevant Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 08 යටතේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon.Jagath Withana, Member, under item No. 08 of the agenda, was presented to Hon. Minister of Health and as two weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

# කළුතර දිස්ත්‍රික්කයේ අළුත්ගම සහ බේරුවල ඇති වූ ගැටුම් : අලාභහානි

CONFLICTS IN ALUTHGAMA AND BERUWALA AREAS OF KALUTARA DISTRICT : LOSSES AND DAMAGES

**09.**

**මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/32)**

අ. 2014 ජූනි 12, 13, 14, 15, 16 දිනයන්හි බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි අළුත්ගම හා බේරුවල ඇතුළු කළුතර දිස්ත්‍රික්කය තුළ ගැටුම්කාරී තත්වයක් ඇති වූ බව ඔබතුමා දන්නෙහිද?

ආ. එම ගැටුම්කාරී තත්වය නිසා ඇති වූ අලාභහානී තක්සේරු කර තිබේද?

ඇ. එසේනම් ඒ කොපමණද?

ඈ. එම ගැටුම්කාරී තත්වය නිසා විනාශ වූ නිවාස, කඩසාප්පු, ආගමික ස්ථාන, කර්මාන්ත ශාලා, වාහන හා වෙනත් චංචල දේපළ වෙන් වෙන් වශයෙන් කොපමණද ?

ඉ. ජීවිත හානි කොපමණද ?

ඊ. එම අලාභ හානි සඳහා බස්නාහිර පළාත් සභාව වන්දි ගෙවීමක් සිදු කරන්නේද?

උ. නො එසේනම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්.

ආ. අදාළ නොවේ.

ඇ. අදාළ නොවේ.

ඈ. අදාළ නොවේ.

ඉ. අදාළ නොවේ.

*ගරු සභාපතිතුමනි, එහෙම කියන්න හේතුව තමයි ඒ සම්බන්ධව අපි දන්නවා. නමුත් මරණ වාර්තා අනුව ඒ සිද්ධිය නිසා වුණාද කියන එක තෝරලා බේරලා ඉදිරි කාලයේ පිළිතුරක් ලබා දෙන්න කටයුතු කරනවා.*

ඊ. අදාළ නොවේ.

උ. අදාළ නොවේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. 'ආ' ප්‍රශ්නය අනුව එම අලාභහානි තක්සේරු කර තිබේද කියන එකට ගරු ප්‍රධාන ඇමැතිතුමා උත්තර දුන්නා. නොදන්නවාද? නැත්නම් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එම විෂයය මට අදාළ දෙයක් නොවෙයි. ඒක ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කරන ලද දෙයක්. ඒකට පළාත් සභාවෙන් අපි තක්සේරුවක් කරලා නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

පළාත් සභාවෙන් තක්සේරුවක් කරන්නේ නැහැ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි වියදම් කරන විමධ්‍යගත අරමුදල් පිළිබඳව අපට සාකච්ඡා කරන්න තිබෙන ප්‍රධානම තැන තමයි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව. ඒකේදී තමයි අපි යොදන මුදල් නිවැරැදිව පාවිච්චි වුණාද? ඒකේ වැරැද්දක් තිබෙනවාද? ඒක හඳාගන්නේ කොහොමද කියලා සියලු දේවල් සාකච්ඡා කරන්නේ. ඊට අමතරව මන්ත්‍රීවරයා විධියට ආසනය තුළ මිනිස්සු අපට දීලා තිබෙන බලය

පාවිච්චි කරලා මිනිස්සුන්ගේ ප්‍රශ්න කථා කරන්නේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ඇතුළේ. ඒකට සහභාගී වෙන්න තිබෙන අයිතිය උල්ලංඝණය වෙනවා නම් ඒක අපේ වරප්‍රසාද උල්ලංඝණය වීමක්. අද මේ වෙලාවේ ගරු සභාපතිතුමනි, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ කමිටුව තිබෙනවා. මීට කලිනුත් මේ සභාවේ මන්ත්‍රීවරුන් කථා කරලා කිව්වා, පළාත් සභා රැස්වීම තිබෙන දවසේ සම්බන්ධීකරණ කමිටු රැස්වීම් තියන්න එපා කියලා. නමුත් ඒ රැස්වීම් තියෙනවා. එකෙන් අපට සහභාගී වෙන්න, අපේ අදහස කියන්න, අපේ ප්‍රශ්න මතු කර ගන්න තිබෙන ඉඩකඩ නැති වෙලා යනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපට මේ වරප්‍රසාදය ආරක්ෂා කරලා දෙන්නය කියලා. විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම්තුමාට ඊයේ කථා කළාම කිව්වේ පළාත් සභා රැස්වීම් තිබෙන දවස් ඔහු දන්නේ නැහැයි කියලා. ඉතින් ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා මුළු අවුරුද්ද පුරාම තිබෙන අපේ පළාත් සභා රැස්වීම් දින ටික බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට තැපැල් කරලා යවන්න කියලා. ඒ දින ඇතුළේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් දාන්න එපා කියලා. එහෙම වුණොත් අපේ වරප්‍රසාද අහිමි වෙනවා. අපට කථා කරන්න තිබෙන ඉඩකඩ නැති වෙලා යනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉදිරි කාලය තුළ අපි ඒ පිළිබඳව ලේකම්තුමා හරහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීමට කටයුතු කරනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන අයිති මේ පළාත් සභාවට. හැබැයි අපි දන්නවා, විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් මත තමයි ඒ පළාත් පාලන ආයතන බල සීමාව තුළ සංවර්ධන කටයුතු කිරීම්, ඒ වාගේම යම් යම් කර්මාන්ත පිහිටුවීම් පිළිබඳව වගකීම් තිබෙන්නේ. හැබැයි, මේ වනකොට නාගරික සංවර්ධන අධිකාරිය විසින් අරගෙන තිබෙන සමහර තීන්දු නිසා, අපේ ගම්වල අහිංසක ජනයා ඉතාම තදබල විධියට අසහනයට පත් වෙලා ඉන්නවා. දැන් පසුගිය කාලපරිච්ඡේදය තුළ ඉඩම් කට්ටි කිරීමේදී හෝ එහෙම නැත්නම් ඉඩමක් කාට හරි බෙදා දීමේදී තිබුණු නීතිය තමයි හෙක්ටයාරයකට වැඩි ඉඩමකට තමයි නගර සැලසුම් ශිල්පියෙකුගේ අනුමැතිය ලැබෙන්නේ. එලෙස අනුමැතිය අවශ්‍යයි කියලා නාගරික සංවර්ධන අධිකාරියෙන් චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. හැබැයි, මේ වනකොට ගරු සභාපතිතුමනි ඒක ඉඩම් කැලි තුන දක්වා අඩු කරලා තිබෙනවා. නගර නිර්මාණ ශිල්පියෝ ඉන්නේ නාගරික සංවර්ධන අධිකාරියේම තමයි. දැන් නාගරික සංවර්ධන අධිකාරියෙන් සැලසුම් කමිටුවට එන නිලධාරීවරයා ලියනවා, මේ කැලි තුනට නගර සැලසුම් ශිල්පියෙක්ගේ අනුමැතිය ලබා ගත යුතුයි කියලා. එගොල්ලෝ මේ නාගරික සංවර්ධන අධිකාරියට ඇවිල්ලා මේක ලබා දෙන්න කියලා, අදාළ නගර නිර්මාණ ශිල්පියෙකුගෙන් ඉල්លුවාම, අපි දන්නවා ඒ ඉන්න නාගරික සංවර්ධන අධිකාරියෙන් එන නගර සැලසුම් ශිල්පියා මහත්තයෝ, අපි එහෙම තැනක් දන්නේ නැහැ. ඉන්න එක්කෙනෙක් ගැන කිව්වාම එයාම කියනවා නාගරික සංවර්ධන අධිකාරියේ අහවල් තැන නිලධාරියා ඉන්නවා. එතැනට ගිහිල්ලා මේ කැලි තුනට අනුමැතිය ගේන්න කියලා. එතැනට අර මනුස්සයා ගියාම කරන්නේ, එකම දෙයයි. ලාච්චුව ඇරලා සීල් එක එළියට ඇදලා ගන්නවා. අරන් ඒකේ සීල් එක තියනවා. රුපියල් 7500/- ක් අය කරනවා. ඒ නිසා අපි දකින්නේ, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරී මහත්තයා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට ගාණක් සොයලා දෙන ක්‍රමයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ක්‍රමය මිනිස්සුන්ට අවාසිදායකයි. නීතිය තිබෙන්නේ, හෙක්ටයාර් එකකට වැඩි නම් තමයි ඒක කරන්න ඕනෑ. ඒක්කෝ වෙන්දේසි ඉඩමක්. එහෙම නැත්නම්, අඩු ගණනේ කැලි දහයකට එහා වුණත් කමක් නැහැ.

මේ ප්‍රශ්නය මතු වුණේ එක්තරා තාත්තා කෙනෙක් තමුන්ගේ දරුවෝ තුන්දෙනාට ඉඩම් කැලි තුන ලියලා, ඒ දරුවෝ තුන් දෙනාට ඒක බෙදලා දෙන්න යන්න සූදානම් වෙලා අනුමැතියට දැම්මාම, නාගරික සංවර්ධන අධිකාරියෙන් පළාත් පාලන ආයතනයට එන සැලසුම් ශිල්පීයා මේ වාර්තාවේ ලියනවා, මේකට නගර නිර්මාණ ශිල්පියෙක්ගේ අවසරය ගන්නට ඕනෑය කියලා. ඒක එක කාරණයක්. අනෙක් එක පසුගිය කාල පරිච්ඡේදය තුළ හෝස් පවර් එක දෙක වාගේ පුංචි ලී මඩු සඳහා අදාළ පළාත් පාලන ආයතනවල. නගර සභාවල, ඒ වාගේම පළාත් පාලන ආයතනවල තාක්ෂණ කමිටුවක් පත් කරලා තිබුණා.

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

මෙය පළාත් පාලන ආයතනවල තියෙද්දී එතැන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ශිල්පියා, පරිසර අධිකාරියේ පරිසර නිලධාරීන්, කාර්මික නිලධාරීන් සියලු දෙනාම ගිහිල්ලා ස්ථානීය පරීක්ෂණයක් කරලා ඒ පරීක්ෂණයට අනුකූලවට යන්ත්‍රයේ ධාරිතාව අනුව අවශ්‍ය අනුමැතිය දීමේ ක්‍රමවේදයක් තිබුණා. අද ඒක නවත්වලා. කෙලින්ම යන්න ඕනෑ නාගරික සංවර්ධන අධිකාරියට. නාගරික සංවර්ධන අධිකාරිය ලිපියක් දෙනවා, පරිසර අධිකාරියට ගිහිල්ලා වාර්තාවක් ගේන්න කියලා. පරිසර අධිකාරියෙන් එනවා ඩෙසිබල් චෙක් කරන්න. එහෙම ආවාම ඒකට විශාල මුදලක් අය කරනවා. ඒ නිසා මේ නාගරික සංවර්ධන අධිකාරිය ගෙන යන අත්තනෝමතික වැඩ පිළිවෙළ නිසා අපේ ගම්වල ඉන්න සාමාන්‍ය මිනිස්සුන්ට මේකෙන් ඉතාම කරදරයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒකේ නිලධාරීන්ට ඕනෑ ඕනෑ විධියට වැඩ කරන්න නාගරික සංවර්ධන අධිකාරිය කියන්නේ, සුපිරි අමාත්‍යාංශයක් නොවෙයි. අද අපි මේවා ගැන හොයන්න ඒකට ගියාම ඒක හරියට යුධ හමුදාවේ අනු කණ්ඩයක් වාගේ. ඒ නිසා වහාම මේ තත්ත්වය ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කරලා, මේ පිළිබඳව සාකච්ඡාවක් කරලා අපේ පළාත් පාලන ආයතනවලට මේ ඉහළින් දමන අනවශ්‍ය නියෝග නීතිරීති නවත්වලා දෙන්න කටයුතු කරන්න. ඒක කිරීම තුළ ලාභදායී සහ පහසුවක් වෙන්නේ අපේ ගම්වල ජීවත් වන මිනිස්සුන්ට කියන එක මතක් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට යොමු කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා මාගේ ප්‍රශ්නයට අදාළව පිළිතුරු සභාගත කරන වෙලාවේදී මම වෛද්‍ය පරීක්ෂණයට ලක් වෙලා හිටියේ. ඒ අනුව ගරු සභාපතිතුමනි, එක් අතුරු ප්‍රශ්නයක් ඇසීම සඳහා ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා එකඟ නම් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අහන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමා පිළිතුර සභාගත කරලා තිබෙනවා. *"ඉහත විකල්ප වෙළඳ කුටිය පිහිටා ඇත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමි දුර සීමාව ඇතුළත නම් උක්ත වෙළඳ කුටි නීති විරෝධී බව ඔබතුමා පිළිගන්නේද?"* කියලා. ගරු ප්‍රධාන ඇමැතිතුමා පිළිතුරු දීලා තිබෙනවා, නාගරික සංවර්ධන අධිකාරියේ අනුමත සැලසුම් යටතේ එම අධිකාරිය විසින් ඉදි කරනු ලබන හෙයින් පිළිගන්න බැහැයි කියලා. ගරු සභාපතිතුමනි, එතැනදී ගරු ප්‍රධාන ඇමැතිතුමා කැමැති නම් - මේ පිළිතුර වැරැදියි ගරු ප්‍රධාන ඇමැතිතුමනි. ඔබතුමාට හැකියාවක් තිබෙනවා නම්, ඇත්තටම මේ ස්ථානයට ගිහිල්ලා ස්ථානීය පරීක්ෂාවක් කරන්න. ඔබතුමාට වැටහෙයි. පැහැදිලිවම මේ විකල්ප කඩ කාමර පිහිටා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, දුම්රිය මාර්ගයට අඩි 10 ක සීමාව තුළ. එතකොට පැහැදිලිවම මේ පිළිතුර වැරැදියි. ඒ අනුව ගරු ප්‍රධාන ඇමැතිතුමා කැමැති නම් මේ ස්ථානය බලන්න පුළුවන්. පිටකොටුවේ බැස්ටියන් මාවතට එහා පැත්තේ තිබෙන්නේ. මේ ස්ථානය බලලා තමුන්නාන්සේට හැකියාවක් තිබෙනවා - මේ පිළිතුර අසත්‍යයක්. සත්‍ය පිළිතුර ඔබතුමාට දැක බලා ගන්න පුළුවන්. පැහැදිලිවම ගරු ප්‍රධාන ඇමැතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය කෙටියෙන් කියන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් විකල්ප කඩ කාමර පිහිටා තිබෙන්නේ දුම්රිය මාර්ග රක්ෂිතයේ. ඒ අනුව දුම්රිය මාර්ග රක්ෂිතය බව ඔබතුමා පිළිගන්නවාද කියලා අතුරු ප්‍රශ්නයක් හැටියට මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේකට පිළිතුර පසුව දෙන්නම්. මොකද, මා ළඟ තොරතුරු නැති නිසා. නමුත් UDA Act එක ගැන ඔබතුමා හොඳාකාරව දන්නවා. ඒක ඉතා ප්‍රබල Act එකක්. නමුත් UDA Act එකේ හැටියට සැලසුම් සකස් කිරීමේදී සමහර විට ඒ අමාත්‍යාංශයත් එක්ක

සම්බන්ධ වෙලා කටයුතු කරද්දී අනුමැතිය ලබා දෙන්න කටයුතු කරනවා. ඒ පිළිබඳව තොරතුරු මධ්‍යම රජයෙන් කරන ඒවා. අපි ළඟ නැහැ. ඒ නිසා තොරතුරු ලබා ගත්තාට පස්සේ තමයි තොරතුරුවලට පිළිතුරු ලබා දෙන්න පුළුවන් වෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේකේදී ගරු සභාපතිතුමනි, පුංචි එකතු කිරීමක් කරන්න ලැහැස්තියි. ගරු සභාපතිතුමනි, ඕනෑම දුම්රිය මාර්ගයක දුම්රිය ගමන් ගන්නකොට අඩි 35 ක පරාසයක් දෙපැත්තට තබලා තමයි ඉදි කිරීම් කටයුතු කරන්නේ. එතකොට මෙතැන තිබෙන්නේ අඩි 10 යි. අඩි 25 ක් මේ පැත්තට ඇවිල්ලා. ඒ අනුව ගරු සභාපතිතුමනි, ඔවුන්ගේ ජීවිතවල අනාරක්ෂිතභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. ඔබතුමා පැහැදිලිවම මේ පිළිබඳව කල් ඉල්ලනවා. ඒ අනුව ඊට අදාළ අතුරු ප්‍රශ්නයට නිසි පිළිතුරු ලබා දෙන්න කියලා මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ එතුමා පසුව ඒ ගැන පැහැදිලි කරයි. ඔබතුමාට පැහැදිලි උත්තරයක් පසුව ලබා දෙයි. කළුතර ඥාණෝදය මහ විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ අක්‍රමිකතා සම්බන්ධව අදහස් දැක්වීමට සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමනි, හතරවැනි පළාත් සභාව නියෝජනය කරන්න මට ලබා දීපු ජනවරම අනුව - (බාධා කිරීමක්) මම හතරවැනි පළාත් සභාව නියෝජනය කරන වෙලාවේ මගේ යුතුකමක් තිබෙනවා - පළාත් සභාවට පත් වුණාට පස්සේ මම අද තමයි කථා කරන්නේ. අපේ කළුතර ආසනයේ ජනතාව මාව පළමුවැනි ස්ථානයට ගෙනැල්ලා කළුතර දිස්ත්‍රික්කයේ සියලුම ජනතාව අපට ඡන්දය දීලා ඒ බලාපොරොත්තු ඉෂ්ට කරන්න මාව මේ ස්ථානයට එවපු ඒ ජනතාවට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. අද මට ප්‍රකාශයක් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ අධ්‍යාපනය සම්බන්ධයෙන්. අපි නිතරම අධ්‍යාපනය පිළිබඳව දක්වන උනන්දුව නිසා අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා අපව දැනුවත් කරලා තිබෙන්නේ, නිතරම ස්වාධීනව ඒ පාසල්වල කටයුතු කෙරෙනවාද නැද්ද කියලා සොයා බලන්න. ඒක නිසා තමයි එතුමා ව්‍යුහ කමිටුවක් හදලා සියලුම පක්ෂවල මන්ත්‍රීවරුන් එකතු කරලා කලාප කාර්යාලවල තීන්දු ගනිමින් අපට කටයුතු කරන්න අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා අපි එවැනි සොයා බැලීමේදී ඥාණෝදය මහ විද්‍යාලය ගැන මට අද මේ ප්‍රකාශය කරන්න සිද්ධ වුණේ, ඥාණෝදය මහ විද්‍යාලයේ විදුහල්පතිවරයා කරපු අක්‍රමිකතා, දූෂණ පිළිබඳව අල්ලස් කොමසාරිස්තුමාට 2014.02.08 වැනිදා දෙමව්පියෝ පිරිසක් පෙත්සමක් යවලා තිබෙනවා. දරුවන් ඇතුළත් කර ගැනීමේදී අක්‍රමිකතා සිදු වෙලා කියලා. ඒ පෙත්සම විභාග කරන වෙලාවේදී එම පාසලේම ඉන්න එක ගුරුවරියෙකුගෙන් රුපියල් 50,000 ක මුදලක් අල්ලසක් වශයෙන් විදුහල්පතිවරයා ඉල්ලලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ විමර්ශන ඒකකය ගිහිල්ලා, ඒ පිළිබඳව පැය 2 ½ ක් එතුමියගෙන් ප්‍රශ්න කරලා තිබෙන මොහොතක එම ගුරුවරියව අද වෙනත් පාසලකට මාරු කරලා තිබෙනවා. මේ ගුරුවරිය අතිරික්තයි කියලා හිතාමතාම මේ විදුහල්පතිවරයා වාර්තාවල් දීලා, කලාප අධ්‍යක්ෂවරියව නොමඟ යවලා, අද මේ ගුරුතුමියව මාරු කරලා තිබෙනවා. මේ පිළිබඳව පෙත්සම් කිහිපයක් අපට ලැබිලා තිබෙනවා. ශිෂ්‍යත්ව පන්තිවලට දරුවන් ඇතුළත් කිරීමේදී ඇති වූ අක්‍රමිකතා තිබෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන් මේ විදුහල්පතිවරයා පිළිබඳව සොයලා බලලා ඒ අවශ්‍ය පියවර ගන්නය කියලා.

විශේෂයෙන් අපි දන්නවා, ඒ විදුහල්පතිවරයා එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ විදුහල්පතිවරයෙක්. නමුත් අපි ඒ පත්වීම දෙනකොටත් විරුද්ධ වුණේ නැහැ. මොකද, පාසල් පද්ධතිය සඳහා දේශපාලනය ඇදා නොගැනීමේ වැඩ පිළිවෙළ යටතේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉන්න නිසා. නමුත් අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතියට බැඳිලා දැන් ආරක්ෂා වෙන්න හදනවා. ඒ නිසා අපි මේවාට විරුද්ධයි. ඒක නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳව ඉක්මණින් - ඊළඟ වර්ෂයට දරුවන් ඇතුළත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වනවා. මේවා හරියට නොකෙරුනාම තමයි මන්ත්‍රීවරු හොයාගෙන දෙමව්පියෝ එන්නේ. අවට ඉන්න දරුවන්ට ඉඩක් නැහැ. පිටින් එන දරුවන්ව මුදල්වලට ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් සමහර පාසල්වල තිබෙනවා. ඒක

[ ගරු සුමිත් ලාල් මෙන්ඩිස්]

ප්‍රසිද්ධ රහසක් හැටියටත් තිබෙනවා. ඒක නිසා මේ වැඩ පිළිවෙළ පිළිබඳව මේ පාසලේ යළිත් වතාවක් සම්මුඛ පරීක්ෂණ පවත්වන්න ඉස්සෙල්ලා, මේ පරීක්ෂණය කරලා ඒ පිළිබඳව පියවර ගන්න කියලා මම මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඊට අවශ්‍ය ලිපි ලේඛන අද මම සභාගත කරනවා.[8] බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊශ්‍රායලය, පලස්තීනයට එල්ල කරන ප්‍රහාර සම්බන්ධයෙන් අදහස් දැක්වීමට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා. එතුමා සභා ගර්භයේ නැහැ.

කොළඹ 15, මෝදර, කිඹුලා ඇළ ප්‍රදේශයේ ක්‍රීඩා පිටිය අත්පත් කර ගැනීම පිළිබඳව අදහස් දැක්වීමට මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, කොළඹ 15, මෝදර, කිඹුලා ඇළ ප්‍රදේශයේ නිවාස 1000 කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. පවුල් 3000 කට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙනවා. එම නිවාස යෝජනා ක්‍රමයේ තිබුණු ක්‍රීඩා පිටිය දැනටමත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන තට්ටු නිවාස හදන්න එතැන වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. මම හිතන විධියට 1990, 1991 වර්ෂයේ - ඉඟුරු කඩේ හන්දියේ ඉඳලා ඉබ්බාගේවත්ත දක්වා තිබුණු නිවාස කඩා ඉවත් කර වරාය සංවර්ධන අධිකාරියේ අධිවේගී ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා ඉවත් කෙරුණු ගෙවල් ඒ. ඒ ගෙවල් ටික නැවත ගෙනැල්ලා කිඹුලා ඇළ ප්‍රදේශයේ පදිංචි කරන්නට ඉඩ ලබා දුන්නා. ඒ ලබා දෙනකොට විශාල මඩ වගුරක් ලබා දුන්නේ. මේ නිවාස තනා ගැනීම සඳහා රුපියල් 30,000 ක මුදලක් ඒ කාලේ ලබා දුන්නා. දුගී දුප්පත් අඩු ආදායම්ලාභී ජනතාව බොහොම දුක් මහන්සියෙන් විදේශගත වෙලා මේවා හදාගෙන තියෙන්නේ. එදිනෙදා ජීවත් වීමේ ක්‍රමයකුත් නැතුව, බොහොම අමාරුවෙන් ඒ නිවාස හදාගෙන එක නිවස දෙකට බෙදාගෙන පවුල් දෙක තුන ජීවත් වෙනවා. සමහර අය උඩ තට්ටුව හදාගෙන පවුල් දෙක තුන ජීවත් වෙනවා. මේ අවස්ථාවේදී මේ නිවාස නැවතත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩා ඉවත් කර තට්ටු නිවාස ලබා දෙන්න යෑම මම හිතන්නේ, නැවතත් අගාධයකට ඇද දමනවා වාගේ සිද්ධියක්. ඒවා කඩනවා විතරයි. ඒ නිවාස ආපහු ලබා දෙන්නට ලක්ෂයක්, ලක්ෂ එකහමාරක් ගෙවන්නට සිද්ධ වෙලා තිබෙනවා. එදිනෙදා කන්නට පවා තත්ත්වයක් නැති ජනතාව කොහොමද මේ ලක්ෂ එකහමාරක් දෙකක් ගෙවලා නැවත නිවාසයකට යන්නේ. අපි ඊයේ පෙරේදා දැක්කා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔයගොල්ලන්ගේ ආශ්චර්ය.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

හමුදාවෙන් ඇවිල්ලා මේ නිවාස පරීක්ෂා කරලා ගෙවල් කඩනවා කියලා සංගණනයක් කරනවා. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් යවලා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඉතින් ඕකට විරුද්ධව නේ වෙනමම ඡන්දය ඉල්ලුවේ.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

මේ සිද්ධිය වෙන්නට ඔබතුමන්ලා වග කිව යුතුයි. එම නිසා මේ හමුදාව නිල ඇඳුමෙන් ඇවිල්ලා -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

දැන්ද ඒක ඔබතුමාට තේරුණේ?

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

මේ පරීක්ෂා කිරීම -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මන්ත්‍රීතුමාගේ ගෙදරට ගහනකොට තමයි මන්ත්‍රීතුමාටත් අමාරුව තේරෙන්නේ.

[8] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

නාගරික සංවර්ධන අධිකාරිය විසින් -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඕකට විරුද්ධව ඡන්දය ඉල්ලුවේ. ඔයගොල්ලන් මුක්කු ගහන්නේ.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

ඒ වාගේම -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ පැත්තට මුක්කු ගහගෙන ඇයි ඔහොම කියන්නේ?

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

මේ ක්‍රීඩා පිටිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා මයික්‍රෆෝනය ඕෆ් කරන්න.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

මේ ක්‍රීඩා පිටිය නැවත වතාවක් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැරැදි පැත්තේ ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. එතුමාට කථා කරන්න දෙන්න.

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

මේ ජනතාවගේ පරිහරණය සඳහා ක්‍රීඩා පිටිය නැවත ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ ක්‍රීඩා පිටිය ආසන්නේ තිබෙන උතුරු කොළඹ පාසල්වලට ක්‍රීඩා පිටියක් නැහැ. ඒ වාගේම අගමැති විද්‍යාලය, ශාන්ත අන්තෝනි විද්‍යාලය, ශාන්ත අන්තෝනි දෙමළ විද්‍යාලයේ ළමුන් ක්‍රීඩා කරන්නේ, මේ ක්‍රීඩා පිටියේ. ඒ නිසා මේ ක්‍රීඩා පිටිය නැවත ලබා දෙන්නටත්, නිවාස යෝජනා ක්‍රමය වහාම නවතා, ජනතාව වෙනුවෙන් ඉඩම ලබා දෙන ලෙසත් -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ආණ්ඩුවෙන් අයින් වෙන්න. ලැජ්ජ නැතුව ඉන්නේ ඇයි?

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

ඉල්ලා සිටිනවා. ස්තුතියි. ඕවාට ආණ්ඩුවෙන් අයින් වෙන්න ඕනෑ නැහැ. අපි සටන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ඊශ්‍රායල් හමුදාව විසින් පලස්තීන සිවිල් ජනතාව ඝාතනය කිරීමට විරුද්ධව අදහස් දැක්වීමට අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලංකාවේ අය ගැන කථා කරන්න.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි. අපි ලංකාව ගැනත් කථා කරනවා. පිටරට සිටින අපේ මුස්ලිම් රටවල් වෙනුවෙනුත් කථා කරනවා. ඒ වාගේම බොහොම ස්තුතියි ගරු සභාපතිතුමනි. අද වනතුරු ඊශ්‍රායල් හමුදාව විසින් පලස්තීන සිවිල් ජනතාව, කුඩා දරුවන් පවා ඝාතනය කිරීමේ මේ ක්‍රියාව දිගටම ගෙන යන ක්‍රියාවක් බවට පත් වෙලා තිබෙනවා. මුළු ලෝකයම මේකට අනුකම්පා කරමින්, මේ ඊශ්‍රායල් හමුදාවට එරෙහිව මුළු ලෝකයේම රටවල් කථා කරමින් සිටින වකවානුවකදී අපි ශ්‍රී ලාංකිකයන් වශයෙන් පලස්තීනයේ ජනතාවත් එක්ක අපට තිබෙන බැඳීමක් වශයෙන් ඊශ්‍රායල් හමුදා විසින් මේ ඝාතනයන් කිරීම පිළිබඳව රජයක් වශයෙන් මේකට විරුද්ධත්වය පළ කරනවා. ඒ වාගේ මේ රටේ ඊශ්‍රායල්

[ ගරු අර්ෂාද් නිසාම්ඩීන්]

සෙන්ටර්ස් දෙකක් තිබෙනවා. ඒ සෙන්ටර්ස් දෙකත් වසා දමලා ඊශ්‍රායලය මේ රටෙන් පිටමන් කරන ලෙසට තමයි මම ඉල්ලීමක් කරන්නේ. අද -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔයගොල්ලන්ගෙ නේ ආණ්ඩුව. අපේද?

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

අපේ විතරක් නොවෙයි. ඔයගොල්ලන්ගේ ආණ්ඩුවත් ඕක තමයි කළේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපේ ආණ්ඩුවක් නැහැ නේ? ඔයගොල්ලන්ගෙ නේ ආණ්ඩුව. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා පලස්තීන සහයෝගීතා කමිටුවේ සභාපති ලෙස හිටියා නේ? ඉතින් කියන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මයික්‍රෆෝනය පාවිච්චි කරලා ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. එතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙන්නේ. කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

අපි බාධා කරන්න යන්නෙත් නැහැ. මේ අයටත් පොඩ්ඩක් උගන්වන්න අනෙක් කට්ටිය කථා කරනකොට බාධා කිරීම් කරන්න එපැයි කියලා. මේ කට්ටිය පාර්ලිමේන්තුවේ කථා කරනවා. ඊශ්‍රායල් හමුදාවට විරුද්ධව පිකටිං කරනවා. නමුත් මෙතැන කථා කරනකොට අපට විරුද්ධව කෑගහනවා. පුදුමාකාර එක්සත් ජාතික පක්ෂයක් නේ මේක. මෙතුමාට තිබෙන්නේ කථා කිරීම පමණයි. කිසිම ක්‍රියා මාර්ගයක් නැහැ. ඔහේ කෑගහන එක පමණයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා ඊශ්‍රායල් හමුදාව විසින් අමානුෂික ලෙස සිවිල් ජනතාව ඝාතනය කිරීමට අපි විරුද්ධ විය යුතුයි. රජයක් වශයෙන් මෙයට විරුද්ධත්වය ප්‍රකාශ කරලා මුළු ලෝකයටම අපි පණිවිඩයක් වශයෙන් මෙය දිය යුතුයි කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, බත්තරමුල්ල සහ කඩුවෙල සමූපකාර සමිතිවල පසුගිය දිනවල ඇති වෙලා තිබුණු තත්ත්වයන් පිළිබඳව ප්‍රකාශයක් කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. විශේෂයෙන්ම අපි කාලයක් තිස්සේ ඉඳලා සමූපකාර ව්‍යාපාරයට සම්බන්ධ වෙලා කටයුතු කරපු අය විදියට මේ සමූපකාරය සාංඝික දේපල විදියට සලකලා මේ සමූපකාරය රැක ගන්න කාලයක් තිස්සේ අපි කටයුතු කළා. ඒ නිසාම පසුගිය කාලයේ කඩුවෙල ආසනයේ තිබුණු සමූපකාර දෙකේ කටයුතු පිළිබඳව අපි විමසිල්ලෙන් බලා සිටියා ගරු සභාපතිතුමනි. පසුගිය කාල පරිච්ඡේදය තුළ විශේෂයෙන්ම බත්තරමුල්ල සමූපකාර සමිතියේ ලක්ෂ 600 ක විතර දූෂණයක් සිද්ධ වෙලා, අක්‍රමිකතාවක් සිද්ධ වුණු බව අපට දැනගන්න ලැබුණා. සාමාන්‍ය ජනතාව තැන්පත් කරන ලක්ෂ 600 කට ආසන්න මුදල් ප්‍රමාණයක් බත්තරමුල්ල සමූපකාර සමිතියේ පාරිභෝගික අංශය සඳහා ලබාගෙන ඒ අරමුදල් වෙනත් කටයුතු සඳහා යොදලා දැන් සමූපකාර ග්‍රාමීය බැංකු අංශයේ මහජනතාවට නැවත ලබා දීමට හැකියාව නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ජනතාවගේ පැත්තෙන් ගත්තාම බරපතළ හානියක්. ඒ වාගේම අපේ පැත්තෙන් වගකීමක් තිබෙනවා. මම ස්තුතිවන්ත වෙනවා, වර්තමාන සමූපකාර අමාත්‍ය නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔන්න කඩේ යනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමා ආවාට පස්සේ තමයි මේ තත්ත්වය යම් ප්‍රමාණයකට වෙනස් වුණේ. එතුමා නාවා නම්

හිටපු අධ්‍යක්ෂ මණ්ඩලයට මේ කාරණාව තවමත් දිගටම කරගෙන යන්න තිබුණා. නමුත් එතුමා ආපු ගමන් මේ අඩුපාඩුව දැකලා අද ඒ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කරලා සමූපකාර දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් දාලා තිබෙනවා. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත් එතැනින් මෙය සමථයකට පත් වීමක් හෝ ඒ ජනතාවට සෙතක් වෙන්නේ නැහැ. මේ සමූපකාර ව්‍යාපාරයේ අරමුදල් කෝටි හයකට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධයෙන් යම් දූෂණයක්, වංචාවක් වෙලා තිබෙනවා නම්, ඒ අරමුදල්වලට වුණු දේ සහ ඒ අරමුදල් භාවිතා කරපු - දැනට චෝදනාවට ලක් වෙලා තිබෙනවා කියලා දැන ගන්න තිබෙන්නේ සභාපතිවරයා විතරයි. නමුත් අපි හිතනවා, සාමූහිකව ඒ අධ්‍යක්ෂ මණ්ඩලයත් කටයුතු කළා. ඒ වාගේම මේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම සඳහා කඩුවෙල මහ නගර සභාවේ නගරාධිපතිතුමා ඇතුළු කණ්ඩායම බරපතළ විධියට මැදිහත් වුණා. එතුමන්ලාගේ ආශිර්වාදය ඇතුවයි මේ කණ්ඩායම ක්‍රියාත්මක වුණේ. ඒත් එක්කම මම මීට අවුරුදු 1 ½ කට කලින් මේ සභාවේ ප්‍රශ්නයක් ඇහුවා, මේ සමූපකාරය යන්නේ කොහේද කියලා. මම කනගාටු වෙනවා. ඇමැතිතුමා ඒ වෙලාවේ යන්නේ කොහේදෝ මල්ලේ පොල් උත්තරයක් මට දුන්නේ. ඒ වෙලාවේ කිව්වේ අඩුපාඩුවක් නැහැ, වරදක් නැහැ, හොඳින් යනවා කියලා. හැබැයි, එදාවත් බැලුවා නම් ගරු සභාපතුමනි, මේ අඩුපාඩු එදා නිවැරැදි කර ගන්න තිබුණා. හැබැයි අද ජනතාවගේ සල්ලි ලක්ෂ 600 ක් විතර ලොකු හානියකට ලක් වෙලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා තවමත් මල්ලේ පොල්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ නිසා මේකට සමූපකාර දෙපාර්තමේන්තුවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

වර්තමාන ගරු ඇමැතිතුමනි, සමූකාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරු ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීනුත් වගකියන්න ඕනෑ. ඒ වාගේම මෙයට අනුබල දීපු සියලු දෙනා වග කියන්න ඕනෑ. ඒ නිසා ඒ පිළිබඳව කටයුතු කරන්න. ඒත් එක්කම විශේෂයෙන් මේ වනකොට කඩුවෙල සමූපකාර සමිතියේත් අවමංගල්‍ය ශාලාවකට කියලා ලක්ෂ 100 ක් අරගෙන කටයුතු කරලා තිබෙනවා. ඊට පස්සේ ඒක පෞද්ගලික -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පෞද්ගලික අංශයට බදු දීලා තිබෙනවා. ඒ තුළ සමූපකාරයේ මිනිසුන්ගේ සල්ලි අවභාවිතාවක් සිදු වෙනවා. ඒ නිසා කඩුවෙල සමූපකාරය සම්බන්ධවත් පරීක්ෂණයක් කරලා ජනතාවගේ අරමුදල් රැක දීලා ඔවුන්ගේ අයිතිය රකින්න කටයුතු කරන්න කියලා මම බොහොම වගකීමෙන් යුතුව ඉල්ලා සිටිනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, මම සභාවේ නොසිටියේ වෛද්‍ය පරීක්ෂණයට සම්බන්ධ වුණු නිසා. මගේ පෞද්ගලික පැහැදිලි කිරීම යටතේ කරන්න තිබුණු ප්‍රකාශයට වෙලාව ලබා දීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාගේ නම ප්‍රකාශ කළා. ඔබතුමා සභාවේ හිටියේ නැහැ. කාලය තිබුණොත් ඔබතුමාට අවස්ථාව ලබා දෙන්න බලන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ පාසල් 1270 කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාතේ පාසල් යන වයසේ සියලුම දරු දැරියන්ට අධ්‍යාපනය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම, ඒ සඳහා අවශ්‍ය ගුරු භවතුන්, පාසල් ලබා දීමේ වගකීම තිබෙන්නේ මේ පළාත් සභාවට. කෙසේ නමුත් බස්නාහිර පළාතේ විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ සමහර ස්ථානවල

[ ගරු එස්.එම්. මරික්කාර්]

පළමුවැනි වසරට දරුවන් ඇතුළත් කර ගැනීමේදී, සමහර දරුවන්ට ඒ පාසල්වලට යෑමට ඉඩ අවකාශ ලැබෙන්නේ නැති තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම කොලොන්නාව මැතිවරණ කොට්ඨාශය ගත්තාම, කොලොන්නාව මැතිවරණ කොට්ඨාශයේ ජනගහනයෙන් 20% කට ආසන්න ප්‍රමාණයක් දෙමළ මාධ්‍ය කථා කරන ජනතාව. හැබැයි, මේ මොහොත වනවිටත් කොලොන්නාව මැතිවරණ කොට්ඨාශය සඳහා දෙමළ මාධ්‍ය පාසලක් ලබා දීම සඳහා මෙම පළාත් සභාව අපොහොසත් වෙලා තිබෙනවා. මේ නිසාම ගැටළුකාරී තත්ත්වයන් කිහිපයක් මතු වෙලා තිබෙනවා. පළමුවැනි ගැටළුව තමයි සමහර දෙමව්පියන්ට තමන්ගේ දරුවන්ව කොළඹ ප්‍රදේශයේ පාසල්වලට දාන්න සිද්ධ වෙලා තිබෙනවා. දිනපතා ප්‍රවාහන පහසුකම්වල සිට එය දරා ගන්න බැරි ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. ඊළඟට තවත් පිරිසක් ඉන්නවා. ඒ පිරිසට කොලොන්නාව ප්‍රදේශයේ පාසල් ලැබෙන්නේ නැහැ. තුන්වැනි පිරිස යම් ප්‍රමාණයකට දෙමළ කථා කරන දරුවන් වෙනුවෙන් සිංහල පාසල්වලට ඇතුළත්වීමේ හැකියාව ලැබිලා තිබුණත් ඔවුන්ට සිංහල මාධ්‍ය පාසලකට පැමිණීම නිසාම ඔවුන්ගේ ඉස්ලාම් ආගම හෝ හින්දු ආගම සම්බන්ධ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය ගුරු භවතුන් ලබා දීමට මේ වනකොටත් කටයුතු සිද්ධ වෙලා නැහැ. ඒ නිසාම මම හිතන්නේ ඒක ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් වෙනවා. දෙමළ භාෂාව ප්‍රධාන භාෂාව බවට පත් කර ගත්තු සිංහල මාධ්‍යයට යන ශිෂ්‍යයන්ට ඉස්ලාම් ආගම හෝ හින්දු ආගම ඉගෙන ගන්නට අවකාශ ලැබිලා නැත්නම් ඒ සඳහා අවකාශ ලබා දීම පළාත් සභාවේ වගකීමක්. ඊළඟට සමහර දරුවන්ට පළමුවැනි වසර සඳහා කොලොන්නාව ප්‍රදේශයේ පාසල් නොලැබීම නිසා දෙමව්පියන් ඔවුන්ව International School වලට දාලා ඒක දරා ගන්න බැරි නිසා මේ වනකොටත් හතර වසර පහ වසර පසු කරපු ශිෂ්‍ය ශිෂ්‍යයාවන් විශාල ප්‍රමාණයක් පාසල් නොමැතිව, පාසල් යන්නේ නැතුව කොලොන්නාව ප්‍රදේශයේ පදිංචි වෙලා ඉන්නවා.

ඒ නිසා මම මේ සභාවේ අවධානය යොමු කරනවා, මේ දරුවන් සඳහා පාසල් ලබා දීමටත්, ඒත් එක්කම දෙමළ මාධ්‍ය භාවිතා කරන 20% කට ආසන්න ජනගහනය සඳහා පාසලක් ලබා දීමේ වගකීම තිබෙන්නේ, ඒ ප්‍රදේශයේ ප්‍රජාව නියෝජනය කරන ව්‍යාපාරිකයන්ට නොවෙයි. පළාත් සභාවට. ඒ සඳහා ඉඩම් සොයා ගැනීම හෝ ඉඩම් අත්පත් කර ගැනීම හෝ ගොඩනැගිලි ස්ථාපිත කිරීම හෝ ගුරු භවතුන් ලබා දීමේ හෝ වගකීම ඒ ප්‍රදේශයේ පූජක ස්ථානවලට හෝ එහෙම නැත්නම් ආගමික ස්ථානවලට හෝ ව්‍යාපාරිකයන්ට හෝ අයිති කාර්යයක් නොවෙයි. ඒත් එක්කම මේ හරහා විශාල අවධානමක් තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා. අද අපේ ලංකාවේ සමාජය උදේට අපේ හාමුදුරුවනෝ කියලා දවල් වනකොට කුඩු ව්‍යාප්ත වන සමාජයක් තිබෙන්නේ. ඒ නිසා කොලොන්නාව ප්‍රදේශයේ පාසල් නොයන දරුවන් මත්කුඩු මාරයා ගිල ගැනීමේ අවධානමකින් පසු වන වග ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ නිසා මේ දරුවන් සඳහා පාසල් ලබා දීමත්, සිංහල මාධ්‍ය පාසල්වල ඉගෙන ගන්නා දෙමළ මාධ්‍ය දරුවන් සඳහා ආගමික ගුරුවරුන් ලබා දීමත්, ඒත් එක්කම මේ දරුවන් පාසල් නොයෑම නිසා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ අවධානමෙන් ඔවුන්ව මුදවා ගැනීම සඳහාත් මේ පළාත් සභාවේ අවධානය යොමු කර ඒ සඳහා කටයුතු කිරීමට අදාළ පියවර ගන්නා ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ඔබතුමාට බොහොමත්ම ස්තුතියි. විශේෂයෙන්ම අද අපි දන්නවා මුළු ලෝක ප්‍රජාව ඊශ්‍රාලය විසින් පලස්තීනයේ ගාසා තීරයට එල්ල කරන විශාල මර්දනය සහ අමානුෂික ප්‍රහාර හරහා අද වනකොට පලස්තීනුවන් දාහකට අධික ප්‍රමාණයක් මිය ගිහිල්ලා තිබෙනවා. ඊයේ පෙරේදා වනකොට අපි දැක්කා විශේෂයෙන්ම පාසල්වලට, ඒ වාගේම රෝහල්වලට මේ ප්‍රහාර එල්ල කරලා තිබෙනවා. ඊශ්‍රාලය අද තමන්ට හිතුමතේ කිසිම ජාත්‍යන්තර නීතියක් පිළිගන්නේ නැතුව, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කිසිම නීතිරීති පිළිගන්නේ නැතුව අද අමු අමුවේ ලෝක ජාත්‍යන්තර නීති සියලු දේවල් උල්ලංඝණය කරමින් ඉතා අමානුෂික ලෙස පලස්තීනුවන්ට විරුද්ධව මේ කරගෙන යන මර්දනය අපි දැඩි සේ හෙළා දකිනවා. අද අපි දන්නවා මුළු ලෝකයේම ජනතාව -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

කවුද කරන්නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඊශ්‍රාලය.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඊශ්‍රාලයට උදව් කරන්නේ කවුද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මම ඒකත් කියන්නම්. මම කථාව ඉවර කරනකොට ඔබතුමාට පැහැදිලි වෙයි ඊශ්‍රාලයට උදව් කරන්නේ කවුද කියලා. එතකොට මුළු ලෝකයේම ජනතාව අද ඊශ්‍රාලයට විරුද්ධව වීදි බැහැලා පලස්තීනයට සහයෝගය දක්වනවා. ඒ පලස්තීන ජනතාවගේ විමුක්ති අරගලය වෙනුවෙන් අද ජනතාව පාරට ඇවිල්ලා තිබෙනවා. අපි ශ්‍රී ලාංකිකයන් හැටියට අපේ ලංකාවේ ජනතාවත් හැමදාම පලස්තීන අරගලයත් එක්ක ඉඳලා තිබෙනවා. පලස්තීන අරගලයට අපි සහයෝගය දීලා තිබෙනවා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මම කියන්න ඕනෑ අපේ වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පලස්තීන සහයෝගීතා කමිටුවේ සභාපති හැටියට එතුමා කාලයක් වැඩ කරලා තිබෙනවා. නමුත් එක දෙයක් කියන්න ඕනෑ. අද වනකල් විදේශ අමාත්‍යාංශයට බැරි වුණා, පලස්තීනයට මේ එල්ල කරන ප්‍රහාරයට විරුද්ධව ප්‍රකාශයක් කරන්න. ශ්‍රී ලංකා රජය හැටියට මේ ප්‍රහාර හෙළා දකින්න තවම මේ ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. නමුත් ජනාධිපතිතුමා ඇවිල්ලා පලස්තීන සහයෝගීතා ව්‍යාපාරයේ සභාපතිතුමා. නමුත් එතුමා සභාපති වෙලා හිටපු ව්‍යාපාරය සම්බන්ධයෙන් - අද මේ රටේ වත්මන් රාජ්‍ය නායකයාට විදේශ අමාත්‍යාංශයට අද වනකොට තවමත් බැරි වෙලා තිබෙනවා, පලස්තීනයට එල්ල කරන ප්‍රහාර හෙළා දකින්න. ඇයි ඒ?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අමු බොරු කියන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හෙළා දකින්න බැරි වෙලා නැහැ. හෙළා දැක්කේ නැහැ. තව වනකල් හෙළා දැක්කේ නැහැ. ජනාධිපතිතුමා ටෙලිෆෝන් එකෙන් කථා කරලා පලස්තීනයේ අගමැතිතුමාගෙන් සුවදුක් විමසලා තිබෙනවා. එච්චරයි කරලා තිබෙන්නේ. හෙළා දැක්කේ නැහැ. ඇයි ඒක හෙළා දකින්න බැරි වුණේ? හෙළා දකින්න බැරි වුණේ ජනාධිපතිතුමාගේ සහෝදරයා, ආරක්ෂක ලේකම්තුමාගේ ගණුදෙනු ඔක්කෝම ඊශ්‍රාලයත් එක්ක තිබෙනවා. අද ඊශ්‍රායලයේ සෙන්ටර්ස් දාලා තිබෙනවා. ඊශ්‍රායලය (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බොරු කියන්න එපා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඊශ්‍රාලයත් එක්ක මේ ආණ්ඩුව සම්බන්ධකම් පවත්වාගෙන යනවා. ඒ නිසාම තමයි පලස්තීනයට විරුද්ධව එල්ල කරන ප්‍රහාර අද මේ ආණ්ඩුවට හෙළා දකින්න බැරි වෙලා තිබෙන්නේ. එක පැත්තකින් ආණ්ඩුව ඊශ්‍රාලයත් එක්ක ගණුදෙනු කරනවා. ආරක්ෂක ලේකම්තුමා සියලු ගණුදෙනු කරනවා. ඊශ්‍රාලයත් එක්ක වෙළඳ ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. අද ඊශ්‍රාලයට ගෘහ සේවිකාවන් යවනවා. අද පලස්තීනයේ සහයෝගීතා ව්‍යාපාරයේ සභාපති ජනාධිපතිතුමා. එතුමා එක පැත්තකින් පලස්තීනය ගැන කථා කරන ගමන් -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඊශ්‍රාලයට උදව් කරන ඇමරිකාව ගැන කථා කරන්නේ නැද්ද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අනෙක් පැත්තෙන් එතුමාගේ සහෝදරයා -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමන්ලා නේ ගණුදෙනු කරන්නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අහගන්න මහ ඇමැතිතුමා. සහෝදරයා ඇවිල්ලා අද ඊශ්‍රාලය එක්ක ගණුදෙනු කරගෙන ඉන්නවා. ඒ නිසා

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්]

ඊශ්‍රාලය එක්ක ගණුදෙනු කරන නිසා අද පලස්තීනය වෙනුවෙන් කථා කරන්න බැරි වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ඒ නිසා ආණ්ඩුවේ මේ දෙබිඩි විදේශ ප්‍රතිපත්තිය අපි දැඩි සේ හෙළා දකිනවා. මොකද, ජනාධිපතිතුමා එක පැත්තකින් පලස්තීනයේ සහයෝගී ව්‍යාපාරයේ සභාපතිවරයා හැටියට ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාගේ ප්‍රකාශය ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නෙවෙයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමාට පුංචි කාලයක් තිබෙන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඊශ්‍රාලයත් එක්ක ගණුදෙනු කරගෙන ඊශ්‍රාලයට කරන්න පුළුවන් සියලු සහයෝගය අද එතුමා කරනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මගේ මේ කරුණු පැහැදිලි කිරීම ආණ්ඩු පක්ෂයට වාගේම විපක්ෂයටත් ඉතාමත් වැදගත්. මම මේ ප්‍රකාශ කරන්න යන්නේ රජයේ පොදු දේපළක් අන්සතු කිරීමකට අර ඇදීමක් නිසා ඒ පිළිබඳව පෙර සූදානමක් වන ලෙස විෂයය භාර අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටීමටයි. ගරු සභාපතිතුමනි, අතුරුගිරිය බස් නැවතුම් පළ ස්ථාපනය වුණේ මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා. අවුරුදු 50 කට ආසන්න කාලයක් වෙනවා. එවකට කොට්ටාව ආසනයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු අමාත්‍යවරයෙක් වන එම්.ඩී.එච්. ජයවර්ධන මැතිතුමාගේ මැදිහත්වීම තුළත්, ඉන් අනතුරුව කොට්ටාව ආසනයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී චන්ද්‍රා ගුණසේකර මැතිතුමාගේ පූර්ණ මැදිහත්වීම තුළත් අතුරුගිරිය මංසන්දියේ තිබෙන භූමි භාගය පොදු බස් නැවතුම් පොළ සඳහා වෙන් කර ගත්තා. ඉන් අනතුරුව පළාත් සභාව පිහිටෙව්වාට පස්සේ, ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් දේපළ හැටියට ඒවා අනිවාර්යයෙන්ම, නියත වශයෙන්ම ඒවා පළාත් සභාවේ දේපළ හැටියට පරිවර්තනය වුණා. දැන් පළාත් සභාවේ දේපළක් හැටියට තමයි මේ අතුරුගිරියේ බස් නැවතුම් පොළ තියෙන්න ඕනෑ. නමුත් මේ බස් නැවතුම් පොළ පරිහරණය කිරීමේදී, පෞද්ගලික අයගෙන් අවසර පත්‍රයක් ගන්න ඕනෑ ඒක පරිහරණය කරන්න. මේකේදී මම දකිනවා මාර්ගස්ථ මගී අධිකාරියත් ඇල් මැරුණු ස්වභාවයක් තමයි ගරු සභාපතිතුමනි දක්වන්නේ. මේ භූමි භාගයට එක වකවානුවක මාර්ගස්ථ මගී අධිකාරියේ හිටපු සභාපතිවරයෙක් ඒ ඉඩම් වලට අයිතියි කියන අයත් එක්ක තිබුණු පෞද්ගලික ඇහැලුම්කමක් තුළ රුපියල් 5000 ක් මුදලක් මාසිකව ගෙව්වා. ඒ මාසිකව ගෙවන්න හේතු වුණේ, මාර්ගස්ථ මගී අධිකාරියට මේක අයිති නැහැ, මේක පෞද්ගලික කෙනෙකුට අයිතියි කියන ස්ථාවරය ඇති කරන්න. දැනුත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයිති මේ භූමි භාගයෙන් නිසි අවසරයක් ගන්නේ නැතුව පෞද්ගලික කෙනෙක් තමයි ඒකේ අවසරය ගන්න ලියුම් කියුම් නිකුත් කරන්නේ. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රවාහන අමාත්‍ය නිමල් ලාන්සා මැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට මේ සම්බන්ධව මැදිහත් වෙන්න කියන්න. මේ සඳහා විශාල වශයෙන් කුමන්ත්‍රණයක් යෙදෙනවා. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ අය ළඟට ගිහිල්ලා මේ ඉඩම්වලට අයිතියි කියන අය මේ පළාත් සභාව හරහා යළිත් වරක් මේක පරිවර්තනය කරන්න හදනවා ඔවුන්ගේ පෞද්ගලික දේපළක් හැටියට. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් නිමල් ලාන්සා ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමා මේකට පෞද්ගලිකව මැදිහත් වෙන්න. මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ නිලධාරීන්ට කියන්න මේ භූමි භාගය කවුරු හරි ප්‍රයෝජනයට ගන්නවා නම් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ නිසි අවසරය ලැබෙන්න ඕනෑ. එහෙම නොවුණොත් මේක මහා ව්‍යසනයක් බවට පත් වෙනවා.

ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි. මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියෙන් ලක්ෂ 20 ක් - බස්රථ හිමියන්ගේ ඉල්ලීම පරිදි බ්ලොක් ගල් අල්ලන්න - මේවාවලට අපි

කියන්නේ Inter log ගල් කියලා. මේ ගල් අල්ලන්න ලක්ෂ 20 ක් වෙන් කළා. මේ Inter log ගල් අල්ලන්න ගියාම, කුට්ටි ගල් අල්ලන්න ගියාම අයිතියි කියන අය, නිසියාකාර අයිතියක් නැති අනියම් ලෙස අයිතියි කියන අය ඒකට ඉඩ දුන්නේ නැහැ. මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ නිලධාරීන් පසු බැස්සා. මම හිතන්නේ, මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ අය පසු බැස්සේ උවමනාවෙන්. ඒ නිසා ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේකේ අයිතිය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට තිබෙන්නේ. ප්‍රවාහන අමාත්‍යාංශය හැටියට මේකට මැදිහත් වෙලා ජනතාවගේ දේපළක් හැටියට මේකේ නීත්‍යානුකූල භාවය රැකගන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, ඊශ්‍රාලය හා පලස්තීනයේ හමාස් සංවිධානය අතර ඇති වී තිබෙන බිහිසුණු සටන පිළිබඳව මේ වනවිට මුළු ලෝකයේම අවධානයට යොමු වී තිබෙනවා. ඊශ්‍රාලය විසින් සිත්පිත් නැති ආකාරයෙන් පලස්තීනයේ අහිංසක කුඩා දරුවන් ඇතුළු ජීවිත සිය ගණන් ඝාතනය කරමින් තිබෙනවා. පාසල් සහ රෝහල්වලට, එමෙන්ම විදුලිය සපයන බලාගාරවලට ප්‍රහාර එල්ල කරමින් තිබෙනවා. මේ වනවිට මෙම ගැටුම් නිසා මියගොස් සිටින සිවිල් වැසියන් ගණන 1800 කට ආසන්නයි. ඒ අතරින් 900 කට ආසන්න පිරිසක් පලස්තීනුවන් වන අතර, කුඩා දරුවන් 250 කට කිට්ටු සංඛ්‍යාවක් ඊශ්‍රායල ප්‍රහාරවලින් මියගොස් තිබෙනවා. ජාත්‍යන්තර මානුෂික නීතිය, යුද නීතිය උල්ලංඝණය කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධාන කරන ඉල්ලීම් පවා නොසලකා හරිමින් දෙපාර්ශවයම ප්‍රහාර එල්ල කරනවා. මෙහිදී ඊශ්‍රාලය වාගේම පලස්තීනයේ හමාස් සංවිධානයත්, ඊශ්‍රාලයේ හා පලස්තීනයේ සිවිල් ජීවිත හා දේපළ නොසලකා හරිමින් ප්‍රහාර එල්ල කරනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් බැන් කී මූන් කරන ඉල්ලීම් ඊශ්‍රාලය ඒ වාගේම හමාස් සංවිධානය තුට්ටුවකට මායිම් කරන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, ඊශ්‍රායල - පලස්තීන මෙම ගැටුම පිළිබඳව මුළු ලෝකයම කම්පනයට පත්ව තුෂ්නීම්භූතව බලා සිටිනවා. අමු අමුවේ මානව හිමිකම් උල්ලංඝණය කරමින් ඊශ්‍රාලය හා හමාස් සංවිධානය කරගෙන යන යුද අපරාධ පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව කොමසාරිස්තුමිය අද නිහඬයි. කටක් අරින්නේ නැහැ. ගැටුම් නතර කරලීම සඳහා සටන් විරාම යෝජනා කරන්නේ නැහැ. විශේෂ නියෝජිතයන් පත් කරන්නේ නැහැ. ගාසා තීරයේ සිදු වන යුද අපරාධ පිළිබඳ සොයා බලන්න විමර්ශන කමිටු නැහැ. ඉස්ලාම් භක්තිකයන්ගේ වැදගත් දිනයක් වන රාමසාන් දිනයේදීවත් සටන් විරාමයක් ඇති කර ගන්න බැරි වුණා.

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉල්ලීම් ඊශ්‍රාලය තුට්ටුවකට මායිම් කරන්නේ නැහැ. ඇමැරිකාව දිගින් දිගටම ඊශ්‍රාලය ආරක්ෂා කරන පිළිවෙතක් අනුගමනය කරන නිසයි ඊශ්‍රාලය ඒ ආකාරයට හැසිරෙන්නේ. මානව හිමිකම් කොමසාරිස් නවනීදන් පිල්ලේගේ ප්‍රතිපත්තියේ ඇති දෙබඩි බව මෙයින් මනාව පැහැදිලි වෙනවා. ගාසා තීරයේ දේවස්ථාන, පාසල්, රෝහල්, විදුලිබල මධ්‍යස්ථාන, ඊශ්‍රායල බෝම්බ ප්‍රහාරවලින් සුණුවිසුණු වී යනවා. එළිපිට සිදු කරන තිරස්චීන යුද අපරාධ පිළිබඳව සොයා බලනවා වෙනුවට මානව හිමිකම් කොමසාරිස් නවනීදන් පිල්ලේගේත් ඇමැරිකාවේත් අවධානය යොමු කරලා තියෙන්නේත් ශ්‍රී ලංකාවේ සිදු වුණා යැයි කියන යුද අපරාධ විමර්ශනය කරන්න. ඇමැරිකා එක්සත් ජනපදයේත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේත් දෙබිඩි ප්‍රතිපත්තියත්, මානව හිමිකම් පිළිබඳ ව්‍යාජ භාවයත්, නිරුවත් කරන අවස්ථාවක් මේක.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ වෙල්ලමුල්ල වෛයික්කාල් හී ෂෙල් ප්‍රහාර ගැන සොයන්න ශ්‍රී ලංකාවේ ඇමැරිකානු තානාපතිනී මිෂෙල් මහත්මියත් ඇමැරිකානු යුද අපරාධ විමර්ශනය කරන ඇමැරිකානු තානාපති ස්ටීවන් රැප් මහතාත්, මානව හිමිකම් කොමසාරිස් නවනීදන් පිල්ලේ මහත්මියත් අද කටයුතු කරමින් තිබෙනවා. එතුමියගෙන් අපට අහන්න තිබෙන්නේ මේකද යුක්තිය ධර්මය සාධාරණය කියලා. ඒ වාගේම තමයි ප්‍රතිපත්තියක් නැති ඇමැරිකාවේ රූකඩයක් බවට පත්ව ඇති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මේ ක්‍රියා කලාපය හෙළිදරව් කරන, දැනුවත් කරන, ව්‍යාපාර රට අභ්‍යන්තරයේ මෙන්ම බාහිරයේද රට රටවල් අතරද අප සිදු කළ යුතුය. මෙරට ඇමැරිකානු තානාපති මිෂෙල් ගේ සීසන් කොළඹ තානාපති ධූරයට සමු දී නිව්යෝර්ක් නුවරට යන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජ්‍ය තානාපතිනිය ලෙස වැඩ භාර ගැනීමටයි. ඇයගේ ඒකායන අරමුණ ශ්‍රී ලංකාව යුධ අපරාධ උගුලේ සිර කිරීමයි. ඇයගේ මෙම පත්වීම ශ්‍රී ලංකාවට සුභ වන්නේ නැහැ. ඒ බව අප අවබෝධ කර ගත යුතුය. ගරු සභාපතිතුමනි, ප්‍රභාකරන් නන්දිකඩාල් කළපුවේදී මිය ගියේ 2009 මැයි 19 වෙනිදාය. මැයි 23 වෙනිදා

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

බැන් කී මූන් මහලේකම්වරයා ලංකාවට පැමිණියා. එහෙත් ගාසා තීරයේ සිය ගණන් පලස්තීන් වැසියන් මිය යද්දී ඔහු හුදෙක් ප්‍රකාශ පමණක් නිකුත් කරමින් ඇත. ඊශ්‍රායලයේ යුද ප්‍රහාර ඇමැරිකාව සාධාරණීකරණය කරද්දී ලොව පුරා සාමය අගයන ජනතාව පලස්තීනයේ සිදුවන ජන ඝාතනවලට විරෝධය පළ කරමින් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඊශ්‍රායලයේ සිදු කරන මේ අපරාධය අසාධාරණය අප කිසිසේත් අනුමත කරන්නේ නැහැ. ශ්‍රී ලංකාවේ ජනතාව සැමවිටම පලස්තීන ජනතාවට මිත්‍රත්වයන් සහයෝගීතාවයන් පළ කළ රටක්. එහෙත් ඊශ්‍රායලය රාජ්‍ය විනාශ කර ලෝක සිතියමෙන් මකා දැමීමේ මුස්ලිම් අන්තවාදීන්ගේ මූලධර්මවාදීන්ගේ සටන්කාමීන්ගේ ත්‍රස්තවාදී ක්‍රියාවන් අප අනුමත කරන්නේ නැහැ. ඊශ්‍රායලය කරන යුද අපරාධ මෙන්ම හමාස් සටන්කාමීන් කරන අපරාධද අප එකවිට හෙළා දැකිය යුතුය. ඊශ්‍රායලය තමන්ගේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග මුළුමනින් බැහැර කිරීමටද බැරි බව අප මතක තබා ගත යුතුයි. ඊශ්‍රායලයේ ආක්‍රමණික ප්‍රහාරවලට වාගේම හමාස් ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරවලට එරෙහි විය යුතුය. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව සහ ඔවුන් නියෝජනය කරන සංවිධාන රාමසාන් දිනයේදී පලස්තීනයේ ජන ඝාතනවලට එරෙහිව විරෝධය පළ කර වීදි බැස්සා. තමන්ගේ සහෝදර ජනතාව වෙනුවෙන් පාරට එන එක හොඳයි. මුස්ලිම් අයිතීන් සුරකින්න වීදි බහින හර්තාල් කරන සංවිධානවලින් මුස්ලිම් නායකයින්ගෙන් අහන්න තිබෙන ප්‍රශ්නය තමයි, පලස්තීනය ගාසා තීරයට පහර දෙන කොට පාරට බහින අය ඇයි නයිජීරියාවේ බෝකෝ හරාම් ඉස්ලාමී ආගමික ත්‍රස්තවාදීන් පාසල් දැරියන් 200 ක් පැහැරගෙන ගිය අවස්ථාවේදී විරෝධය පාන්න පාරට නාවේ ඇයි කියලා අපි අහන්න කැමැතියි. ඒ වාගේම පකිස්ථානයේ මලාලා දැරිවිය අධ්‍යාපනයේ අයිතීන් වෙනුවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කථා කිරීම නිසා හිසට වෙඩි තැබූ ඒ තිරස්චීන අමානුෂික ක්‍රියාව හෙළා දකින්න ඇයි පාරට බැස්සේ නැත්තේ? ප්‍රකාශ නිකුත් කළේ නැත්තේ? ඒ වාගේම මුළු බෞද්ධ ලෝකයම කම්පාවට පත් කරමින් ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන් මූලධර්මවාදීන් බාමීයන් බුදු පිළිම කාලතුවක්කු ප්‍රහාරවලින් කුඩුපට්ටම් කරද්දී ඒ ආගමික නිදහස අහිමි කිරීමේ ක්‍රියාවලට එරෙහිව පාරට බැස්සේ නැත්තේ ඇයි? ඒ වාගේම සිරියාවේ හා ඉරාකයේ ඉස්ලාමීය කලාපයක් ප්‍රකාශයට පත් කර තිබෙන අයි.එස්.අයි.එස්. ඉස්ලාමීය ත්‍රස්තවාදීන් කරනු ලබන තිරස්චීන අමානුෂික ක්‍රියා හෙළා දකින්නට වීදි නොබසින්නේ ඇයි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පැය 24 න් ඉරාකයේ මූසුල් නගරයේ ක්‍රිස්තියානි භක්තිකයන් පන්නා දැම්මා. ඝාතනය කළා. මූසුල් නගරයේ ඉපැරණි ක්‍රිස්තියානි දේවස්ථාන බෝම්බ සවිකර බිමට සමතලා කළා. අමු අමුවේ මිනිසුන්ගේ බෙලි කපනවා. යටත් නොවුණු අය සිය ගණනින් ඝාතනය කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉතිරි ටික සභාගත කරන්න. ඔබතුමා ලේඛනයක් නේ කියවන්නේ. ඔය ලේඛනය සභාගත කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ISRS ඉස්ලාමික ආගමිකයන්ගේ ක්‍රියා කලාපය මුළු ලෝකයම භීතියට පත් වෙලා. මට තව තත්පර කීපයක් දෙන්න. ගරු සභාපතිතුමනි, ලංකාවේ ඇතැම් මුස්ලිම් නායකයන් ලෝකය වටේ ගිහිල්ලා ගතු කේලාම් කියනවා. ලංකාවේ මුස්ලිම් ජනතාවගේ ආගමික නිදහස නැති වෙලා කියනවා. ඇමරිකානු තානාපතිනියට, ඒ වාගේම නවනීදන්පිල්ලේ කොමසාරිස්තුමියට වාර්තා ලබා දීලා ලංකාවේ ආගමික නිදහස තහවුරු කරන්න කියලා ඉල්ලන, තමන්ගේ ආරක්ෂකයෝ යැයි සිතාගෙන ඉන්න අය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හෙළ උරුමයට වෙනම නීතියක් තිබෙනවාද දන්නේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පලස්තීනය තුළ කටයුතු කරන ආකාරයෙන්වත් පාඩමක් ඉගෙන ගන්න. ඊශ්‍රාලයට එරෙහිව පලස්තීනය වෙනුවෙන් පාරට බහින අයට අපි කියන්නේ, ඉස්ලාමීය අන්තවාදීන්ගේ අමානුෂික අපරාධවලට එරෙහිව පාරට බහින්න. එදාට අපි යුක්තිය, ධර්මය සාධාරණය වෙනුවෙන් ඔබතුමන්ලා සමඟ පාරට එන්න සූදානම් කියන ප්‍රකාශය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මම සඳහන් කරන්නේ පානදුර රජයේ ගල්වල පිහිටි ගල්ගොඩහේන ඉඩමේ මේ වන විට කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා පිඹුරුපත් සකස් කර අවශ්‍ය ගිවිසුම්වලට එළැඹිලා තිබෙන තත්ත්වයක් තුළ එම ප්‍රදේශයේ පවුල් විශාල සංඛ්‍යාවකට මෙම තත්ත්වය නිසා විශාල පාරිසරික හා සෞඛ්‍ය ගැටලු රාශියකට මුහුණපාන්න සිදු වෙලා තිබෙනවා. පසුගිය දවස්වල මේ තත්ත්වයට මුහුණ දෙන ප්‍රදේශයේ ජනතාව එකතු වෙලා තමන්ගේ විරෝධතාවය පළ කරනු ලැබුවා. ඒ මහජන නියෝජිතයන් ඒ අවස්ථාවට සම්බන්ධ වුණාට පස්සේ ඔවුන්ගේ ඉල්ලීම වුණේ, මේ ගල්වල පිහිටි භූමිය තුළ කසළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීම නිසා ඇති විය හැකි පාරිසරික තත්ත්වයන් මර්දනය කිරීමට නම් මේ ව්‍යාපෘතිය වෙනත් සුදුසු ස්ථානයකට ගෙනි යන ලෙසටයි.

ගරු සභාපතිතුමනි, ඉතාමත් ගෞරවයෙන් සඳහන් කරන්නේ. මේ තැන මීට අවුරුදු විශාල ගණනකට ඉස්සෙල්ලා, උදාහරණයක් විධියට කොළඹ මල්වත්ත පාරේ අල්ලලා තිබෙන කළුගල් කපලා තිබෙන්නේ මේ ගල්වලෙන් තමයි. ඒ නිසා මේ ගල්වල සඳහා කළු ගල් භාවිතා කිරීමේදී දැමූ යම් බෝර ආදී දේවල් නිසා විශාල ගල් තැලුම් සංඛ්‍යාවකට භාජනය වෙලා තිබෙනවා. ඒ පිපිරීම් නිසා යම් ආකාරයකට මේ කසළ භාවිතා කිරීම සඳහා මේ භූමිය යොදා ගත්තොත් එහෙම පානීය ජල ප්‍රශ්නය සඳහාත්, ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ගැටලු සඳහාත් මේ ව්‍යාපෘතිය මහත් ව්‍යසනයක් වන තත්ත්වයක් තුළ තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න බලාපොරොත්තු වන භූමියට ආසන්නයේම මීටර් 03 ක්, 10 ක් අතර ප්‍රමාණයේ නිවාස ගණනාවක් තිබෙනවා. ඒ වාගේම කිලෝමීටරයකට මෙපිට සීමාවේ නිවාස 1000 කට වඩා වැඩි ප්‍රමාණයක් තිබෙන තත්ත්වයක් තුළ තුන් වතාවක් ප්‍රදේශයේ ජනතාවගේ විරෝධය නිසා පළවා හරිනු ලැබූ ව්‍යාපෘතියක් තමයි නැවත මේ ස්ථානයට බලහත්කාරයෙන් ගෙනෙන්න උත්සාහ කරන්නේ. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළ ප්‍රදේශයේ ජනතාවට හෝ පානදුර ආසනයේ ජනතාවට හෝ පානදුරත්, බණ්ඩාරගමත් මායිමේ පිහිටි ජනතාවට හෝ මෙයින් ලැබෙන සෙතක්, සුවයක් නැහැ. ළමුන්, බාල මහළු සැම දෙනාම තව තවත් විශාල ව්‍යසනයන්වලට, විශාල රෝගීන් තත්ත්වයන්ට පත්වෙන තත්ත්වයක් විතරයි මෙයින් පත් වෙන්නේ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, පානදුර ප්‍රාදේශීය සභාව විසින් මේ භූමියේ පිහිටි මේ ස්ථානයට යන පාර ප්‍රාදේශීය සභා මාර්ගයක් වශයෙන් ලබා දීලා තිබෙන තත්ත්වයක් තුළ, මේ ව්‍යාපෘතියේ එක කොටසක් විධියට සුසාන භූමියට යන මේ පාර පවා වහන්න තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ නිසා පොදු සුසාන භූමිය භාවිතා කරන උදවියට, මේ පොදු සුසාන භූමිය භාවිතා කරන්න බැරිව යනවා. ඒ වාගේම මේ ගල්වල පිහිටි භූමියේ වසර අවුරුදු 100 කට වඩා පැරණි ජීවීන් විශාල ප්‍රමාණයක්, ඉබ්බන් වැනි සතුන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම ඉත්තෑවා, මී මින්නා, හඳුන් දිවියා, පිඹුරා, හාවා වැනි විශාල වන සතුන් ප්‍රමාණයක් ගහන භූමියකයි මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය කරන්න හදන්නේ. ඒ නිසා ඉතාමත්ම සැලකිල්ලෙන් හා ඕනෑකමින් යුතුව පානදුර ප්‍රාදේශීය සභා බල සීමාවට අයිති රජයේ ගල්වල පිහිටි ගල්ගොඩහේන ඉඩමේ මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම තුළ ප්‍රදේශයේ ජනතාවට ඇති විය හැකි පාරිසරික හානි සහ සෞඛ්‍ය හානි පිළිබඳව සලකා බලා මේ ව්‍යාපෘතිය යළිත් වතාවක් එම ස්ථානයේ පිහිටුවීම, ස්ථාපිත කිරීම සුදුසු ද යන්න සලකා බලන මෙන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ගරු සභාපතිතුමා මාර්ගයෙන් අදාළ විෂයය භාර ඇමැතිතුමා වෙත ඉල්ලීමක් කරනවා. ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී සභාව උදෑසන තේ විවේකයට කල් තබන්න බලාපොරොත්තු වෙනවා. මම ඔබතුමන්ලාව දැනුවත් කරනවා. සුපුරුදු විවේකාගාරයේ නොවෙයි අද දිනයේ සිට අපි තේ සූදානම් කරලා තිබෙන්නේ. මෙම රැස්වීම් ශාලාවේ පහළ මාලයේ කොටසක තමයි භෝජනාගාරය සූදානම් කර තිබෙන්නේ. පිටුපස දොරටුවෙන් යන්න. ගරු මන්ත්‍රීවරුන්ට ඒ තුළ යම්කිසි අපහසුතාවයක් ඇති වුණොත් එහෙම සමාව ඉල්ලා සිටිනවා. මොකද, අපි නව සභා ගර්භය ඉදි කරන නිසයි මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ.

*ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.28 ට යළිත් රැස් විය.*
*Sitting, accordingly suspened untill 11.28 A.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු ගරු අමාත්‍යතුමාට අවස්ථාව, සභාවේ කටයුතු සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, "*බස්නාහිර පළාතේ පළාත් සභාවේ **IV** හා **V** වන පළාත් සභාවලදී සාකච්ඡා කර පිළියෙල කරනු ලැබ, 2011.08.04 දින බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යොමු කරන ලද, කාර්ය පටිපාටි රීති (සංශෝධන) - 2011 කෙටුම්පතෙහි 12 වන රීතියත්, 40 සහ 49 වන රීතින් පිළිබඳවත් වූ නිරීක්ෂණයන්, 2013.09.03 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් එවා ඇති බැවින්, එකී නිරීක්ෂණයන් හා කාර්ය පටිපාටි රීති (සංශෝධන) - 2011 කෙටුම්පත පිළිබඳව යළිත් විමසිල්ලට ලක් කර මෙම පළාත් සභාවට වාර්තා කිරීම සඳහා කාර්ය පටිපාටි රීති පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය.*" යන යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එකඟයි. ගරු සභාපතිතුමනි, දැන් මේ කාරණාව දීර්ඝ වශයෙන් අපි අදාළ කාර්යපටිපාටි රීති කාරක සභාවලදී සාකච්ඡාවට ලක් කළා. මහ සභාවේදීත් අවස්ථා දෙකකදී මේ පිළිබඳව කථා කළා. මම හිතන්නේ, මෙහි කරුණු එකක් ධූරධාරීන් පිළිබඳව තිබෙන කාරණයත්. අනික් එක තමයි පාර්ලිමේන්තුවට අපි යෝජනාවක් ඉදිරිපත් කළාට පස්සේ පාර්ලිමේන්තුවෙන් මාස තුනක් ඇතුළත මේ සම්බන්ධයෙන් තීන්දුවක් දුන්නේ නැත්නම් ඒක පළාත් සභාව තුළ අනුමත වූවාය යන්න තමයි එයින් ගම්‍ය වෙන්නේ. මම හිතන්නේ මේ කාරණා හැර අනිකුත් සියලු දේ අපට මේ සභාවේදී සම්මත කරගන්න පුළුවන්කම තිබෙනවා නේ? මම හිතන්නේ අදාළ ධූරධාරීන් පිළිබඳව හා අනිකුත් කාරණා දෙක හැර - 2011 අපි ඉදිරිපත් කරපු වාර්තාවක්. ඒ නිසා ගරු සභාපතිතුමාගේ අවධානය යොමු වෙනවා නම් හොඳයි. මේ පිළිබඳව අපි සාකච්ඡා කරලා, මේ කාරණා හැර අනික් සියල්ල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි කාර්යපටිපාටි රීති කාරක සභාවට යොමු කරලා එතැනදී සාකච්ඡා කරමු.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයි. ඒ අනුව අපේ ගරු විපක්ෂ නායකතුමාත් අදහස් කළ පරිදි අපි එම ලේඛන තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා කාර්යපටිපාටි රීති පිළිබඳ කාරක සභාවට යොමු කරනවා.

*අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*Question having put consequently, was agreed to.*

# 2014 පරිපූරක ඇස්තමේන්තුව - 01

SUPPLEMENTARY ESTIMATE – 01- 2014

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ අඩක් නිම කළ පාසල් ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම සඳහා රජයෙන් ලබා දී ඇති රුපියල් මිලියන 450 ක මුදල වියදම් දැරීම වෙනුවෙන් ප්‍රතිපාදන සැලසීමද,*

*බස්නාහිර පළාතේ අධ්‍යාපන සංවර්ධන කටයුතු සඳහා 2012 හා 2013 වර්ෂවලදී ලෝක බැංකු ආධාර යටතේ ලද මුදලින් වියදම් නොවී ඉතිරි වී ඇති රුපියල් මිලියන 188 ක මුදල 2014 වර්ෂයේදී උපයෝජනය කිරීමට හැකි වන පරිදි අමතර ප්‍රතිපාදන සැලසීමද,*

*පළාත් සංවර්ධන වැඩ සටහන් යටතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත වෙන් කර තිබූ මුදලින් රු. මි. 46 ක මුදලක් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර හා ග්‍රාම සංවර්ධනය, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා දීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද යන කාරණා වෙනුවෙන් පිළියෙල කරන ලද 2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 (රු. 684,000,000/-) අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ අදහස විමසනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ අඩක් නිම කළ ගොඩනැගිලි කියලා තිබෙන ඒවා. හඳුනාගෙනද, නැද්ද? ක්‍රියාත්මක වෙන ඒවාද? එහෙම නැත්නම් අලුත් ගොඩනැගිලිත් මේකට ඇතුළත් වෙනවාද කියන එක.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව පැහැදිලිව කියන්න ඕනෑ. මීට පෙර අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පානදුර පැවැති පළාත් රැස්වීමේදී එතුමාට අපි ඉදිරිපත් කළා, බස්නාහිර පළාතේ ඒ වනකොට භාගෙට ඉදි කර ඇති ඉදි කිරීම් අවසන් කරන්නේ නැති, අවුරුදු 08, 10, 15 පැරණි ගොඩනැඟිලි තිබුණා. ඒ වාර්තාව අපි එදා ඒ සභාවට ඉදිරිපත් කළාම, ඒ ගොඩනැගිලි සකස් කිරීම සඳහා පසුගිය අවුරුදු කීපය තුළ මිලියන 400, 450 ගණනේ අපේ අයවැයට අමතරව මුදලක් හැමදාම භාණ්ඩාගාරයෙන් ලබා දුන්නා. මෙවරත් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. 2014 දී මිලියන 450 ක්. ඒ මුදල පාවිච්චි කිරීම සඳහා තමයි මේක කරන්නේ. මේ මුදලිනුත් එදා දීපු සැලැස්මේ සියලුම ව්‍යාපෘති අවසන් කරන්න බැහැ. මම හිතන්නේ, තවත් අවුරුද්දකට, දෙකකට දීර්ඝව යන්න සිද්ධ වෙනවා. මෙතැනදී අපි කරන්නේ, ඒ ලැයිස්තුවේ තිබුණු ව්‍යාපෘතිවලට අනුව එක තට්ටුවක් - අපි කියන්නේ ගොඩනැගිල්ලම අවසන් කරන්න බැරි නම් දරුවන්ට පාවිච්චි කරන්න පුළුවන් මට්ටමකට මේ කටයුතු අවසන් කරන්න බලාගෙන තමයි මේ මුදල් පාවිච්චි කරන්න පුළුවන්කම තිබෙන්නේ.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සඳහා ඔබතුමාගේ අවසරය ඉල්ලනවා. ගරු සභාපතිතුමනි, ගිය ඉරිදා මහරගම පොදු වෙළඳ පොලේ උඩුමහලේ ගින්නක් හටගෙන එහි කඩ කිහිපයක් විනාශයට පත් වුණා. ඒ විනාශයට පත් වුණු අවස්ථාවේදී මාධ්‍ය සාකච්ඡාවක් තුළින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කෙටියෙන් කියන්න. පරිපූරකය සම්මත -

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මාධ්‍ය සාකච්ඡාව තුළින් මහරගම නගර සභාවේ ගරු සභාපතිතුමිය ප්‍රකාශයක් කරලා තිබුණා. මහරගම නගර සභාවට ගිනි නිවන ඒකකයක් ලබා ගැනීමට නොහැකි වුණේ, මීට පෙර හිටපු විපක්ෂය විසින් ඊට එරෙහිව කටයුතු කරපු නිසයි කියලා. ගරු සභාපතිතුමනි, ඒ චෝදනාව පිළිබඳව හිටපු විපක්ෂ නායකවරයා හැටියට මම මගේ විරෝධතාවය දක්වනවා. මොකද හේතුව, එවැනි අවස්ථාවකදී ඒ සඳහා අවසර නොදුන්නේ ගරු මහ ඇමැතිතුමාත් දන්නවා ඇති. ඒකට අවශ්‍ය කරන පසුබිම මහරගම නගර සභාව තුළ නැති නිසයි. ප්‍රමිතීන් තිබුණේ නැති නිසයි. ඒ නිසා ඊට පෙරත් 2002 කාලයේදී අපේ පාලන බල කාලය තුළදී අපි උත්සාහ කළා ඒකට වෙනම ගිනි නිවීම් ඒකකයක් ලබා ගන්න. ඒ අවස්ථාවේදී ඒ ගිනි නිවීම් ඒකකය ලබා ගැනීමේදී ඒ අපහසුතාවයම ඇති වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රකාශයක් කරන්න දෙන්න අමාරුයි.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ නිසා ගරු සභාපතිතුමනි, එතැනදී උත්සාහ දැරුවේ මාව විවේචනයට ලක් කිරීමක් කරන්න. ඒ නිසා දේශපාලන වශයෙන් මාව දැඩි අපහසුතාවයකට ලක් වන නිසා. ඒ වාගේම විපක්ෂය එදා එපමණ බලවත් වුණා නම් මම හිතන්නේ පාලක පක්ෂයක් අවශ්‍ය නැහැයි කියන හැඟීමකුත් ඇති වෙනවා. ඒ නිසා ඒ ප්‍රකාශය මේ සභාවට ලක් කරනවා. මොකද හේතුව, අපේ පළාත් සභාව යටතේ තිබෙන ආයතනයක් නිසා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 සම්බන්ධව සභාවේ එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## 2014 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය
APPROPRIATION STATUTE RELEVANT TO THE SUPPLEMENTARY ESTIMATE - 01 - 2014

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2014 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 01 සඳහා අවශ්‍ය රුපියල් හැට අට කෝටි හතළිස් ලක්ෂයක් (රු. 684,000,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2014 අංක ....... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු. එක, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව. එම යෝජනාව ඉදිරිපත් කරන ලෙස මම ඔබතුමාට ආරාධනා කරනවා.

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා මොකක් ගැනද කථා කරන්න යන්නේ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මට වරප්‍රසාද ප්‍රශ්නයක්. අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රශ්නය පිළිබඳව මම මහරගම මන්ත්‍රීවරයෙක් හැටියට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නෝනා ගැන කථා කරපුවාම මහත්තයා කළබල වෙන්න ඕනෑ නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ සම්බන්ධව වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා, විපක්ෂයෙන්. ගිනි නිවන ඒකකයක් ගන්න අවසර දුන්නේ නැහැයි කියලා

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, එතැන ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් සිදු වෙලා නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ ගිනි නිවන ඒකකය මහරගමට ලැබුණේ නොමිලේ. ඒක පරිත්‍යාගයක්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඔබතුමාගේ පවුලේ වරප්‍රසාද කඩ වෙලාද?

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේ පරිත්‍යාගයට ඩියුටි ෆ්‍රී ගෙවන එක අපි ලැහැස්ති කරලා -

[සභාවේ ඝෝෂා]

නැව් ගාස්තු ගෙවන්න අවසරයක් දුන්නේ නැහැ. ඒ නිසා තවමත් මේක වරායේ තිබෙනවා. යන්ත්‍රය තවම වරායේ දිරනවා. මේක තමයි ඇත්ත කථාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම අපි මේ ගැන - මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS' MOTION:

## බෝ නොවන සහ බෝවන රෝගවලින් දරුවන් බේරා ගැනීමට අධ්‍යාපන හා සෞඛ්‍ය අමාත්‍යාංශ එක්ව සෞඛ්‍ය සමාජ පිහිටුවීම හා වැඩ සටහන් දියත් කිරීම
ESTABLISHING HEALTH SOCIETIES AND IMPLEMENTING PROGRAMMES IN COLLABORATION WITH EDUCATION AND HEALTH MINISTERIES TO PROTECT CHILDREN FROM COMMUNICABLE AND NON-COMMUNICABLE DISEASES

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි**,** ඔබතුමාගේ අවසරය පරිදි මගේ යෝජනාව ඉදිරිපත් කරනවා. *"බස්නාහිර පළාත තුළ ජීවත් වන පාසල් යන වයසේ දරුවන් අද දවසේ නොයකුත් රෝග පීඩාවලට බහුලව ගොදුරු වන අවස්ථා අප දැක ඇත. එයට බලපාන ප්‍රධාන හේතුව අයහපත් සෞඛ්‍ය පුරුදු සහ චර්යා පද්ධතිවල තිබෙන අසාමාන්‍ය වූ වෙනස්කමිය. මේ නිසා බෝ නොවන රෝගවලට දරුවන් ගොදුරු වන අවස්ථා බොහෝය.*

*එසේම මාරාන්තික ඩෙංගු රෝගයට ද දරුවන් බහුල වශයෙන් ගොදුරු වන අතර, එයට බලපා ඇත්තේ පරිසරය පිරිසිදුවට තබා ගැනීමට අප ගන්නා උනන්දුවේ මදිකම බව පැහැදිලි වී ඇත. මෙම සියලු තත්ත්වයන් සලකා මෙවැනි රෝග පීඩාවලින් දරුවන් ගලවා ගැනීමේ පියවරක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය (බස්නාහිර පළාතේ) – එක්ව පාසල් තුළ සෞඛ්‍ය සමාජ පිහිටුවා, ඒ තුළින් දරුවන් දැනුවත් කිරීම, රෝග සඳහා ඖෂධ සහ උපදෙස් ලබා දීම හා පරිසරය පිරිසිදු කිරීම වැනි කාරණා සඳහා නීතිමය රාමුවක් තුළින් මැදිහත් විය යුතු යැයි මෙම පළාත් සභාව යෝජනා කර සිටියි."*

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[පූ.භා. 11.43]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව ඉදිරිපත් කරලා දැන් මාස ගණනක් වෙනවා. පළාත් සභාව පිහිටවපු මුල් අවස්ථාවේ විතර යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් වුණේ. නමුත් දිගින් දිගට පළාත් සභාව තුළ කථාබහ කරපු දේවල් එක්ක මේ යෝජනාව සැලකිල්ලට ගැනීම පස්සට ගිහිල්ලා තිබුණා. නමුත් ප්‍රමාද වීමෙන් හෝ මේ යෝජනාව අද දවසේ සභාවේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව ගෙනෙන්න ප්‍රධාන හේතුව තමයි යමෙකුට හිතෙන්න පුළුවන් මේ යෝජනාව ගෙනාවට පස්සේ මේක මේ ආණ්ඩුව, පළාත් සභාව එකතු වෙලා කරන්න ඕනෑ වැඩේ ළමයින් සම්බන්ධ වෙලා කොහොමද කරන්නේ කියලා.

ගරු සභාපතිතුමනි, මෙය ගෙනෙන්න ප්‍රධානම හේතුව තමයි පසුගිය කාලවකවානුවේ ඉතාම හදිසියේ ඩෙංගු රෝග තත්ත්වයන් ඉහළ යන පරිසරයක් අපේ බස්නාහිර පළාත තුළ ඇති වෙමින් තිබුණා. ඒ නිසාම අපි ජීවත්වන ප්‍රදේශවල පාසල්වල දරුවන් කීපදෙනෙක් අකාලයේ මිය යෑමක් සිද්ධ වුණා. ඒ මිය යෑම සිද්ධ වෙනවාත් එක්කම පාසල් වහලා දාලා පාසල තුළ පිරිසිදු කිරීමේ වැඩ සටහන ආරම්භ කරන්න කියලා සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝග නිකුත් කළා. ඒ නියෝග නිකුත් කිරීම තුළ ගරු සභාපතිතුමනි, පාසල් ප්‍රජාව බරපතළ අපහසුතාවයකට පත් වුණා, කොහොමද මේ කටයුත්ත කරන්නේ කියලා. ඉතින් ඒ නිසා එවැනි කටයුත්තක් කරන්න අවශ්‍ය නීතිමය තත්ත්වයක්, එහෙම නැත්නම් එවැනි කටයුත්තකට මුහුණ දීමට සිදු කිරීමට අවශ්‍ය කරන රාමුවක් නිර්මාණය කර ගැනීම සඳහා වූ වටාපිටාවක් හදාගන්න තමයි මම යෝජනාව පෞද්ගලිකව කරන්නේ.

විශේෂයෙන්ම අද දවසේ අපි දන්නවා, අපේ සමාජයේ ජීවත්වන දරුවෝ රෝග ගණනාවකට මුහුණ දෙනවා. ඒ රෝගවලට මුහුණ දෙද්දී බොහෝ අවස්ථාවල අපි දකින්නේ ඒ රෝග වෙනුවෙන්, රෝගවලට බෝ වීම සඳහා දරුවන් යොමු කිරීම කෙරෙන ව්‍යාපාර රට ඇතුළේ කරගෙන යන බව. විශේෂයෙන්ම අද රූපවාහිනිය ගත්තොත් රූපවාහිනිය ඇතුළේ තොරතෝංචියක් නැතිව කෑම බීම වර්ග අලෙවි කරන්න කරන ප්‍රචාරක දැන්වීම් පාලනය කරන්න අවශ්‍ය කරන නීතිමය බලතල මේ රටේ සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ තිබුණත්, ඒවා ක්‍රියාත්මක වෙලා ඒවා පාලනය කිරීම සිද්ධ කරන්නේ නැහැ. ඒ නිසා දරුවන් විශාල පෙළඹවීමකට ගිහිල්ලා, දරුවෝ විවිධ අයහපත් කෑම බීම ආහාරයට අරන් විවිධ රෝග පීඩාවලට පත් වෙනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අපි දන්නවා අපේ පාසල් පද්ධතිය ඇතුළේ තිබෙන ආපනශාලා නිරීක්ෂණය කරන්න, ආපනශාලා බලන්න ඒ වෙනුවෙන් යොදවපු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් අපේ අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළේ නැහැ. මම විශ්වාස කරන්නේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළේ පළාත් සභාවේ පාසල්වල ඉන්න දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වූ වෛද්‍යවරයෙකුගේ සේවය පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා ගත යුතුව තිබෙනවා. ඒ වාගේම තමයි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ සේවය ලබාගත යුතුව තිබෙනවා. පාසල් ආපනශාලා ඇතුළේ විකුණන කෑමවල ප්‍රමිතිය පිළිබඳ සහතික කිසි කෙනෙක් නිකුත් කරන්නේ නැහැ. පාන් පිටි බහුලව තිබෙන කෑම, අහිතකර කෑම අතිවිශාල ප්‍රමාණයක් පාසල් ඇතුළේ විකුණනු ලබනවා. ඒ නිසා දරුවෝ බෝ නොවන රෝගවලට විශාල ලෙස ලක් වෙනවා කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ.

ඒ වාගේම අනික් කාරණය තමයි පාසල් පිරිසිදු කිරීම සඳහා වූ විධිමත් වැඩ පිළිවෙළක්, ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් ඇත්තේ නැහැ. දැන් අපි පසුගිය දවස්වල මම පෞද්ගලිකවත් දැක්කා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඇවිල්ලා ඉස්කෝලවල විදුහල්පතිවරුන්ට දඩ කොළ දීලා යනවා. පිරිසිදුවට තිබිලා නැහැ. ඩෙංගු කීටයෝ බෝ වෙන මධ්‍යස්ථාන පාසල ඇතුළේ පවත්වාගෙන යනවා කියලා. මේක ප්‍රින්සිපල්ට තනියම කරන්න පුළුවන් වැඩක් නොවෙයි. ප්‍රින්සිපල්ට දඩ ගහලා මේක කවදාවත් ඉවර කරන්න බැහැයි කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. ඒ නිසා මේකට පාසල ඇතුළේ කමිටුවක් හදන්න කියලා මම යෝජනා කරන්නේ, විශේෂයෙන් පාසල් ප්‍රජාව ඇතුළේ දරුවන්ගේ දෙමව්පියන් සෞඛ්‍යමය වශයෙන් මේවාට මැදිහත් වෙන්න විශේෂ ප්‍රාගුණ්‍යයක් ලබපු දෙමව්පියන් පාසල් පද්ධතිය ඇතුළේ ඉන්නවා. ඒ වාගේම පාසලට සුභ පත්තන්නන් අතර මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අත්දැකීමක්, අවබෝධයක් තිබෙන අය ඉන්නවා. ඒ වාගේම පාසලේ ගුරුවරුන් මේකට සම්බන්ධ කරගන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම සෑම

පාසලකම ආදි ශිෂ්‍යයන් බිහි කරලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රවල ඉහළට ගිය අය ඉන්නවා. මේ අයගේ සහයෝගය ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ සියලුදෙනා එකතු කරලා නීත්‍යානුකූල රාමුවක් ඇතුළේ ක්‍රියාත්මක වෙන්න පුළුවන් කමිටුවක් හදන්න කියන යෝජනාව තමයි අපි කරන්නේ. පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයත්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයත් දෙක එකතු වෙලා හදපු සෞඛ්‍ය සමාජයක්. ඒකට නීතිමය බලතලයක්, නීතිමය රාමුවක් තිබෙන එකක්. යම් වැඩක් නීතිමය වශයෙන් පවරලා ක්‍රියාත්මක කරන්න පුළුවන් අවස්ථාවක් නිර්මාණය කරන්න පුළුවන් විධියට මේ කමිටුව නිර්මාණය කළොත් අපට පුළුවන් පාසල් ඇතුළේ නිරන්තර සෞඛ්‍ය තත්ත්වය නංවාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යන්න.

විශේෂයෙන් දරුවන්ට සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් කරන්න. අද අපි දන්නවා, අලුත් තාක්ෂණය පාවිච්චි කිරීම නිසා ඒ තාක්ෂණයත් එක්ක දරුවන් කටයුතු කරන්න යාම නිසා දරුවෝ මානසික ආතති තත්ත්වයන්ට මුහුණ දෙන අවස්ථාවලුත් බහුලව තිබෙන බව. හැබැයි, අපට හරිහමන් උපදේශන පන්ති පවත්වන්න, එහෙම නැත්නම් උපදේශන සඳහා කැප වෙන්න පුළුවන් හරිහමන් යාන්ත්‍රණයක් පාසල් පද්ධතිය ඇතුළේ නැහැ. ඒ නිසා දරුවෙකුට එහෙම ප්‍රශ්නයක් මතු වෙන කොට ඔහුට කථා කරන්න, ඔහුගේ අදහස දැනගන්න, එය සමනය වෙන්න පුළුවන්, උපදෙසක් දෙන්න පුළුවන් අවස්ථාවක් අපට පාසල් පද්ධතය ඇතුළේ නැහැ. අපට මේ ඇති කරන සෞඛ්‍ය සමාජ ඇතුළට එවැනි අයව එකතු කරලා, ඒ සෞඛ්‍ය සමාජ ශක්තිමත් කරලා ඒ හරහා නිරන්තර අවධානය, අවබෝධය තියාගෙන දරුවන්ට ඇති වන ප්‍රශ්නවලින් දරුවන් බේරාගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා එවැනි සෞඛ්‍ය සමාජයක් හදලා ඒ සෞඛ්‍ය සමාජය මඟින් පාසල් අධීක්ෂණය, පාසල් නිරීක්ෂණය කිරීම තුළ පාසල් දරුවන් බෝ නොවන රෝගවලට වාගේම එදිනෙදා පරිසරයෙන් ඇති වන රෝග තත්ත්වයන්වලින් වළක්වා ගැනීම සඳහා පියවරගත හැකි පරිසරයක් නිර්මාණය කරගන්න පුළුවන් කියන විශ්වාසය තිබෙන නිසා තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ. ඒ නිසා මේ යෝජනාව පෝෂණය කරලා, මේක වැඩි දියුණු කරලා, මේක අධ්‍යාපන උපදේශක කාරක සභාවට ගෙනිහිල්ලා, අධ්‍යාපන උපදේශක කාරක සභාව හරහා මේක ක්‍රියාත්මක කරවන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කරලා දෙන්න මේ සභාව කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව සලසා දීම ගැන නැවතතත් ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.49]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මෙම සභාව ආමන්ත්‍රණය කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව මම ඔබතුමාට මුලින්ම මගේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම අද මම කරන කථාව තුළින් විශේෂයෙන් අපේ රංජිත් සෝමවංශ සෞඛ්‍ය ගරු ඇමැතිතුමාට යම් යම් කාරණා කීපයක් පිළිබඳව අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, මෙය ජාතික ප්‍රශ්නයක්. මේ රටේ ජනතාවට ඉතා බැරෑරුම් ලෙස බලපාන. ඒ නිසා පක්ෂ භේදයකින් තොරව විපක්ෂය ආණ්ඩු පක්ෂය විසින් මේක වැළැක්වීම සඳහා ගන්නා සියලු ක්‍රියාමාර්ගයන්ට පූර්ණ සහයෝගය ලබා දෙන බව අපි ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, අපි සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම ලංකාවේ ඩෙංගු - මම මේ අද දින කථා කරන දෙය ඩෙංගු රෝගයට අදාළව පමණක් කථා කරන්න සීමා කරන්න බලාපොරොත්තු වෙනවා. මුළු ලංකාවම ගත්තාම 60% ක් ඩෙංගු රෝගීන් ඉන්නේ බස්නාහිර පළාත් සභා ප්‍රදේශය තුළ. එයින් 40% ක් තමයි වෙනත් ප්‍රදේශවල ඉන්නේ. ඒ 40% නුත් කොළඹ ප්‍රදේශයේ Hostelවල ඉන්න අය ඩෙංගු හැදිලා පිට පළාත්වලට ගිහිල්ලා එමඟින් එම ප්‍රදේශවල ඩෙංගු රෝගය වර්ධනය වන බවටයි විශේෂඥයින් ප්‍රකාශ කරන්නේ. 2011 වර්ෂයේදී ඩෙංගු රෝගීන් 28,473 ක් ඉඳලා තිබෙනවා. 2012 දී 44,456 ක්. ඒ කියන්නේ 50% ක වර්ධනයක් වෙලා තිබෙනවා. 2013 වර්ෂයේ 32,063 ක් දක්වා අඩුවීමක් තිබෙනවා. 2014 ජූලි මස 31 වැනිදා වන විට 24,391 ක්, ඒ කියන්නේ අවුරුද්ද අවසාන වන විට සාමාන්‍යයක් හැටියට ගත්තොත් 41,270 ක ඩෙංගු රෝගීන් මේ වර්ෂය තුළ, බස්නාහිර පළාත් සභා ප්‍රදේශය තුළ ඇති වේවිය කියලා අපට විශ්වාස කළ හැකියි. එහෙමනම් ගිය අවුරුද්දත් එක්ක සංසන්දනය කරනකොට 25% ක වර්ධනයක් ඇති වන බවයි පෙනී යන්නේ. කොළඹ දිස්ත්‍රික්කය ගැන විතරක් කථා කළොත් 2010 දී 5942 යි. 2011 දී 10,123 යි. 100% කින් වැඩි වෙලා තිබෙනවා. 2012 දී 10,017 යි. 2013 දී 10,783 යි. 2014 ජූලි මාසයේ 31 වැනිදා වන කොට 8506 යි.

[ ගරු ශ්‍රීනාත් ම. පෙරේරා]

මේ අනුව 15,000 ක් දක්වා මේ රෝගීන් ප්‍රමාණය වැඩි වෙයි කියලා හිතන්න පුළුවන්. 50% ක වැඩි වීමක් කොළඹ දිස්ත්‍රික්කය තුළ විතරක් තිබිලා තිබෙනවා. බස්නාහිර පළාත් සභා ප්‍රදේශය ගත්තොත් 2010 දී 11,711 යි. 2011 දී 15,913 යි. 2012 දී 20,814 යි. 2013 දී 16,540 යි. 2014 ජූලි මාසයේ 31 වැනිදා වනතුරු 14,041 යි. මේක 24,000 දක්වා වැඩි වන බවට අපට පෙනී යනවා. සාමාන්‍යයක් හැටියට ගත්තොත් ගිය අවුරුද්දට සාපේක්ෂව සලකා බැලුවාම එතැනත් 50% ක වැඩි වීමක් ඇති වෙනවා. අපි මේ ඩෙංගු මාරයාව පාලනය කරන්න අරගෙන තිබෙන පියවර මොනවාද? එක, BTI ඉසීම. නමුත් BTI ඉසීම පාලනය කළ යුතු වර්ග තුනක් තිබෙන බව අපි දන්නවා, බිත්තර විනාශ කිරීම. කීටයා, පිළවා සහ මදුරුවා. Adult Mosquito කියන එක. කීටයා දවස් දෙකයි පවතින්නේ. පිලවා දවස් දෙකයි. මදුරුවා -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ ඩෙංගු යෝජනාවක් නොවෙයි නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් ඉන්න. ඩෙංගු ගැන සඳහන් කරලා තිබෙනවා. කරුණාකරලා කථා කරන්න දෙන්න. බණ කථා කරන්නේ නැතිව. දවස් හතයි. දවස් දහයයි. මේ වැදගත් කථාවක් කරන්නේ. එතකොට කීටයාට BTI පාවිච්චි කරනවා. නමුත් BTI පාවිච්චි කිරීමෙන් හැම කීටයෙක් වැඩෙන තැනකටම ඒක යොමු කරන්නට බැරි වෙනවා. නිදර්ශනයකින් කියනවා නම්, ටයර් එක ඇතුළත කීටයන් ඇතිවීම BTI යොදලා පාලනය කරගන්න බැහැ. දෙවැනි එක තමයි දූමායනය. Fogging කියලා අපි කියනවා. Fogging වලින් කෙරෙන්නේ මදුරුවා ඉන්න තැනින් පළවා හැරීම පමණයි. ඒ කියන්නේ මම ඉන්න ගෙදරින් Fogging කරලා, දූමායනය කරලා මගේ ගෙදර ඉන්න මදුරුවා තව කිලෝ මීටර් භාගයක් එහා ඉන්න තැනට යැවීමෙන් මම හිතන්නේ අපට ප්‍රතිඵලයක් ලබන්නට බැහැ. ඒ විතරක් නොවෙයි. පරිසරයට අවශ්‍ය කෘමීන් මේ Fogging නිසා විනාශ වෙලා යනවා කියලා පරිසරවේදීන් සහ විශේෂඥයින් කියනවා. එහෙමනම් අප දැනට අනුගමනය කරන ක්‍රමවේදයන් අතරින් ප්‍රධානම දේ හැටියට සලකන්න පුළුවන් මදුරුවන් බෝවන තැන් ඉවත් කිරීම. ඒ පිළිබඳව අපේ අවධානය වැඩියෙන් යොමු කිරීම අවශ්‍ය වෙනවා කියලා මම කියනවා. මේක වඩාත්ම ප්‍රතිඵලදායී කාරණාව බවට පත් වෙනවා.

නමුත් මම සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ. මෝසම් වැහි ඇවිල්ලා දවස් 07 යි, දවස් 10 යි යනකොට මදුරුවන් ඇතිවීම වැඩි වෙනවා. ඒ නිසා අප්‍රේල් මැයි වන කොට අපි දන්නවා මෝසම් වැසි එනවා. ජනවාරි, පෙබරවාරි වනකොට මෝසම් වැසි එනවා. අවාසනාවට වාගේ අපි ක්‍රියාකාරී වන්නේ මේ මෝසම් වැසි ආවායින් පස්සේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාට මේ සම්බන්ධයෙන් මම යෝජනාවක් හැටියට කරනවා. මෝසම් වැසි එන්නට ඉස්සෙල්ලා අප්‍රේල්, මැයි වන කොට මේ කීටයන් ඇති වෙන්න පුළුවන් ප්‍රදේශ විනාශ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන්න. ඒ විතරක් නොවෙයි. ජනවාරි, පෙබරවාරි මෝසම් වැසි එන්න ඉස්සෙල්ලා, ඊට පෙර අවුරුද්දේ දෙසැම්බර් මාසය වන විට මේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කළොත් එක්තරා ප්‍රමාණයකට හෝ අපට මේ උවදුර පාලනය කර ගැනීම සඳහා යම් හෝ අස්වැසිල්ලක් ලබා ගැනීමට පුළුවන් වෙයි.

මම කියන්නට ඕනෑ. මට ලැබිලා තිබෙන දත්ත අනුව වඩාත්ම මේ කීටයන් වර්ධනය වෙන්නේ රාජ්‍ය ආයතන අවටය කියලා දැනගන්නට තිබෙනවා. මහරගම පාසල් තුළ කරන ලද පර්යේෂණවලින්, මහරගම ආසනය තුළ තිබෙන සැම පාසලකම ඒ පර්යේෂණ කරපු සැම පාසලකම කීටයන් වැඩෙන තැන් තිබුණාය කියලා අපට දැනගන්නට තිබෙනවා. පිළිකා රෝහලේ මෑතකදී කීටයන් බෝ වීම වර්ධනය වෙලා තිබෙනවා කියලා දැනගන්න තිබෙනවා. මම හිතන්නේ රාජ්‍ය ආයතනවල මේක සිද්ධ වෙන්නේ - මගේ ගෙදර ඩෙංගු මදුරුවාගෙන් බේරගන්න මට උවමනාවක් තිබෙනවා. නමුත් රාජ්‍ය ආයතනයක ඉන්න නිලධාරීන්ට ඒ වාගේ වගකීමක් නැහැ. ඒ නිසා ගරු ඇමැතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා රාජ්‍ය ආයතනවලට අදාළව මේ කටයුත්ත ක්‍රියාත්මක කිරීම වඩාත් උනන්දුවෙන් කරන්නය කියලා. ඒ වගේම ඉදි කිරීම් කෙරෙන ස්ථානවල මේ කීටයන් බෝ වීම ඉතාමත්ම සීඝ්‍රව වර්ධනය වෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. යෝජනාවක් කරනවා. අර ඉදි කිරීම් කරන්න පළාත් පාලන ආයතනවලට අවසර දෙන කොට ඒ ගිවිසුමට ඇතුළත් කරන්න කොන්දේසියක්. ඩෙංගු මර්දනය කිරීම, ඩෙංගු මදුරුවා වර්ධනය වීම සඳහා තිබෙන ඉඩ ප්‍රස්ථා ඇතිවීම

වැළැක්වීම සඳහා කෙරෙන කොන්දේසියක් ඔවුන්ට අවසර දීමේදී ඇතුළත් කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ගෙවල්වලින් කුණු කසළ බැහැර කිරීමේදී ඒක නිසියාකාරව කෙරෙනවා නම්, ඒ වාගේම සාර්ථක ප්‍රතිචක්‍රියකරණ ක්‍රම මාර්ග අපි ඇති කරලා තිබෙනවා නම්, මේ ඩෙංගු උවදුර අඩු කරගන්නට අපට හුඟක් අවස්ථාව ලැබෙන්න පුළුවන්. ගරු මහ ඇමැතිතුමාගේ අවධානයටත් මම යොමු කරනවා. පාසල්වල පරිසර සමාජ පිහිටුවා තිබුණත්, ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාට මා දන්වා සිටින්නේ, මේ පරිසර සමාජයන් බොහොමයක් නිසියාකාරයෙන් ක්‍රියාත්මක නොවන බවයි. මම හිතනවා, පාසල්වල මේ පරිසර සමාජ නිසියාකාරව ක්‍රියාත්මක කළොත් මේ ඩෙංගු උවදුර පාලනය කිරීම සඳහා අපට සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට පුළුවන් වෙයි. පන්තියේ විෂය පථයට ඩෙංගු උවදුර පිළිබඳව දරුවන් දැනුවත් කිරීමේ කරුණු ඇතුළත් කිරීම ගැන සලකා බලන්නය කියලා ගරු මහ ඇමැතිතුමාගෙන් මම ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. ඩෙංගු මර්දන ආයතනවලට ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා දෙන්න ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ඉඩ ප්‍රස්ථා ලබා නොදෙන බවට මට දැනගන්නට තිබෙනවා. ඒ ආයතනවල ඉන්න රාජ්‍ය නිලධාරීන් ඉතා උනන්දුවෙන් තමන්ගේ කටයුත්ත කළත් ඒ පිළිබඳව මාධ්‍යයන් තුළ, මාධ්‍ය ප්‍රචාරය ලබා ගැනීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, විනාඩි දෙකක් දෙන්න. ප්‍රචාරය කරන්නට අවස්ථාව සලසා දීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් තිබෙනවා නම් ඒකත් කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. සංවර්ධන කමිටු පළාත් පාලන ආයතන සහ සමහර MOH නිලධාරින් අතර නිසියාකාර සම්බන්ධීකරණයක් ඇති නොවීමත් මෙයට එක හේතුවක් හැටියට අපට දක්වන්න පුළුවන්. සමහර ස්ථානවල සංවර්ධන කමිටු පළාත් පාලන ආයතන සහ MOH නිලධාරීන් අතරේ ඒ සම්බන්ධීකරණය තිබුණත් සමහර ස්ථානවල එක නැති බව අපට පෙනී යනවා. ග්‍රාම නිලධාරී කොට්ඨාශවලට අදාළව මෙහෙයුම් කමිටු පිහිටුවන්න. ඒකේදී වැඩි අවධානමක් තිබෙන ප්‍රදේශ, අඩු අවධානමක් තිබෙන ප්‍රදේශ සහ අවධානමක් නැති ප්‍රදේශ කියන ප්‍රදේශ හඳුනාගෙන වැඩි අවධානමක් තිබෙන ප්‍රදේශවලට වැඩියෙන් අපේ සම්පත් යොමු කිරීමේ කාර්යය ගැනත් සිතා බලන්නය කියලා මම ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. පරිසර අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශ තුනම එකට සම්බන්ධීකරණය කරලා කටයුතු කළොත් මේ වැඩ පිළිවෙළ මීට වඩා සාර්ථකව කරන්න පුළුවන් තැනකට අපට ගේන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. සතියකට වරක්වත් ග්‍රාමීය කමිටු රැස් කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

තවත් බරපතළ ප්‍රශ්නයක් වෙන්නේ හිස් ඉඩම්. හිස් ඉඩම්වලට මේ ඩෙංගු මදුරුවන් ඇතුළත් වුණත්, බිත්තර තිබුණත් ඒවා පාලනය කරන්න කිසිම කෙනෙක් පියවර ගන්නේ නැහැ. ඒ නිසා හිස් ඉඩම් සම්බන්ධයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. මදුරු බිත්තරයක් මාස 06 යි, මාස 12 ක කාලයක් පවතින්න පුළුවන් නිසා මේ ක්‍රියාවලිය අපි නිසියාකාරව කළේ නැත්නම් ඩෙංගු උවදුර මේ ලංකාවෙන් කවදාත් අපට ඉවත් කරන්නට, අවසන් කරන්නට බැරි තත්ත්වයකට පත් විය හැකියි. අවසාන වශයෙන් මම තව එක ඉල්ලීමක් කරනවා. පළාත් සභාවට අයත් රෝහල්වල ඩෙංගු රෝගය හැදිලා තිබෙනවාය කියලා හිතෙන රෝගීන් එනකොට භාරගන්න බාහිර අංශයේ විශේෂ ඒකකයක් පිහිටුවන්න. ඒ ඩෙංගු රෝගීන් ගැන විශේෂඥ පුහුණුවක් තිබෙන වෛද්‍යවරුන් සමඟ ඒ පිළිබඳව සොයා බලලා කටයුතු කරන්න. ගරු සභාපතිතුමනි, මම මුලින් කිව්වා වාගේ එක්සත් ජාතික පක්ෂය මේ රජයට පූර්ණව විරුද්ධ වුණත් මේ ජාතික ප්‍රශ්නයේදී අපි ඔබ සමඟ එකට අත්වැල් බැඳගෙන මේ කාර්යයට අත දෙන්න සූදානම්. ඒ නිසා මම විශ්වාස කරනවා, අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා රංජිත් සෝමවංශ මැතිතුමා ඔබතුමා හරහා මම ඉල්ලීමක් කරනවා. මා මේ කළ යෝජනා පිළිබඳව සලකා බලලා ජාතියේ නාමයෙන්, මේ රටේ ජනතාවගේ නාමයෙන්, මේ රටේ ජීවත්වන අපේ දරුවන්ගේ නාමයෙන් මේ කාරණාව පිළිබඳව උවමනාවක් ඇතිව, උනන්දුවක් ඇතිව කටයුතු කරන්න. එහෙම නැත්නම් මදුරු තුඩට අපි යට වෙන දවස ළඟයි. ඒකත් සමහර විට මහින්ද චින්තනයේ ආශ්චර්යයක් වෙන්න බැරි නැහැ. ස්තුතියි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මම මේ පළාත් සභාවට ලිඛිත ප්‍රශ්න හැටියට ප්‍රශ්න 04 ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ප්‍රශ්න හතරට අදාළව ප්‍රශ්න තුනකට ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්න හැටියට ප්‍රශ්න 06 ක් අහලා තිබෙනවා. හැබැයි, ඒ අතුරු ප්‍රශ්න 06 ට අදාළව මේ හැන්සාඩ් එකෙත් ඒක කියැවිලා නැහැ. ඒ අතුරු ප්‍රශ්නවලට අදාළව ගරු මහ ඇමැතිතුමා කල් ඉල්ලලා තිබෙනවා, අතුරු ප්‍රශ්න සම්බන්ධයෙන් උත්තර දෙන්න. නමුත් ගරු සභාපතිතුමනි, ඒ අතුරු ප්‍රශ්න මේ න්‍යාය පත්‍රයට එන්නෙත් නැහැ. සමහර ඒවා හැන්සාඩ් එකෙත් ඇත්තෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැන්සාඩ් එක බලන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, හැන්සාඩ් එකේ නැහැ. මුද්දර ශාස්තු පනතට අදාළව මම අතුරු ප්‍රශ්න වගයක් ඇහුවා. ඒකට දැන් සමහර උත්තර ලැහැස්තියි කියලත් මට කොමසාරිස්තුමා කිව්වා. නමුත් ගරු මහ ඇමැතිතුමාගෙන් ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාරයකුත් නැහැ. මේ සභාවේ ප්‍රතිචාරයකුත් නැහැ. ගරු සභාපතිතුමනි. ඒ අතුරු ප්‍රශ්නවලට මට පිළිතුරු අවශ්‍යයි. නමුත් ඒවා දැන් මේ කිසිඳු ලේඛනයක සඳහන් වෙලා නැහැ. ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලන්නම්. ගරු මන්ත්‍රීතුමා, හැබැයි හැන්සාඩ් එකේ තිබෙන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්න අහනකොට න්‍යාය පත්‍රයේ කොතැනකවත් නැහැ අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ක්‍රමයක්. ඒක තමයි වෙන්නේ. එහෙමනම් ඇමැතිවරුන්ගේ ප්‍රකාශන අවස්ථාවේදී ඒවා සභාගත කරන්න කටයුතු කරන්න වෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒක තමයි. ඒකට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එහෙමනම් ඒක කාර්යපටිපාටි රීති කාරක සභාවට යොමු කරලා රීති සංශෝධනයක් කරමු. නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.03]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, සභාව ඇමැතීම සඳහා මට අවසර ලබා දීම පිළිබඳව පළමුව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමා, ගරු මහ ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂය, අපේ මන්ත්‍රීවරුන්ගේ, මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාගෙන් අවසර ඉල්ලා සිටිනවා. පළමුව මම අවස්ථාවක් කර ගන්නවා, මට පළාත් සභාවට එන්න සහාය දුන්න සියලුම දෙනාට, අපේ ගරු පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ, පාඨලී චම්පික ගරු ඇමැතිතුමා, ඒ වාගේම උදය ගම්මන්පිල ගරු අමැතිතුමා, ජාතික සංවිධායක නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමා ඇතුළු සියලු දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා, අද දින මට මේ අවස්ථාවට එන්නට සහාය ලබා දීම ගැන.

ඒ වාගේම මම අද ඩෙංගු මර්දනය ගැන කථා කරන්නේ. 1962 වර්ෂයේ තමයි ඩෙංගු වසංගත තත්ත්වයක් පළමුවට වාර්තා වුණේ. 1970 සහ 1980 දශකයේ ඩෙංගු රෝගීන් ව්‍යාප්ත වුණා. 1996 වර්ෂයේදී ඩෙංගු රෝගය අනිවාර්යෙන්ම දැනුම් දිය යුතු රෝග ලැයිස්තුවට ඇතුළත් වුණා. ලංකාවේ 2002 වසරේදී 8931 ක් වාර්තා වුණා. 2012 වන කොට 44,456 ක් වාර්තා වී ඇති අතර 2013 වසර වන කොට 32,063 ක් වාර්තා වී තිබෙනවා. 2014 දී මේ වනකොට වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් ප්‍රමාණය 24,391 ක් වන අතර 11 දෙනෙක් මරණයට පත්ව තිබෙනවා. ඒ වාගේම ජනවාරි මාසයේ 3610 ක් සහ පෙබරවාරි මාසයේ 2011 ක්, මාර්තු 1645 ක්, අප්‍රේල් මාසයේ 1670 ක්, මැයි මාසයේ 4036 ක්, ජුනි මාසයේ 6475 ක්, ජුලි මාසයේ 4944 ක් මේ වන විට වාර්තා වී තිබෙනවා.

ඒ අතර කොළඹ දිස්ත්‍රික්කයේ 8506 කුත්, ගම්පහ දිස්ත්‍රික්කයේ 3862 ක් වාර්තා වී තිබෙනවා. ගරු සභාපතිතුමනි, මැයි, ජූනි, ජූලි මාස තුළදී ඩෙංගු රෝගීන්ගේ වර්ධනයක් පෙන්නුම් කරනවා. එයට හේතුව වන්නේ, නිරිතදිග මෝසම් වැසි කාලයයි. ඊට අමතරව ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි ඊසානදිග මෝසම් වැසි නිසා ඩෙංගු වර්ධනය පෙන්නුම් කරනවා. ඩෙංගු රෝගීන් 57.58% ක් වාර්තා වෙන්නේ බස්නාහිර පළාතේ. ඒකෙන් 25 වන සතියේ තමයි වැඩිම ඩෙංගු රෝගීන් සංඛ්‍යාව වාර්තා වෙන්නේ. ඩෙංගු රෝගය සඳහා මධ්‍යම රජයෙන් සහ ප්‍රාදේශීය සභාවෙන් විවිධ වැඩ සටහන් දියත් කරලා තිබුණත්, ඇයි අපට තවම ඩෙංගු රෝගය මර්දනය කරන්න බැරි වුණේ ගරු සභාපතිතුමනි. මෙපමණ වැඩ සටහන් කරලත්. මා හිතන විධියට, මා යෝජනා කරන විධියට ඩෙංගු රෝගය මේ වන විට මර්දනය වීමට ප්‍රධානම හේතුව නොවන්නේ, අපට තිස් වසරක යුද්ධය නිම කරන්න අපට හැකියාව ලැබුණේ, අතිගරු ජනාධිපතිතුමා වාගේම, ත්‍රිවිධ හමුදාව වාගේම මහජනතාවගේ විශාල සහයෝගයක් යුද්ධයට ලැබුණු නිසයි. මම හිතන්නේ ඒ නිසා තමයි අපට යුද්ධය අවසන් කරන්න ලැබුණේ. ඒ වාගේම මම හිතනවා, ඩෙංගු මර්දනය කරන්න රාජ්‍ය තන්ත්‍රය වාගේම මහජනතාව දැනුවත් කළ යුතු වෙනවා. ඒකට හේතුව මම මීට දවස් කීපයකට උඩදී මගේ හිත මිතුරියකට Call කළාම එයා රස්සාවට ගියේ නැත්තේ ඇයි කියලා ඇහුවාම ඇය කිව්වා, අද ඩෙංගු බලන්න එනවා. ඒ නිසා වත්ත පිටිය ශුද්ධ කරනවා කියලා. දැන් මිනිස්සු හිතන්නේ ඩෙංගු මර්දනය කිරීමත් රජයේ වැඩක් තමයි කියලයි. ඩෙංගු කියන එක ගැන ගොඩාක් හැඟීම තිබෙන්නේ ඒ විධියටයි. ඒ නිසා පිරිසිදු කරන එකක් මිනිස්සුන්ගේ හැඟීම්වලට ඇවිල්ලා තිබෙනවා. මම අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. ජනප්‍රිය පුද්ගලයන්ගේ මුවින් රූපවාහිනීවල, ගුවන් විදුලිවලත් මේ සම්බන්ධව ජනතාව දැනුවත් කළොත්, මේක අපේ වැඩක්. අපේ දරුවන් මැරෙන්නේ. අපේ මිනිස්සු මැරෙන්නේ කියන හැඟීම ඇති වන වැඩ සටහන් දියත් කළොත් බොහෝවිට ඩෙංගු මර්දනය කරන්නට හැකි වෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම අපේ සමාජයේ පර පණ නසන්න කැමැති නැති සමාජයක්. ඩෙංගු බෝ වන තැන් අපට මර්දනය කරන්න පුළුවන් නම් මම හිතන්නේ ඩෙංගු මර්දනය විශාල ප්‍රමාණයක් අපට දකින්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ගැනත් බෙහෙවින් සතුටු වෙනවා. එතුමා කිව්වා වාගේ පාසල් පද්ධතිය සහ රාජ්‍ය ආයතන වාගේම දරුවන්ට මොන්ටිසෝරි අධ්‍යාපනය ඉඳන් මම හිතන්නේ සෞඛ්‍ය ආරක්ෂාව ගැන දෙන්න ඕනෑ. ගොඩක් සෞඛ්‍ය ආරක්ෂාව ගැන අපේ සැලකිලිමත්කමක් නැති නිසා මම හිතන්නේ, රෝගී තත්ත්වයට අපේ දරුවන් ඇතුළත් වන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මොන්ටිසෝරි අධ්‍යාපනයේ සිට මම හිතන්නේ, සෞඛ්‍ය සම්බන්ධව අප දැනුවත් කළ යුතු බව මම කියනවා. ඒ වාගේම මහජනතාව සහ අපි සියලු දෙනාම එකට එකතු වෙලා, චෝදනා නොකර යෝජනා ගෙනැල්ලා මේ සමාජයේ ඩෙංගු නැති කරන්න වැඩ කරමුයි කියලා යෝජනා කරමින් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ අවස්ථාව ලබා දීම ගැන ගරු සභාපතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. සියලුම දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 12.07]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින් ඩෙංගු පමණක් නොවෙයි, පාසල් වයසේ දරුවන් බහුලව රෝග අවස්ථාවන්ට ගොදුරුවීම ගැන තමයි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මේ ඩෙංගු ගැන පමණක් නොවෙයි. ඉතින් මෙම යෝජනාවේදී අපි අවධානය යොමු කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි, මේ දීර්ඝ කාලයක් ඇති වන තත්ත්වයක් තමයි යම්කිසි රෝග නිධානයක් බවට පත් වෙන්නේ. මා මේ සභාවේ අවධානය යොමු කරනවා. දැන් මේ රජය, ආණ්ඩුව භාර අරගෙන අවුරුදු 20 ක් වාගේ කාලයක් වන කොට අපට දකින්න ලැබුණා, අපේ ප්‍රධාන ආහාරයට ගන්න සහල් නිෂ්පාදනයේදී අපි යොදා ගන්නේ බාල පොහොර බව. මේ බාල පොහොර යොදා ගත්තාම ඒ බාල පොහොරවල අතුරු ඵලයක් තමයි අවසානයේ මේ නිධන්ගත රෝග. වකුගඩු රෝග පමණක් නොවෙයි. පිළිකා පමණක් නොවෙයි. මෙම රෝග විශේෂ වශයෙන් ඇති වෙන්න හේතුව මේ බාල පොහොර පාවිච්චිය. ඒ විතරක් නොවෙයි. පසුගිය වකවානුවේ අපි දැක්කා, හැම තැනම අපට අහන්න ලැබුණා බාල බෙහෙත්. මේ බාල බෙහෙත් පාවිච්චි කළාම සමහර ඒවාවල ඉදිකටු තිබෙනවා. සමහර ඒවාවල හිස කෙස් තිබෙනවා. ඉතා අපිරිසිදු බෙහෙත් වර්ග තමයි මේ ජනතාව පාවිච්චි කළේ. මෙවැනි

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

තත්ත්වයන් නිසා තමයි මේ රෝග නිධාන මේ කාලයක ඉඳලා මේ විධියට වර්ධනය වෙලා දැන් කුඩා දරුවන්ට පවා බරපතළ රෝග තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ. මම කියන්නේ, මේක පාසල්වල කමිටුවක් පිහිටෙව්වා කියලා, එහෙම නැත්නම් සමාජය තුළ කමිටුවක් පිහිටෙව්වා කියලා මේ ප්‍රශ්නය කවදාවත් විසඳෙන්නේ නැහැ. ඉස්සෙල්ලාම මේ ආණ්ඩුවට මොළයක් තිබෙන්නට ඕනෑ, මේ ආණ්ඩුව ක්‍රියා කරන අයට යම්කිසි හැකියාවක් තිබෙන්න ඕනෑ මේ බාල පොහොරවලින්, මේ බාල බෙහෙත්වලින් ජනතාව මුදවා ගන්න . එහෙම කරන්නේ නැතිව මෙතැන ඇවිල්ලා අපි කොපමණ යෝජනා දාලා මේ රෝග තත්ත්වය නැති කරන්න කථා කළාට මේවා සිද්ධ වෙන්නේ නැහැ.

ඒ වාගේම තමයි මේ පාසල් ළමුන් හරහා මේවා කරන්න උත්සාහ කරනකොට අපේ හැම පළාතකම තිබෙනවා, පළාත් පාලන ආයතන. මේ පළාත් පාලන ආයතනවලට මේ සෞඛ්‍ය ගැටලු විසඳන්න වෙනම ආයතන තිබෙනවා. අපේ සෞඛ්‍ය නිලධාරීන් ඉන්නවා. වෛද්‍යවරු ඉන්නවා. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ඉන්නවා. අද වෙලා තිබෙන්නේ මොකක්ද? අර වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව කියන දේ තමයි වෙලා තිබෙන්නේ. මේ සෞඛ්‍ය නිලධාරීවරු ගියාම හැමතැනින්ම කොමිස් එකක් අරගෙන කාර්යාලයට වෙලා ඉන්නවා. කවදාවත් ඒගොල්ලන්ගේ සෞඛ්‍ය සේවය හරියට ඉෂ්ට කරන්නේ නැහැ. ඉතින් මේ තත්ත්වයට බෙහෙත් දෙන්නේ නැතිව මේ පුංචි ළමයින්ගේ කමිටු හදලා - මේ පාසල් වේලාව තිබෙන්නේ, ඉතාමත් බොහොම පොඩි කාලයක්. මේ කාලයත් අරගෙන සමාජ පිහිටුවලා ඩෙංගු හරි, එහෙම නැත්නම් වෙනත් රෝග නිවාරණය කරන්න ගියාට මෙය සාර්ථක වෙන්නේ නැහැ. ඒ නිසා මම ඉතා ගෞරවයෙන් සඳහන් කරනවා. මේ දේශපාලන හෙංචයියෝ රාශියක් මේ පළාත් පාලන ආයතනවලට බඳවාගෙන ඉන්නවා. මේ අය ඇවිල්ලා පොත අත්සන් කරනවා. ඇවිල්ලා වැඩ කරන්නේ නැහැ. මම පෞද්ගලිකවම දන්න රාශියක් ඉන්නවා. ඇවිල්ලා පොත අත්සන් කරනවා. වැඩ කරන්නේ නැහැ. අද නගර සභාවල, එහෙම නැත්නම් ප්‍රාදේශීය සභාවල ඒ ප්‍රාදේශීය බල සීමාවේ කාණු ටික ගිහිල්ලා පරීක්ෂා කෙරුවොත් ඩෙංගු බෝ කරන, එහෙම නැත්නම් වෙනත් නිධන්ගත රෝග බෝ කරන විෂ බීජ මධ්‍යස්ථාන බවට පත් වෙලා තිබෙනවා. එහෙමනම් ඉස්සෙල්ලාම කරන්න තිබෙන්නේ මොකක්ද? තමන්ගේ රාජ්‍ය යාන්ත්‍රණය හරියට ක්‍රියාත්මක කරන්නට පටන් ගන්නට ඕනෑ. මේක ක්‍රියාත්මක කරන්නේ නැතිව අර බෙහෙත් බඳින්න යනවා වෙන කොහෙටවත්. රෝග නිධානය තිබෙන්නේ වෙන කොහෙවත්. එහෙම තත්ත්වයක් තමයි ගරු සභාපතිතුමනි, අද තත්ත්වය.

ඒ එක්කම මම මතක් කරනවා. අපේ එක්සත් ජාතික පක්ෂය හැම වේලාවේම දුවා දරුවන්ගේ ශරීර සෞඛ්‍ය ගැන හිතලා ඉතාමත්ම ගුණාත්මක ආහාර වේලක් දෙන්න කටයුතු කළා. අද වනකොට මේ තත්ත්වය ඉතාම නරක අතට ගිහිල්ලා පාසල් ආපනශාලාවල තත්ත්වය ඉතාම නරක තත්ත්වයක් කියලා වාර්තා වෙලා තිබෙනවා. එහෙමනම් ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම අවධානය යොමු කරන්නේ, මේ හැම තැනම කොමිස් කාක්කෝ කොමිස් ගහන්න ගියාම මෙහි ප්‍රමිතිය ගිලිහිලා ගිහිල්ලා තිබෙනවා. එහෙමනම් මා විශේෂයෙන්ම තවදුරටත් මතක් කරනවා. මේ නීති, එහෙම නැත්නම් විවිධ සමාජ අලුතෙන් ඇති කරන්න ඕනෑ නැහැ. වැදගත් නීති රාමුවක් මේ රටේ තිබෙනවා. මේ නීති රාමුවට අනුගත වෙන්න මේ නිලධාරි පද්ධතියත්, මේ රාජ්‍ය යාන්ත්‍රණයත් ක්‍රියාත්මක නොකිරීම තමයි මෙයට විශාලම බාධකය වෙලා තිබෙන්නේ කියන එක මම මතක් කරනවා.

එහෙමනම් ඔබතුමා මාර්ගයෙන් මේ සියලුම ගරු ඇමැතිතුමන්ලාගේ, ඒ එක්කම පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගේ, සභාපතිවරුන්ගේ අවධානයට මම යොමු කරනවා. ඒ අයගේ ක්‍රියාන්විතය හරියට සිද්ධ වෙනවා නම් මෙවැනි රෝග රටේ බෝ වෙන්න විධියක් නැහැ. අද පාසලකට ළමයින් යන්නේ ඉගෙන ගෙන ගෙදර එන්න. අද ළමයාට වත්ත ශුද්ධ කරන්න පවරනවා. අද පොලීසියට පවරලා තිබෙනවා වෙනම ගිහිල්ලා ඩෙංගු අල්ලන්න. අද ජනතාවට දඩ ගහනවා. තැඹිලි කෝම්බයක් තිබුණත්, දෙහි ලෙල්ලක් බිමට වැටිලා තිබුණොත් දඩ ගහනවා. නමුත් මහජනයා වෙනුවෙන්, මහජනයාගේ මුදල්වලින් වැටුප් අරගෙන ඒ වගකීම පවරලා තිබෙන මිනිස්සු තමයි මේක වැඩියෙන්ම ප්‍රචාරය කරන්නේ. ප්‍රචලිත කරන්නේ. රෝග බිහි කරන්නේ. එහෙමනම්, මේ සඳහා ඔබතුමා මඟින් ඒ සියලු දෙනාගේම අවධානය යොමු කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.14]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත් හදිසි යෝජනාවක් හැටියට පසුගිය කාලය තුළම මෙය සභාවට ගෙනෙන්න එතුමා උත්සාහයක් ගත්තා. එතුමා ප්‍රකාශ කළ විධියට ඒ අතරතුර මරණත් බොහොමයක් සිදු වෙලා තිබෙනවා. ඒක නිසා ඉතාමත් වැදගත් කාරණයක් හැටියට අද මෙය සාකච්ඡාවට ගැනීම පිළිබඳව මම හිතන්නේ අපි සියලු දෙනාම ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඩෙංගු වසංගතය පිළිබඳව අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා අදහස් බොහොමයක් පළ කළා. මේ ඩෙංගු පිළිබඳව විශේෂයෙන්ම අද රජය විසිනුත්, ඒ වාගේම පාසල් තුළිනුත්, අධ්‍යාපන අමාත්‍යාංශය තුළිනුත් මම හිතන්නේ විශාල ප්‍රසිද්ධියක් දීලා තිබෙනවා. නමුත් අද වනකොටත් මේ ඩෙංගු ව්‍යාප්ත වීම වළක්වන්න හැකියාවක් ලැබිලා නැහැ. ඒක නිසා විශේෂයෙන්ම මම හිතන්නේ අපි අවධානය යොමු කරන්න ඕනෑ, මේ ඩෙංගු මදුරුවන් බෝ වන ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. ජනාකීර්ණවීමත් සමඟම විශේෂයෙන්ම බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කළුතර දිස්ත්‍රික්කයේ සංවර්ධනයත් සමඟ තමයි මේ ඩෙංගු ව්‍යාප්ත වීම ඉතාමත් සීඝ්‍රයෙන් සිදු වන්නේ.

විශේෂයෙන්ම පසුගිය පළාත් සභා වාරයේදී සාකච්ඡා කළ මාතෘකාවත් එක්ක ගත්තාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කසළ පිළිබඳ ප්‍රශ්නය තමයි ඩෙංගුවලට ප්‍රධානම ප්‍රශ්නය බවට අද පත් වෙලා තිබෙන්නේ. අපි දන්නවා, අපේ ප්‍රදේශ ගත්තාම පළාත් පාලන ආයතන විසින් ගිහිල්ලා කසළ විසික් කරලා දාන භූමිවල ආශ්‍රිතව තමයි ඩෙංගු උවදුරෙන් මිය යන කුඩා ළමයින් වැඩිම ප්‍රමාණයක් ඉන්නේ. මේ මරණ විශාල ප්‍රමාණයක් වෙලා තිබෙන්නේ ඒ ආශ්‍රිතවයි. ඒක නිසා මෙහි වගකීම විශේෂයෙන්ම ගන්න ඕනෑ, වෙන කවුරුත් නොවෙයි. මම හිතන්නේ මේ රජයත්, මේ පළාත් පාලන ආයතනත් තමයි මෙහි වගකීම ගන්න ඕනෑ. ඒක නිසා අපි එක එක්කෙනාට ඇඟිල්ල දික් කරලා වැඩක් නැහැ. මහජනතාවගේත් යුතුකම් තිබෙනවා. මම හිතන්නේ අද මහජනතාව ඉතාමත් අවබෝධයෙන් ක්‍රියා කරනවා. මහජනතාව අද ඉතාමත් අවබෝධයෙන් ක්‍රියා කරනවා. තමන්ගේ නිවස තුළ, නිවස අසළ ඩෙංගු පැතිරෙන්න අවස්ථාව ලබා නොදී, අවට පරිසරය පිරිසිදුව තබා ගන්නවා. ඒක නිසා විශේෂයෙන්ම මෙහි අවධානය යොමු විය යුත්තේ අපේ පළාත් සභාව තුළින්. අපේ ගරු ඇමැතිතුමා නැති වුණත් පළාත් පාලන ආයතන තුළින් සිදු වන පරිසර දූෂණය, ඒ වාගේම සංවර්ධන ව්‍යාපෘතිවලින් සිදුවන යම් යම් නොසැලකිලිමත් හේතූන් නිසා අද ඩෙංගු උවදුර ඉතාමත් බරපතළ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ගොඩක් නැති නිසා මම හිතන්නේ ඩෙංගු උවදුරට සම්බන්ධව කථා කරන විට ඒ මදුරු වර්ග 64 ක් හඳුනාගෙන තිබෙනවා. ඒ 64 න් 04 ක් තමයි අපේ මේ රට තුළ විශේෂයෙන් ක්‍රියාත්මක වෙන්නේ. ඉතින් ඒක නිසා මේක ඉතා විශාල දෙයක් නොවෙයි. අපේ හෙළ උරුමයේ ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ යුද්ධයක් ඉවර කරපු මේ රජයට මේ මදුරුවෝ හතර දෙනා බලාගන්න එක මහ ලොකු දෙයක් නොවෙයි. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විශ්වාස කරනවා මේ රට පුරා ක්‍රියාත්මක වන ඒ හතරට වැඩිය තව එක්කෙනෙක් ඉන්නවා. ඒ ලොකු මදුරුවා තමයි රට පුරාම පියාඹන, කුරහන් සාටකය දාගෙන ඉන්න මදුරුවා. මේ රටේ සියලුම ජනතාවගේ පොකැට්ටුවට විදිනවා. ඒක නිසා ඒ මදුරුවාත් ළඟදීම අපි මර්දනය කරනවා කියලා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

[අ.භා. 12.19]

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු මහ ඇමැතිතුමන්ට, අමාත්‍ය මණ්ඩලයට සහ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම මේ අවස්ථාවේදී ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද දවසේ දී මා මේ සභාවේ මගේ මංගල කථාව ඉදිරිපත් කරන්නේ. මට මේ අවස්ථාව ලබා ගැනීම සඳහා සහයෝගය ලබා දීපු ගම්පහ දිස්ත්‍රික්කයේ ගෞරවනීය ඡන්ද දායකයින්ව මම මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරනවා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික් අපගේ නායකතුමන් බැසිල් රාජපක්ෂ ඇමැතිතුමන් සහ විශේෂයෙන්ම මේ ගමනේදී මට සහයෝගය ලබා දුන්නු ඩලස් අලහප්පෙරුම ඇමැතිතුමාවත් ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

මා දැන් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමන් ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව මගේ අදහස් ඉදිරිපත් කරන්න සූදානම්. මම හිතන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාවේ තිබෙන එක් කොටසක් ගැන පමණයි බොහෝදෙනෙක් මේ දක්වා වැඩි අවධානයක් යොමු කළේ. ඒ ඩෙංගු රෝගය පිළිබඳව. නමුත් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමන් මේ යෝජනාවේදී - (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් බොහෝ මන්ත්‍රීවරුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේදී අදහස් යොමු වුණේ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම පිළිබඳව. නමුත් ඊට අමතරව බෝ නොවන රෝග ව්‍යාප්ත වීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමේ වැදගත්කම, අනිකුත් බෝ නොවන රෝග පිළිබඳව මා මෙහිදී වැදගත්කම විශේෂයෙන් අවධාරණය කර සිටිනවා. වර්තමානයේ පාසල් දරුවන් අතර මේ තත්ත්වය ව්‍යාප්ත වීම සඳහා හේතු වී තිබෙන මේ දරුවන්ගේ වැරැදි ජීවන පුරුදු ප්‍රධානතම කාරණාවක් බවට පත් වී තිබෙනවා. ඒ වාගේම මේ වැරැදි ජීවන පුරුදු සඳහා ප්‍රධාන හේතුවක් බවට පත් වෙලා තිබෙන්නේ, වර්තමානය වන විට පාසල් දරුවන් තුළ ක්‍රියාත්මක වන දැඩි තරගකාරී අධ්‍යාපන රටාව හේතුකොටගෙන පෞද්ගලික පන්තිවලට යාමත්, ඒ වාගේම සාමාන්‍ය ජීවිතයේදී මේ දරුවන් රූපවාහිනී යන්ත්‍රය, ඒ වාගේම පරිගණක ක්‍රීඩා වැනි දේවල්වලට යොමු වීම හරහා දරුවන් ළදරු කාලයේදී, ළමා කාලයේදී යොමු විය යුතු ක්‍රීඩා කටයුතුවලට යොමු නොවීම නිසාත් දරුවන් විශාල වශයෙන් බෝ නොවන රෝග තත්ත්වයන්ට යොමු වීමේ අවධානමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, අවම වශයෙන් විනාඩි 10 ක ව්‍යායාම කිරීමක් තිබිය යුතුයි. ඒ වාගේම පාසල් දරුවන් කුමක් හෝ ක්‍රීඩාවක නිරත විය යුතුයි කියලා යම් යම් නියාමනයන් ක්‍රියාත්මක වුණත්, පාසල් දරුවන්ගෙන් විශාල ප්‍රමාණයක් විශේෂයෙන්ම, ප්‍රතිශතයක් විධියට සඳහන් කළොත් එහෙම 10% ට වාගේ ප්‍රමාණයක්, මේ වන විට අධික ස්ථූල තාවයෙන් පෙළෙන බව සමීක්ෂණවලින් සොයාගෙන තිබෙනවා. මේකට ප්‍රධානම හේතුවක් වෙනවා, මේ Ideal Body - Mass - Index එක BMI එක. අද උදෙත් අපේ මන්ත්‍රීවරුන්ගේ Ideal Body - Mass - Index එක මේ සභාවට එන්නට පෙර පරීක්ෂා කර බැලුවා. මම හිතන්නේ මේ පිළිබඳව පාසල් දරුවන්ව දැනුවත් කිරීම ඉතාමත්ම වැදගත් වෙනවා. අපි දන්නවා, එංගලන්තය, ඇමරිකාව වාගේ දියුණු රටවල්වල මේ ශරීර ස්කන්ධ දර්ශකය නිසි පරිදි පවත්වාගෙන යන දරුවන්ට විශේෂයෙන් ලකුණු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ගරු මහ ඇමැතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් මම යෝජනා කරනවා. මේ ශරීර ස්කන්ධ දර්ශකය පවත්වාගෙන යන දරුවන් වෙනුවෙන් විශේෂ ලකුණු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපට පාසල් තුළ පුළුවන් නම් - මොකද, දියුණු රටවල්වල මෙය ක්‍රියාත්මක වන නිසා. එවැනි දෙයක් ක්‍රියාත්මක කිරීම තුළ දරුවන්ට තමන්ගේ සෞඛ්‍ය පිළිබඳව, ශාරීරික යෝග්‍යතාවය පිළිබඳව, ශාරීරික සුවතාවය පිළිබඳව දැනුවත් කිරීමක්, දැනුවත් කිරීමේ හැකියාවක් අපට ලැබෙනවා.

ඊට අමතරව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් සඳහන් කළා මේ වැරැදි ආහාර පුරුදු පළිබඳව. මම හිතන්නේ බෝ නොවන රෝග ව්‍යාප්ත වීම සඳහා. එයත් ඉතාමත්ම බරපතළ ගැටලුවක් බවට පාසල් දරුවන් අතර පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිටි සහිත ආහාර, තෙල් සහිත ආහාර සහ සීනි සහිත ආහාර පාසල් ආපනශාලා තුළ තවමත් තිබෙනවා. ඒක නිසා ආපනශාලා ප්‍රතිපත්තිය ඉතාමත් දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මා මෙහිදී අවධාරණය කරන අතරම, විශේෂයෙන්ම විද්‍යුත් ජනමාධ්‍ය ඔස්සේ වෙළඳ ප්‍රචාරණය හරහා වැරැදි ආහාර පුරුදු ළමයින් අතරට යාම වැළැක්වීම

සඳහා ඒ පිළිබඳව විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්ම කිරීමට අදාළ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන්නේ නම් එය ඉතාමත් වැදගත් බවත් මම මෙහිදී අවධාරණය කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මා මෙහිදී සඳහන් කරන්නට කැමැතියි. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනාවේදී සඳහන් කර තිබුණා, අධ්‍යාපන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව පාසල් තුළ සෞඛ්‍ය සමාජ පිහිටුවීම පිළිබඳව. මම මෙහිදී අවධාරණයට ලක් කරනවා. පාසලට දරුවන් ඇතුළත් කරන අවස්ථාවේදී ඒ දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳව වාර්තාවක් දෙමාපියන්ට ඉදිරිපත් කරන්නට කියලා යම්කිසි නියෝගයක් කරන්නට පුළුවන් නම්, පෝෂණ තත්ත්වය පිළිබඳව අපට වාර්තාවක් ගන්න පුළුවන් නම්, මේ සායනික වාර්තාව ලබා ගැනීම තුළින් සෑම වාරයකදීම මෙය යාවත් කාලීන කිරීම හරහා පාසල් දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව නිරන්තර අවධානයක් දෙමාපියන් යොමු කරනවා. එතුමන් සඳහන් කරපු ඒ සෞඛ්‍ය සමාජ පිහිටුවන්නට පුළුවන් නම් ඒ සෞඛ්‍ය සමාජ හරහා ඒක අපට කරන්නට පුළුවන්. ඒ වාගේම මෙය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අපි දන්නවා, වයඹ විශ්ව විද්‍යාලය වාගේ විශ්ව විද්‍යාලවල පෝෂණවේදී වාගේ උපාධි තිබෙනවා. ඒ උපාධි හදාරන උපාධිධාරීන්ව මේවා ප්‍රායෝගිකව ක්‍රියාත්ම කිරීම සඳහා අපට යොදා ගැනීමේ හැකියාව තිබෙනවා.

ඒ වාගේම තමයි තුන්වැනි කාරණාව ලෙස දරුවන් මෙවැනි ගැටලුවලට යොමු වෙන්න ඔවුන් තුළ තිබෙන මානසික ආතතියත් බලපානවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලයේ අපට අහන්න ලැබුණා, විවිධ සරල හේතුන්මත පාසල් දරුවන් සියදිවි නසා ගන්නා අවස්ථා. මේකට ප්‍රධානම හේතුවක් වී තිබෙනවා, පාසල් දරුවන්ට තමන්ගේ මානසික ආතතිය දරා ගැනීම උදෙසා නිසි පුහුණුවක් නොමැතිකම. ඒක නිසා සෞඛ්‍ය විෂයය පාසල් තුළ මීට වඩා වැඩි අවධානයක් යොමු කරමින් ඒ වාගේම මානසික ආතතිය දරා ගැනීම සඳහා relaxation exercise, එහෙම නැත්නම් මානසික ආතතිය අවම කිරීමේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම ආදිය තුළින් පාසල් දරුවන්ව වඩාත් යහපත් සෞඛ්‍ය තත්ත්වයකට යොමු කර ගැනීමේ හැකියාව තිබෙනවා. මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමා, යෝජනා කරපු ඒ සමිති හෝ සමාජ හරහා එවැනි කටයුත්තක් අපට කිරීමේ හැකියාවක් තිබෙනවා.

මම ඩෙංගු රෝගය ගැන විශේෂයෙන් සඳහන් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එය විස්තරාත්මකව ගරු ශ්‍රීනාත් ම. පෙරේරා ජ්‍යෙෂ්ට නීතිඥතුමාත්, ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීතුමියත් ඒ පිළිබඳව සඳහන් කරපු නිසා. නමුත් මම කනගාටු වෙනවා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය මේ බාල පොහොර, බාල බෙහෙත් කියලා මේ ප්‍රශ්නය එක කාරණාවකට ලඝු කරන්නට උත්සාහ කළා. බාල පොහොර කියන්නේ මොනවාද? බාල බෙහෙත් කියන්නේ මොනවාද? ඒවා පිළිබඳව ගැටලු තිබෙනවා නම් ඒවා වෙන වෙනම විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. නමුත් සමස්ත පොහොර, සමස්ත බෙහෙත් කියන දේ එක තැනකට එක් කරලා, ඒ නිසා මේ රෝග ව්‍යාප්ත වෙනවා කියලා ඇය පෙන්වා දෙන්න උත්සාහ කළා. මම ඒකට දැඩි ලෙස මාගේ අප්‍රසාදය පළ කරන අතරම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා හිතන්නේ මහජන නියෝජිතයින් වශයෙන් අපේ වගකීම වෙන්නේ, මෙවැනි ව්‍යාප්ත වන අර්බුදකාරී තත්ත්වයක් සඳහා සමාජයක් විධියට මුළු සමාජයම එකතු කර ගැනීමයි. ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා පැහැදිලිව සඳහන් කළා. මෙවැනි ව්‍යාපෘතියක් සඳහා විපක්ෂය වුණත් සහයෝගය ලබා දෙනවා කියලා. මොකද, මේක ජාතික ප්‍රශ්නයක්. මේ සඳහා මහජන මන්ත්‍රීවරුන්, රජයේ නිලධාරීන් පමණක් නොවෙයි ක්‍රියාත්මක විය යුත්තේ. මෙවැනි කටයුත්තක් පිළිබඳව, මෙවැනි අර්බුදයක් පිළිබඳව ලෝකයේ කොයි තැනක ප්‍රශ්නයක් ආවත් සමස්ත ජනතාවටම ඒ පිළිබඳව වගකීමක් තිබෙනවා. මහජන නියෝජිතයින් විධියට අපේ වගකීම වෙන්නේ, ජනතාවට ඒ සඳහා නායකත්වය ලබා දෙමින් ඒ සඳහා නිසි ගමනක් යාම තුළිනි. එවැනි ගමනක් යාම සඳහා රජයට හෝ බලධාරීන්ට පමණක් ඇඟිල්ල දික් කරන්නේ නැතිව ඒ සඳහා සියලුදෙනාම එකතු කරගෙන කිසියම් විධිමත් වැඩ පිළිවෙළක් සඳහා ජනතාව යොමු කිරීමේ වගකීම පක්ෂ විපක්ෂ මහජන නියෝජිතයින් වන අප සියලු දෙනාටම තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමන් හරහා මම මෙහිදී සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ඒ තමයි මහජන නියෝජිතයින්ට මෙවැනි වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කිසියම් සහයෝගයක් දෙනවා නම්, විශේෂයෙන්ම අමාත්‍යාංශ සහ අමාත්‍යාංශ නිලධාරීන් ඇරුණු කොට සාමාන්‍ය මන්ත්‍රීවරුන්ට තම තමන්ගේ ප්‍රදේශවල මෙවැනි ව්‍යාපෘතීන්

[ ගරු සුසාර දිනාල්]

ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කිසියම් ශක්තියක් ලබා දෙනවා නම්, උපකරණ, ඒ වාගේම පිරිස් බලය, ඒ අදාළ යන්ත්‍රසූත්‍ර ලබා දෙනවා නම් මන්ත්‍රීවරුන්ට හැකි වෙනවා තමන්ගේ ප්‍රදේශවල මේ පිළිබඳව ක්‍රියාත්මක වෙලා කටයුතු කරන්නට. එසේ නොමැතිව ගරු මන්ත්‍රීතුමිය එක වරක් සඳහන් කළා, පළාත් පාලන ආයතනවල සමහර අය උදේට පොත අත්සන් කරලා වැඩ කරන්නේ නැහැයි කියලා. එවැනි සිදුවීම් වාර්තා වෙනවා නම් ඒවා පිළිබඳව ගරු ඇමැතිතුමාට වාර්තා කරන්න පුළුවන්. නමුත් මේක මෙවැනි බරපතළ කාරණාවක් පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවක එවැනි සරල කරුණකට මෙය ලඝු කිරීම පිළිබඳව මම කනගාටුවට පත් වෙනවා.

මම අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාවේ අවධාරණය කර සිටින්නේ, අපි මේ පළාත් සභාව තුළ තේරුම්ගත යුතු යථාර්ථය තමයි මේ රටේ වටිනාම සම්පත වන බාල පරපුර පිළිබඳ වගකීම, බස්නාහිර පළාතේ බාල පරපුර පිළිබඳ වගකීම මේ සභාවට තිබෙනවා. ඒක නිසා අපේ දරුවන් පිළිබඳ වගකීම, අපේ රටේ අනාගතය පිළිබඳ වගකීමයි. ඒක නිසා ඒ දරුවන් පිළිබඳව ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව වඩාත් අවධානයකින්, පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරමින්, ඒ වාගේම හැකියාවක් තිබේ නම් බස්නාහිර පළාතේ පෝෂණ ප්‍රතිපත්තියක්, එහෙම නැත්නම් පෝෂණ ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කරලා මේ තත්ත්වය ඉදිරියට ගෙන යන්න ආරාධනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව නැවත වාරයක් මා ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.26]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඉංග්‍රීසියේ කියමනක් තිබෙනවා the messenger is just as important as the message කියලා. පණිවිඩය වාගේම පණිවිඩකරුවාත් වැදගත්ය කියලා. අපේ ගම්මන්පිල ඇමතිතුමා එහෙම, මෙය නිතර භාවිතා කරනවා. මම කථාව පටන් ගන්න හිටියේ ඇත්තටම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගෙන්. ලංකාවේ සමාජ පරිවර්තනයක් කරන්න කටයුතු කරපු අපි කවුරුත් ගරු කරන දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහත්තයා ආරම්භ කරපු ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ මේ පළාත් සභාව නියෝජනය කරන වර්තමාන සාමාජිකයෙක් වන එතුමා ඉදිරිපත් කරලා තිබෙනවා, යෝජනාවක්. එතුමා කියනවා, මේ සෞඛ්‍ය ප්‍රශ්නවලට බලපාන ප්‍රධාන හේතුව, අයහපත් සෞඛ්‍ය පුරුදු සහ චර්යා පද්ධතීන්වල තිබෙන අසාමාන්‍ය වූ වෙනස්කමය කියලා. දැන් ජනතාව පිට වරද පටවලා, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මත සහ සමස්ත ජනතාව මත වරද පටවලා, ආණ්ඩුව මේ සෞඛ්‍ය කඩා වැටීමේ පිරිහීමෙන් අත සෝදා ගන්න, ගැලවෙන්න පොටක් පාදා ගන්න එතුමා බෙල්ල තියලා තිබෙනවා. ඇත්තටම වමේ දේශපාලනයටත්, කොමියුනිස්ට් පක්ෂයේ ඉතිරි වෙලා තිබෙන මොකක් හරි දේශපාලනයටත් ලැජ්ජයි. ඒ වාගේම එතුමා ගැන වැඩිදුර කථා කරන්න අවශ්‍ය නැහැ.

2010 මාර්තු මාසයේ ආණ්ඩුවේ ලේක්හවුස් පත්තරේට, දිනමිණ පත්තරේට සම්මුඛ සාකච්ඡාවක් දීලා, එවකට සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කියනවා, මෙහෙම. "කොටියා මරපු අපට ඩෙංගු මදුරුවා කජ්ජක්ද?" නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය මතක තියා ගන්න. කොටියා මරපු අපට ඩෙංගු මදුරුවා කජ්ජක් ද කියලා තමයි එතුමා ඇහුවේ. ඒක හරි සිම්පල් වාගේ තමයි හිතාගෙන හිටියේ. දැන් ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා. නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය කිව්වා, යුද්ධය අවසන් කරන්න ජනතාව සහාය දුන්නා. හැබැයි, දැන් මේකට සහාය දෙන්නේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය කියලා. ඇත්තටම ගරු මන්ත්‍රීතුමිය, යුද්ධය අවසන් කළේ ජනතාව නොවෙයි. යුද්ධය අවසන් කළේ, මේ රටේ ත්‍රිවිධ හමුදාපතිවරු නොවෙයි නේ? යුද්ධය අවසන් කළේ කවුද? අර පැත්තෙන් එනවා, වේලුපිල්ලේ ප්‍රභාකරන්. මේ පැත්තෙන් එනවා, ගෝඨාභය නන්දසේන රාජපක්ෂ. දෙන්නා අතර තිබුණා, ද්වන්ද සටනක්. Face to face. මුහුණ - මුහුණ සටනක්. ඒ සටනෙන් තමයි අවසානයේ ජයග්‍රහනය සිදු වුණේ. නේද? ජනතාව, ත්‍රිවිධ හමුදාපතිවරු කරපු දෙයක් නැහැ. ඒක නේ අවසානයේ පොතක් විධියට එළියට එන්නේ Gota's War කියලා. ගෝඨාගේ යුද්ධය. ජනතාවගේ යුද්ධයක් නොවෙයි. හමුදාවේ යුද්ධයක් නොවෙයි. Gota's War. ගෝඨාගේ යුද්ධය. දැන් තේරෙනවා නේද යුද්ධය කළේ එයා විතරක් නොවෙයි කියලා. දැන් මේ ඩෙංගු මර්දනය කර ගන්න බැරි වුණු

ආණ්ඩුවක්. දැන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා යෝජනා කරනවා, පාසල්වල සෞඛ්‍ය කමිටු හදන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පුංචි ළමයින්ගෙන් වැඩේ පටන් ගන්න ඕනෑ නැහැ. ලොක්කෝ වැඩේ පටන් ගත්තේ 2010 දී. මොකක්ද? ජනාධිපති කාර්ය සාධක බලකායයක් හැදුවා. මතකද? ලොකු උත්සවයක් තියලා. 2010 අගෝස්තු මාසේ පටන් ගත්තා. රටේ අමාත්‍යාංශ සියල්ල ඒකාබද්ධ කරලා ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ඩෙංගු මර්දනය කරන්නය කියලා ජනාධිපති කාර්ය සාධක බලකායක් හැදුවා. අද මොකද වෙලා තිබෙන්නේ? මේ අවුරුද්දේ මාස හතක් ගත වන කොට ඩෙංගු රෝගීන් 24,391 යි. 57.56% ක් වාර්තා වෙන්නේ, බස්නාහිර පළාතෙන්. මර්දනය කරලාද? මම ඩෙංගු ගැන වැඩිපුර කථා කරන්නේ නැහැ. සංඛ්‍යා ලේඛන මෙතුමා කිව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි, දැන් සෞඛ්‍ය පද්ධතියේ කඩා වැටීම. මේක ඇත්තටම කියන්න කනගාටුයි. අපේ රටේ පාසල් දරුවන් අතර තිබෙන සෞඛ්‍ය රෝග පිළිබඳව, මානසික හෝ ශාරීරික රෝග පිළිබඳව විධිමත් පර්යේෂණ කරලා නැහැ. මේ වන කොට පාසල් ශිෂ්‍යයන් අතර රක්තහීනතාවය 30% යි. ළමා මන්දපෝෂණය 30% යි. දත් රෝග 40% ක් තිබෙනවා. අපි හිතනවා, මේ සංඛ්‍යා ලේඛන නිවැරදිත් නැහැයි කියලා. මීට වඩා වැඩි වෙන්න ඕනෑ. හරිහමන් පර්යේෂණ කරලාවත් නැහැ. අඩු තරමේ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකවත් කර ගන්න ඕනෑ. දැන් මේකට වරද විධියට, ප්‍රශ්නය විධියට තිබෙන්නේ ළමයින්ගේ නොදැනුවත්කම හෝ ළමයින්ගේ වගකීම් විරහිතකම අරගෙන වැඩක් නැහැ. අර ආඳා යවා තබාලා වල්පත ගත්තාට වැඩක් නැහැ. පය බරවායට පිටිකර බෙහෙත් බැඳලා වැඩක් නැහැ. ඇමති යවන්න ඕනෑ තැනට - දැන් එහෙම නේ? ඒවාට නම් සද්ධර්ම රත්නාවලිය ලියන කාලයේ ධර්මසේන හාමුදුරුවෝ පරණ උදාහරණයට ගත්තේ, "ආඳා යවා තබාලා වල්පත ගත්තා සේ" කියලා. දැන් අලුත් එකක් තියෙනවා. මොකක්ද? විමල් ඉතාලි යවා තබාලා ශෂී සීෂෙල්ස් ගෙනිච්චා වාගේ. ඇමති යවන්න ඕනෑ තැනට ඇමතිගේ නෝනා යවලා තිබෙන්නේ. ඒ වාගේ වැඩක් මේ. කරන්න ඕනෑ වැඩේ නොවෙයි. කරන්න ඕනෑ තැනට පුද්ගලයෝ දාන්නේ නැහැ. ඇමති යවන්න ඕනෑ තැනට ඇමතිගේ නෝනා අරන් යනවා වාගේ වැඩ. ඒ වාගේ වැඩක් තමයි මේ කරලා තිබෙන්නේ. හරි නම් දැන් අමාත්‍යාංශ ඔක්කොම ටික එකතු කරලා, කරන්න ඕනෑ දේ - ප්‍රශ්නේ තිබෙන්නේ, දැන් මෙතුමා කියනවා නේ? මම අහගෙන අපේ සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාත් කියනවා. දරුවන් ක්‍රීඩා කටයුතුවලට යොමු වෙලා නැහැ. ඒක නිසා තමයි ප්‍රශ්නේ තිබෙන්නේ කියලා. දැන් ඔබතුමා මේ බස්නාහිර පළාත් සභාවට සෞඛ්‍ය සමාජ හදන්න යෝජනා කරන වෙලාවේ මම හිතන්නේ, මේ දරුවෝ ක්‍රීඩා කටයුතුවලට යොමු වෙන්නේ නැති නිසා තමයි. ඒ වාගේම මේ relaxation exercise අඩු නිසා වෙන්න ඇති.

දැන් මේ කොළඹ පාසල්වලට අලුතෙන් පටන් අරන් තිබෙනවා නේද? කාල්ටන් සමාජ හදන්න. දැන් ඇතුළට පැනලා කාල්ටන් ක්‍රීඩා සමාජයේ ප්‍රමෝෂන් එක පටන් අරන් තිබෙනවා නේ? අර පසුගිය තිස් එක් වැනිදා සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ශිෂ්‍ය නායිකාවෝ ගහලා එලෙව්වේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඩී.එස්. සේනානායක විද්‍යාලයට, විසාකා විද්‍යාලයට පැනලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ගායකයෝ, අර දරුවන්ගේ relaxation එකට, ඒගොල්ලෝ exercise කරන්න වැඩ පිළිවෙළක් කළා නේද? මම හිතන්නේ ඒකත් මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය සහිතවද දන්නේ නැහැ කළේ කියලා. (බාධා කිරීමක්) ඩෙංගු? ඩෙංගු නොවෙයි. දැන් මේ පාසල් පද්ධතිය තුළ ඇති වෙලා තිබෙන බරපතළ ප්‍රශ්නය, සෞඛ්‍ය ප්‍රශ්නය වන්නේ, කුඩු සම්බන්ධ ප්‍රශ්නයයි. මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයයි. දැන් මේවාට - (බාධා කිරීමක්)

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මාතෘකාවට පිටින් යන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඉන්න කියන්න. ඒවා මාතෘකාවට අදාළයි. ඔබතුමා කැ ගැහුවාට කැමැතියි. ඒක තමයි සභා නායකතුමාගේ වැඩේ.

[ ගරු නලින්ද ජයතිස්ස]

ඒ නිසා දැන් මේ තිබෙන ප්‍රශ්නවලට සෞඛ්‍ය සමාජ හදලා වැඩක් නැහැ. ඇත්තටම මම කනගාටු වෙන්නේ ඒකයි, මේ යෝජනාව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු එක ගැන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන කෙනෙක් ගෙනාවා නම් අපට දුකක් නැහැ. අඩු තරමේ මේක මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට ගේන්න සලස්වපු එක ගැන කනගාටුයි. තවමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක්ද කියලා අහන්න ඕනෑ. මේක ගෙනාවාට පස්සේ. දැන් නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නලින්ද වෙන කෙනෙක් ගෙනාවා නම් ඔහොම කථා කරන්නේ නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

දැන් ඇත්තටම ඩෙංගු මර්දනයට ආණ්ඩුව වැඩ පිළිවෙළක් ගේනවා නම් - අපි හිතන්නේ නැහැ වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා. BTT ගේනවා කියලා කියනවා. විවිධ මර්දන සති ක්‍රියාත්මක කරනවා. හැබැයි, ඩෙංගු මර්දනය වෙලා නැහැ. ඒකට ඉහළ සිට පහළට වැඩ පිළිවෙළක් ඕනෑ. පහළ සෞඛ්‍ය සමාජ හදලා හෝ ජනතාවට දඩ ගහලා මේ ඩෙංගු ආණ්ඩුවේ ආදායම් මාර්ගයක් කර ගෙන ඩෙංගු මර්දනය කරන්න බැහැ. ඒකට වැඩ පිළිවෙළක් ගේන්න. මෙතුමා කිව්වා වාගේ අපි ඔක්කොම සහාය දෙන්න සූදානම්. ප්‍රශ්නය තියෙන්නේ ඒකට නායකත්වයක් නැතිව ඒක කරන්න බැහැ. ඒ නිසා දැන් තිබෙන්නේ, රටේ ඇත්ත ප්‍රශ්න ටික හඳුනාගෙන, විශේෂයෙන් මේ සෞඛ්‍ය කඩා වැටීම. සෞඛ්‍යයට වෙන් කරන ප්‍රතිපාදන 1.3% දක්වා අඩු කළාට පස්සේ, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, කොහොමද සෞඛ්‍ය හදන්නේ? ඔබතුමන්ලා සටන් කරන්න ඕනෑ ආණ්ඩුව ඇතුළේ ඉඳලා ඒකට. 1.3% යි දළ දේශීය නිෂ්පාදිතයෙන් සෞඛ්‍යයට වෙන් කරන්නේ. ඉතින් කොහොමද සෞඛ්‍ය හදන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය අර පහත් තැනින් ජලය ගලා යාමට සලස්වලා අත හෝදා ගන්න ලැහැස්ති වෙන්න එපා. ප්‍රශ්නය හරියට තේරුම් ගන්න. මේකට ප්‍රශ්නය වී තිබෙන්නේ, ආණ්ඩුවේ සෞඛ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයක්. මේකේ තිබෙන්නේ, මුදල් වෙන් නොකිරීම පිළිබඳ ප්‍රශ්නයක්. මේකේ තිබෙන්නේ, ප්‍රමුඛතාවය නොදීම පිළිබඳ ප්‍රශ්නයක්. ඒ පිළිබඳව අවධානය යොමු කරන්නය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.35]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින පළාත් සභාවේ මගේ මංගල කථාව කරන මේ මොහොතේදී මම කෘතවේදීව මගේ සහෝදරයාව මුලින්ම මතක් කරන්න කැමැතියි. මගේ සහෝදරයා IV වන පළාත් සභාව නියෝජනය කරලා, ඝාතනයට ලක් වුණු නිසා තමයි මට පළාත් සභාවට එන්න සිද්ධ වුණේ. එතුමා නිසා මම ජීවිතයේ බොහෝ පින් කර ගන්නවා. ඒ නිසා මම කෘතවේදීව මගේ සහෝදරයාව පළමුවෙන්ම මතක් කරනවා. ඒ එක්කම VI වන පළාත් සභාවට එන්න මට ශක්තිය ලබා දුන්න අතිගරු ජනාධිපතිතුමාව. ඒ වාගේම අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ නායක බැසිල් රාජපක්ෂ මැතිතුමාව. ඒ වාගේම දින 20 ක් මම අසනීප වෙලා රෝහල්ගත වෙලා ඉන්න වෙලාවේදී ඒ හා සමානව ඊටත් වැඩිය මම ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම මීරිගම ප්‍රමුඛ ගම්පහ දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයන් සියලු දෙනාටම. පහුගිය පළාත් සභාවේ දොළොස්වැනියාට වාඩි ගත්ත මම, මැතිවරණ කාල සීමාව තුළ දවස් 20 ක් ඇඳක ඉඳලා හත් වැනියාට වාඩි කරපු ඒ සියලු දෙනාට මගේ ගෞරවය ස්තුතිය, කෘතඥතාවය පුද කරනවා. ඒ කෘතඥතාවය පුද කරන ගමන්ම මේ බෝ නොවන රෝග කියන්නේ මගේ ජීවිතයේ එක කොටසක් වාගේ. මොකද, මගේ ජීවිතයේ අම්මා කෙනෙක් වුණාට පස්සේ මම කල්පනා කළා, මගේ දරුවාට හොඳම දේවල් දෙන්නේ කොහොමද කියලා. ඒවා ඉගෙන ගන්න කොට මම දැක්ක දේ තමයි, ප්‍රධානම කාරණාව තමයි අද රට තුළ තිබෙන සහ මේ ලෝකයේ තිබෙන ප්‍රධානම ප්‍රශ්නවලින් එකක් තමයි මේ බෝ නොවන රෝග. මම පළමුවැනි යෝජනාව කරනවා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමා ඉස්සෙල්ලාම මම හිතන්නේ, අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාත්, ඒ වාගේම ප්‍රධාන අමාත්‍යතුමාත් එකතු කර ගෙන අපට, මන්ත්‍රීතුමන්ලාට මේ බෝ නොවන රෝග පිළිබඳව දැනුමක් ලබා දෙන වැඩ මුළුවක් තියන්න. මට බොහොම කනගාටු දැණුන දෙයක් තමයි ප්‍රධාන කාරණාව තියෙද්දී බොහෝ අය මේ මාතෘකාව ගැන කථා කළේ දේශපාලන වාසි ගන්න කටයුතු කිරීමයි.

සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා විතරයි මේක ගැන ටිකක් අවබෝධයෙන් කථා බහක් කරනවා මම දැක්කේ. ඒ නිසා බෝ නොවන රෝග කියලා කියන්නේ, අද රටේ තිබෙන ලොකුම ප්‍රශ්නයක්. බෝ නොවන රෝග කියන්නේ මොනවාද? පිළිකා, දියවැඩියාව, අධික රුධිර පීඩනය, කොලොස්ටරෝල්. එදා සමාජය තුළ අපි දැක්කේ නැහැ මේ රෝගවලට ගොදුරු වෙනවා. අපි පුංචි කාලේ අහලා තිබුණේ නැහැ, අපේ දරුවෝ පිළිකාවලින් මැරෙනවා කියලා. අපි පුංචි කාලේ අහලා තිබුණේ නැහැ, අපේ දරුවෝ දියවැඩියා රෝගයට මුහුණ දෙනවා කියලා. අද රිජ්වේ ආර්යා රෝහලේ පුංචි දරුවන්ට ළමා වාට්ටුවක් දියවැඩියාවට ඉදි වෙලා තිබෙනවා. අපි ආඩම්බර වෙන්න ඕනෑ කාරණාවක් නොවෙයි මේක. අපි මන්ත්‍රීවරු හැටියට දුක් වෙන්න ඕනෑ, කාරණාවක්. උපහාසයට ලක් කරන්න ඕනෑ කාරණාවක් ගැන නොවෙයි අපි මේ කථා කරන්නේ. අපි මේ කථා කරන්නේ, අපේ දරුවන්ගේ අනාගතය ගැන. ඒ හින්දා අපි හැමෝටම ලොකු වගකීමක් තිබෙනවා ඉෂ්ට කරන්න. ඒ නිසා අපි හැම කෙනෙක්ම ඒ වගකීම ඉෂ්ට කරන්න එකතු වෙන්න ඕනෑ. ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා, නීතීඥතුමා පටන් ගන්න කොටම මම හිතුවා හොඳ කථාවක අවසානයක් දකින්න ලැබෙයි කියලා. හැබැයි, ඒකේ අවසානය සාර්ථක අවසානයක් නොවෙයි. ඩෙංගුවලට වඩා මේ රටේ ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ මේ බෝ නොවන රෝග ගැන. අද මේ පාසල් සමාජ අත්‍යවශ්‍ය දෙයක් වෙලා තිබෙනවා. බෝ නොවන රෝග හැදෙන්නේ කොහොමද? අපේ තිබෙන යහපත් නැති, අයහපත් සෞඛ්‍ය පුරුදු නිසා. අපි ගන්න ආහාර රටාව නිසා. අපි ජීවත් වන ක්‍රමවේදය නිසා. අපි මේක අපේ දරුවන්ට, පාසල් සමාජයකටවත් කියලා දුන්නේ නැත්නම් මේ දරුවෝ මේ ගැන අවබෝධ කර ගන්නේ නැහැ. ඒ දරුවන්ට මේ ගැන තේරුමක් එන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා මේ සඳහා 2005 දී වැඩ පිළිවෙළක් ගෙනාවා. ඒ තමයි, පාසල් තුළට දරුවන්ට පෝෂණය සඳහා තමන්ගේ කෑම එක ගෙනියන කොට ධාන්‍ය වර්ග වැඩිපුර යොමු කරන්න කියන වැඩ පිළිවෙළ. ඒ වාගේම ඒ අය තමන්ගේ ආහාර ටික පාවිච්චි කරන කොට නිවැරදි ආහාර ක්‍රමයකට දරුවන්ව යොමු කරන්න කියන වැඩ පිළිවෙළ. ඒ නිසා මම විශ්වාස කරනවා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මිළ වැඩියි. ගන්න බැහැ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ මෝඩ ප්‍රශ්නවලට උත්තර දෙන්න වෙලාවක් නැහැ. මේක වැදගත් දෙයක්. අපේ දරුවෝ වෙනුවෙන් -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මෙතුමියගේ ඥානවන්තකම බලන්න. හරියට කියවලා නැහැ යෝජනාව. යෝජනාව කියවන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මම කථා කරන්නේ, යෝජනාව ගැන තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම විශ්වාස කරනවා අපි සියලු දෙනාම එකතු වෙලා මේ සඳහා හොඳ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ සකස් කරන්න නම් අපේ දරුවන් ගැන ආදරය තිබෙන, හැඟීමක් තිබෙන පිරිසක් එකතු වෙන්න ඕනෑ. විශේෂයෙන්ම දරුවෙකුගේ දුක දැනෙන්නේ, අම්මා කෙනෙකුට. දරුවෙක් අසනීප වන කොට ඒ දරුවාගේ හැඟීම දැනෙන්නේ අම්මා කෙනෙක්ට. ඒ දුක වේදනාව විඳින්නේ අම්මා කෙනෙක්. තාත්තා කෙනෙක්. ඒ නිසා මේ පාසල් සමාජ පිහිටුවීම අත්‍යවශ්‍ය කාරණාවක් හැටියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දකිනවා. අපි හොඳ වෛද්‍යවරු පිරිසක් අපට එකතු කර ගෙන, ගම්මානවලට ගිහිල්ලා, පාසල්වලට ගිහිල්ලා, මේ අය දැනුවත් කරන වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරන්න ඕනෑ. BMI එක කියන එක අද අත්‍යවශ්‍ය දෙයක්. මගේ BMI එක වැඩි වුණාට. මම හිතනවා අද අත්‍යවශ්‍ය දෙයක්. අපි දකිනවා, දරුවෙකුට දුවන්න බැහැ. හති දානවා. සමහර වෙලාවට අපි දැකලා තිබෙනවා, මැරිලා වැටෙන අවස්ථාවන්. ඒ නිසා මේ වැඩ පිළිවෙළවල් තුළට අපි සියලු දෙනාම එකතු වෙලා, මේ පෝෂණය ගැන, යහපත් පුරුදු ගැන මේ දරුවන් විතරක් නොවෙයි, දෙමව්පියන්වත් දැනුවත් කරන්න ඕනෑ. අද මේක රට තුළ අත්‍යවශ්‍ය කාරණාවක්. ඩෙංගුවලින් සිදු වන මරණ සංඛ්‍යාව දිහා බලන කොට මම ඒක අවතක්සේරුවට ලක් කරනවා නොවෙයි. හැබැයි, මේ රට තුළ වැඩිම මරණ සංඛ්‍යාවක් සිද්ධ වෙන්නේ, මේ බෝ නොවන රෝගවලින්. කිසි කෙනෙකුගේ අවධානය මේ ගැන යොමු වෙන්නේ නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේ වැඩ සටහන මේකට ගෙනාපු එක ගැන.

[ ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන]

මේක ඉස්සරහාට ක්‍රියාත්මක කරන, විශේෂයෙන්ම මේකට සෞඛ්‍ය ඇමතිතුමා, ප්‍රධාන ඇමතිතුමා විතරක් නොවෙයි. එකතු කර ගන්න අපේ කෘෂිකර්ම ඇමතිතුමාවත්. මොකද, එතුමාගේ අමාත්‍යාංශය හරහාත් මේ සඳහා විශාල වැඩ පිළිවෙළක් තිබෙනවා. එතුමාගේ අමාත්‍යාංශය හරහා විශාල වැඩ කොටසක්, මේ සඳහා ලොකු දායකත්වයක් ලබා දෙන්න තිබෙනවා. අපි රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කථා කළා බාල පොහොර ගැන.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සෞඛ්‍ය ඇමතිවරු කී දෙනෙක් ඉන්නවාද? මේ රෝග ඇති වෙන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එතුමිය කථා කළා බාල පොහොර ගැන. බාල බෙහෙත් ගැන. මේවා නිකම් අර විහිළු කථා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝක්ස්.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ජෝක්ස් නොවෙයි. මේකට මට කියන්න දේවල් නැහැ. ඒ එක්කම රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම ගැන කථා කරනවා. අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට මම හිතුවා, හොඳ කථාවක් කථා කරයි කියලා. එතුමා කථා කරලා නතර කළෙත් ඩෙංගු ගැන විතරයි. ඒ නිසා රාජ්‍ය යාන්ත්‍රණයක් හදන්න ඕනෑ, විශේෂයෙන්ම මේ බෝ නොවන රෝග ගැන. මේක රජයේ වගකීම නොවෙයි. මේ බෝ නොවන රෝග වළක්වා ගැනීම දෙමව්පියන්ගේ වගකීම. දරුවන්ගේ වගකීම. ඒ අයගේ වගකීම අපි හඳුන්වලා දීලා ඒ අයට පැහැදිලි කරලා දෙන්න ඕනෑ, තමන්ගේ ජීවන තත්ත්වය ඉහළට ගෙන යන්න ඔබගෙන් කෙරෙන්න තිබෙන කාර්යය මොකක්ද කියලා. ඒ නිසා මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න සුදුසුම වැඩ සටහනක් බැවින්, කඩිනමින් මේ පළාත් සභාවේ එය ක්‍රියාත්මක කරන්න පටන් ගනිමුයි කියන කාරණාවත් මතක් කරමින් සියලු දෙනාටම බොහොම ස්තුතියි.

[අ.භා. 12.44]

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ ගෙනාපු යෝජනාව අතිශයින්ම කාලීන යෝජනාවක් වාගේම, මීට පෙර සිටම වරින් වර සාකච්ඡාවට ලක් වුණු යෝජනාවක්. අපේ මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා මේක රජයේ වගකීම පමණක් නොවේය කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇත්ත කථාව.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

රජයේ වගකීම නොවෙයි කියලා කිව්වාට, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක රජයට අත පිහදාගන්න පුළුවන් අවස්ථාවක් නොවෙයි. මේක සමස්තයම එකතු වෙලා කරන්න ඕනෑ කාර්ය භාරයක්. මේක යූ.එන්.පී., පොදු පෙරමුණේ එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ කියන පුද්ගලයා, එහෙම නැත්නම් එයාගේ ළමයාව කිසියම් මදුරුවෙක් විසින් භාජනය කර ගෙන ඉඳලා ඒ අදහස නොවෙයි, සමස්තයම මේ දේට මුහුණ දීලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඉංග්‍රීසි කියමනක් තිබෙනවා, charity begins at home කියලා. දයාව උපදින්නේ නිවසින් කියලා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා හරහා මේ ගෙනෙන යෝජනාවේ මූලික වශයෙන්ම හරය වෙලා තිබෙන්නේ, මේ කරුණු. එහෙම නැත්නම් මේ ඩෙංගු බෝ වීම සහ ඒ හා අදාළ වූ බෝ නොවන රෝගවලට මූලික කරුණ වෙන්නේ, මූලික වශයෙන්ම ළමා පරපුරයි කියලා. ඒක හරි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදේශ රටවල්වල වාගේ නොවෙයි, අපේ ලංකාවේ දරුවන් තුළ යම් ආකාරයක නිසි පුරුදුවලට, ඒ මාර්ගවලට නිසියාකාර යොමු කිරීමක් සිදු කරලා නැහැ. ඒකට අපි වගකියන්න ඕනෑ. විශේෂයෙන් දෙමව්පියෝ හැටියට, අපි නිසියාකාර කටයුත්තක් කරන කොට එහෙම නැත්නම් පොඩි කාලයේ සිට ඒ දරුවන්ට නිසි ආකාරයෙන් වැඩ කටයුතු කර ගෙන යන්න පසුබිම නිර්මාණය කිරීමක් කරලා නැහැ. සමස්තයක් හැටියට ගත්තාම ගෙවල්වල ඉඳන්ම කුඩා දරුවාගේ පටන්ම නැවත වතාවක් මේකේ කට්ටිය බෙදා ගැනීමකින් තොරව මේ කටයුත්ත කර ගෙන යන්න උත්සාහ දැරීමක් කළ යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නම් දකින එක කටයුත්තක් තමයි මේකට මූලික හේතුව ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම. මේක යම් යම් ඒකකයන් බෙදා ගෙන ඉන්නවා. එකක් ගත්තොත් එහෙම මධ්‍යම රජය මගින් කර ගෙන යන්නා වූ කාර්යභාරය. එහෙම නැත්නම් පළාත් සභාව මගින් එක් කොටසක් පවත්වාගෙන යනවා. තවත් කොටසක් පවත්වාගෙන යනවා පළාත් පාලන ආයතන මගින්. පළාත් පාලන ආයතන හැම වෙලාවේම උත්සාහ දැරීමක් කරනවා, මේක අපට අදාළ දෙයක් නොවෙයි කියලා කියන්න. පළාත් සභාව හැම වෙලාවේම ප්‍රකාශ කරනවා මේ කටයුත්ත අපට අදාළ වුණු දෙයක් නොවෙයි කියලා. ඒ වාගේම මධ්‍යම රජය කියනවා මේක අපට අදාළ දෙයක් නොවෙයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ගත්තොත් එහෙම RDA එක හරහා හදනු ලබන පාරවල්. මේ පාරවල් හදන්නේ මධ්‍යම රජයේ RDA එක හරහා. මේ RDA එක හරහා හදන සමහර පාරවල් - උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම පන්නිපිටිය හන්දිය. පන්නිපිටිය හන්දියේ පාරේ තිබෙන කාණු ගත්තොත් එහෙම කාණුවේ තමයි තියෙන්නේ, ලයිට් කණුව. මේ කාණුව හරියටම මැදි කරලා, හිටවලා තමයි ලයිට් කණු තිබෙන්නේ. මම මේක මහරගම නගර සභාවේදී ඇහුවාම නගර සභාවේ සභාපතිතුමිය ප්‍රකාශ කරපු දෙයක් තමයි ගරු මන්ත්‍රීතුමා, මේක අපට අදාළ අයිති දෙයක් නොවෙයි. වතුර පිරිලා, එහෙම නැත්නම් මදුරුවෝ බෝ වෙන්න මූලික හේතුව RDA එක. නමුත් මේක අපට අදාළ දෙයක් නොවෙයි කියලා තමයි හැමෝම කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නියමාකාරව, මේ මේ එක් එක් අංශ කරා, එහෙම නැත්නම් ඒ අංශ අතර සම්බන්ධීකරණයක් නොමැති වීම මූලික වශයෙන්ම මේ කටයුත්ත සඳහා අපට බලපෑමක් ඇති වෙනවා. ඒ නිසා අපි යම් අවස්ථාවකදී පළාත් සභාව, මධ්‍යම රජය සහ ඒ වාගේම පළාත් පාලන ආයතන මේ සියල්ලම එකතු වෙලා, මූලිකව මේ සඳහා ජාතික ප්‍රතිපත්තියක් ඇති කර ගත යුතුයි. එහෙම නොවුණොත්, ජාතික ප්‍රතිපත්තියක් ඇති කර නොගත්තොත් එහෙම මේ දේ කවදාවත් ඉටු කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේක සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණය වීමක් වෙලා තිබෙන්නේ. අද ගත්තොත් එහෙම ඩෙංගු මර්දන ව්‍යාපාරය, පළාත් පාලන ආයතනත් ඒ වාගේම අදාළ ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත්, ඒ වාගේම තමයි පළාත් සභාවල මන්ත්‍රීවරුත් මේ දූමායන යන්ත්‍ර අරගෙන ගම් දනව්වලට ගිහිල්ලා ඒ ගම්වල තමන්ගේ දේශපාලන හෙංචයියෝ ටිකක් විතරක් එකතු කර ගෙන එය ඔවුන්ගේ කාර්යභාරයක් බවට පත් කර ගෙන තිබෙනවා. මේ සඳහා අනෙක් පක්ෂවල මන්ත්‍රීවරුන්ට එන්න දෙන්නේ නැහැ. මේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා සම්බන්ධ කර ගෙන ඒ කටයුත්ත කර ගෙන යන්න අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ. ඒ නිසා මේක සම්පූර්ණ වශයෙන්ම ඒගොල්ලොන්ගේ දේශපාලනීකරණය වුණු වැඩ සටහනක් බවට පත් වෙලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ටික කාලයකට ඉස්සෙල්ලා BTI රසායන ද්‍රව්‍ය ඉසුවා. ඒක එලක් වුණේ නැහැ. වැඩි කාලයක් නැහැ. ගෙවල්වල තිබෙන පීලි පවා ගලවලා දැම්මා. නීතියක් ගෙනාවා සම්පූර්ණයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ අපේ නගර සභාව හරහාත් ඒ ප්‍රදේශයේ තිබෙන පීලි ගලවලා දාන්නය කියලා. ඒක නිකම් හරියට අර හිසරදයට කොට්ටේ මාරු කරනවා වාගේ වැඩක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට පළාත් සභාව හරහා අපි මේ වාගේ දේශණ පවත්වලා, මෙහෙම සාකච්ඡා කර කර ඉඳලා හරියන්නේ නැහැ. මේ සඳහා මුළු රටම එකතු වෙලා යම්කිසි සාකච්ඡාවකට ලක් කරලා, මෙන්න මේ වාගේ තීරණයක් ගත යුතුයි කියන අදහසකට ආ යුතුයි. එහෙම වුණොත් එහෙම සිද්ධ වෙන්නේ මේ කටයුත්ත නිසියාකාරව සිදු නොවීමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සඳහා මූලික වෙන්න පුළුවන් පාර්ශවය තමයි මේ අපේ ඉන්නා වූ ජනමාධ්‍ය. මේ ජනමාධ්‍යයට කරන්න පුළුවන් කාර්ය භාරය අති විශාලයි. ඩෙංගු වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරන්න පුළුවන්. අද ඩෙංගු වෙනුවෙන් ජනමාධ්‍ය, මට අඩුම තරමින් හිතන්න සිද්ධ වෙනවා, ඩෙංගු සඳහා ජනමාධ්‍ය ඔස්සේ කරලා තිබෙන කාර්යභාරය මොකක්ද කියලා. අද ඔවුන් ඔවුන්ගේ ජාතික ප්‍රතිපත්තියක් හැටියට මාධ්‍ය හරහා යම් ආකාරයක කටයුත්තක් කරනවා නම් අඩුම තරමින් තමන්ගේ තිබෙන ඒ කාල පරාසයේදී මේ තිබෙන ජාතික ව්‍යසනය වෙනුවෙන් සියලුම මාධ්‍ය හරහා එකතු වෙලා යම්කිසි කටයුත්තක් කරනවා නම්, මම හිතන්නේ මේ රටේ මේ තිබෙන්නා වූ මේ කටයුත්ත පිළිබඳව ඉතාමත්ම වාසිදායක ආකාරයට කර ගන්න පුළුවන්කමක් ලැබෙනවා. ඒ නිසා අර අපේ ගරු මන්ත්‍රීතුමියක් ප්‍රකාශ කරපු ආකාරයට ජනමාධ්‍ය ඔස්සේ මේ කටයුත්ත එක්කෝ ජනප්‍රිය, එහෙම නැත්නම් රට පිළිගත්ත යම් යම් පාර්ශවයන් හරහා මේ දේ මේ අපේ කටයුත්ත මේ සඳහා මෙන්න මේ දේවල් කළ

[ ගරු රොෂාන් රණසිංහ මහතා]

යුතුයි කියලා ප්‍රකාශයක් කරනවා නම් කුඩා දරුවාගේ ඉදන්ම ඇත්තටම මේ දේ කරන්න පුළුවන්කමක් ලැබෙනවා. ඒ නිසා මම හිතනවා, ජනමාධ්‍ය මුදල් වෙනුවෙන් විතරක් කාලය වැය කරන්නේ නැතිව මේ වාගේ දේශහිතෛෂී කටයුතුවලට යොමු වෙන්නය කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.


**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. ඔබතුමා දන්නවා. මම මේ මොහොත වන විටත් බන්ධනාගාරගතව ඉන්නේ. මේ මොහොතේ දැවැන්ත කුමන්ත්‍රණයක් සිද්ධ වෙනවා මගේ මේ දේශපාලන කටයුතු සහ මන්ත්‍රීවරයෙක් හැටියට මගේ තිබෙන වරප්‍රසාද උල්ලංඝණය කරමින්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ නම විකුණලා කප්පම් ගැනීමේ ව්‍යාපාරයක් - මීගමුවේ තිබෙන රත්තරන් බඩු සාප්පුවලට දුරකථන ඔස්සේ කථා කරලා මම කථා කරන විධියට Easy Cash දාන්න කියනවා. ඒ වාගේම මුදල්, යම් යම් ගිණුම්වලට තැන්පත් කරන්න කියලා ඒ ආයතනවලට බලපෑම් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව ලැබුණු තොරතුරු දුරකථන අංකත් සමඟ මම වගකීමෙන් ලිපියක් සකස් කරලා තිබෙනවා. ඒ ලිපිය මම ඉතාමත් ගෞරවයෙන් සභාගත කරන්න ඔබතුමාගේ අවසරය ඉල්ලනවා.[9] ඒක පොලිස්පතිතුමාටත් යොමු කිරීම සඳහා මම ඒ ලිපිය සූදානම් කරලා තිබෙන්නේ. ඒ වාගේම ඔබතුමා මාර්ගයෙන් ඒක පොලිස්පතිතුමා වෙත යොමු කරලා මට සාධාරණයක් කරන්නය කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා. මොකද, මම ඉන්නේ තාප්ප හතරක් මැද්දේ. මට දුරකථන පහසුකම් නැහැ. ඉතින් මාව විනාශ කිරීමේ දෙවන අදියර තමයි මේ පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා මට ඉන්නේ ඔබතුමා පමණයි. මොකද, මාව මෙතැනට ගේන්නේ ලැම්බෝගිනි එකේ වාගේ අර වාහනේ. මාංචු දාලා. ඊට පස්සේ මාව බන්ධනාගාර නිලධාරීන් භාරයට යනවා. ඒ ගියාම මාව නැවත ඒ තාප්ප හතර අස්සටයි යන්නේ. ඒ ගියායින් පස්සේ මේ සංවිධානාත්මක කණ්ඩායමක් තමයි මේ දේ කරන්නේ කියලා පැහැදිලියි. ඒ ලිපිය මම කියවන්නේ නැහැ. ඔබතුමාගේ කාල වේලාව යන නිසා. අන්තර්ගතය සියල්ල තිබෙනවා මේකේ. මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා. මේක සභාගත කරලා අවශ්‍ය නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා මාව ආරක්ෂා කිරීම වස් ක්‍රියා කරන්නය කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා. ඒ වාගේම මොබයිල් අංක සියල්ලම මේකේ තිබෙනවා. ඒ කථා කරපු අංක. ඒ වාගේම මම ඉතාමත් ගෞරවයෙන් අපක්ෂපාතී මාධ්‍යයෙන් ඉල්ලනවා, මේක හෙළි කරලා, ඒ ඉල්ලන අයට මේ මුදල් දෙන්න එපාය කියලා. පුවත්පත් මඟින් මේ සඳහා ප්‍රසිද්ධියක් ලබා දෙන්නය කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලිපිය සභාගත කරන්න. බොහොම ස්තුතියි.

***[සභාගත කළ ලේඛනය]**
*[Document Tabled]*



ජේ.ඒ.රොයිස් විජිත ප්‍රනාන්දු
බන්ධනාගාරය,
මීගමුව.

2014 අගොස්තු 05 වන දින

මීගමුව බන්ධනාගාර අධිකාරී තුමා මගින්

ශ්‍රී ලංකා පොලිස්පති තුමා වෙත හා
මීගමුව පොලිස් අධිකාරී තුමා වෙත

පොලිස්පති තුමනි,
පොලිස් අධිකාරී තුමනි,

''රොයිස්'' යන මගේ ප්‍රසිද්ධ නාමය භාවිත කර කප්පම් ඉල්ලීම් සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය යොමු කිරීමය.

මා බලන්නට හිරගෙදරට පැමිනි හිතමිත්‍රාදින් ගෙන් පහත සඳහන් සිද්ධි දැනගන්නට ලැබුනි. මෙවැනි ක්‍රියා හරහා මගේ කීර්ති නාමය කෙලසා, මා අපහසුතාවයට පත්කර, මා ගැන වැරදි ප්‍රතිරූපයක් ගොඩනගා අධිකරණය නොමඟ යැවීමට, සටකපට ව්‍යාපාරයක් ක්‍රියාත්මක වන බව මට වැටහී ගිය නිසා, මේ ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කිරීමට අදහස් කළෙමි.

1/ පළමු වන සිද්ධීය තමයි මීගමුවේ කඩොල්කැලේ පදිංචි ඇන්ටනී පෙරේරා හෙවත් ''බබා'' නමින් ප්‍රසිද්ධ ත්‍රිරෝද රථ රියදුරුට 2014/07/12 වන දින දහවල් 11.00 ත් 12.00 අතර අංක 0728091326 යෙන් රොයිස් කථා කරන ආකාරයෙන් අමතා මට සල්ලි නෑ මේ නොම්බරේට රීලෝඩ් එකක් දාන්ඩ කියල කියපු එක. බබා නමැත්තාගේ අංකය 0777130368 වේ.

2/ දෙවන සිද්ධිය නම් ඉහතකී බබා ගේ මිත්‍රයකු වන මීගමුව ග්‍රීන් පාරේ 127/1 ස්ථානයේ ගුඩ් ෆියුචර් විදේශ රැකියා ආයතනය හිමි මහින්ද නමැත්තාට 2014/07/17 වන දින උදේ 10.00 ත් 11.00 අතර අංක 0713307571 න් අමතා ඇති පුද්ගලයකු දැන් බන්ධනාගාරය ඇතුලෙ පාටියක් යනව, මම රොයිස් මට උදව්වක් හැටියට සල්ලි එවන්න කියල තිබෙනවා. මහින්දගේ අංකය 0778197694 වේ. ඔහු මේ බව බබා නමැත්තට කියා තිබුනි.

3/ තෙවැනි සිද්ධිය සිදුවී තිබෙන්නේ 2014/07/21 වන දින මීගමුවෙ කෲස් පාරේ අංක 48 ස්ථානයේ දෙව්පුර ජ්වර්ලර්ස් සාප්පුවේ අංක 0312238538 දුරකථනයට ලැබුන පනිවුඩයක් ඔස්සේය. වෙළඳ සහයකයෙක් තමයි එම ඇමතුමට උත්තර දී තිබෙන්නෙ.

ඔය මුදලාලි ද කථා කරන්නේ. — නැහැ කඩේ වැඩ කරන කෙනෙක්
මේ කථා කරන්නෙ රොයිස් හිරේ ඉදන්
මට බොස්ගෙ හැන්ඩ් ෆොන් නොම්මරය දෙනව ද? — බැහැ ඒක අපිට තහනම්
එහෙනම් කියනව රොයිස් කිවුව කියල රු50000/-
ලෑස්ති කරල තියන්ඩ කියල

මම මේ කථාව දැනගත්තෙ නවරත්න කියන මගේ මිත්‍රයාගෙන්. එයාට මේ විස්තරය කඩේ මුදලාලි තරීන් යන අය තමයි කියල තියෙන්නෙ. නවරත්නගේ අංකය 0778633716 වේ.

4/ හතර වන සිද්ධිය කොච්චිකඩේ අංක 35 මරික්කාර් ජුවලර්ස් සාප්පුවට 2014/07/22 වන දින උදේ 10.30 ත් 10.40 ත් අතර අංක 777270166 යෙන් මෙම සාප්පුවේ 0312277598 ට අමතා ඇති පුද්ගලයකු ඊසිකෑෂ් අංකයකට රු 10000/- ක් දමන්න. මම රොයිස් එක්ක, හිරේ ඉන්න පොඩි එකා, කියල දැනුම් දීල තිබෙනව

මම මේ කථාව දැනගත්තෙ මුෂ්නි කියන මගේ මිත්‍රයාගෙන්. එයාට මේ විස්තරය කඩේ මුදලාලි කියල තියෙනව. මුෂ්නිගේ අංකය 0773626424 වේ.

මෙම සිද්ධිවලට මගේ කිසිම සම්බන්ධතාවයක් නැත. මෙවැනි අප්‍රසිද්ධ සිදුවීම් තවත් තිබෙන්නට පුලුවන. සමහර විට ඒවා පෙලීසියට දැනුම් දී තිබෙන්නට ද පුළුවන. සමහරක් බය නිසා කප්පම් ගෙවා නිහඬව සිටින්නට ද හැකිය. මෙම සිදුවීම් පිළිබඳ සත්‍ය සොයාබලා මට සාධාරණයක් ඉටුකර දෙන මෙන් කරුණාවෙන් ඉල්ලමි.

ස්තුතියි

මෙයට ,
විශ්වාසී,

ජේ.ඒ.රොයිස් විජිත ප්‍රනාන්දු
සැක/අංක 2955

---

[9] කථාව අවසානයේ පළ කර ඇත.

[අ.භා. 12.54]

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් මේ සභාව ඉදිරියේ තබන්නට යෙදුණා. ඇත්තෙන්ම මම කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න සිද්ධ වෙනවා, ඉතාමත්ම සද්භාවයෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව, අද කාලීන යෝජනාවක් හැටියට අපි සියලු දෙනාම දන්නා කාරණාවක්. හැබැයි, එතුමාගේ යෝජනාවේ තිබුණු අන්තර්ගතයට වඩා මන්ත්‍රීවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට සිද්ධ වුණේ ඩෙංගු මර්දන ව්‍යාපාරය පිළිබඳවයි. ඒ පිළිබඳව ඇත්තෙන්ම මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කළ යුතුයි. මොකද, ඩෙංගු ව්‍යසනය නිසා මේ රටේ විශාල ප්‍රමාණයකින් ජීවිත අහිමි වුණා. ඒක අපි කවුරුත් දන්නා කාරණයක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

හැබැයි, වර්තමානය වන කොට ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාව ඒ මට්ටමේ තිබුණත්, ඩෙංගු රෝගීන්ගේ මරණ සංඛ්‍යාව පසුගිය මාස දෙක වාගේ කාල සීමාව තුළ මට නම් මාධ්‍ය තුළින්වත් දැක ගන්න ලැබුණේ නැහැ. ඒ කියන්නේ මරණ සංඛ්‍යාව බෙහෙවින්ම අඩු වෙලා තිබෙනවා. බස්නාහිර පළාත තුළ. මම නිවැරදියි කියලා හිතනවා. එකම මාධ්‍යක් තුළින්වත් දැන ගන්න ලැබුණේ නැහැ ඩෙංගු මරණයක් සිද්ධ වුණා කියලා. ඒ නිසාම අපි ඒ තුළින් අපේ වැඩේ අවසාන වුණාය කියලා අපට හිතන්න පුළුවන්කමක් නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි මෙතැනදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට - විපක්ෂයක කාර්යභාරය තමයි සැම අවස්ථාවකම - (බාධා කිරීමක්) ඒක හරි විපක්ෂයක් තමයි ඒක. හොඳ දෙයක් වෙන්න පුළුවන්, නරක දෙයක් වෙන්න පුළුවන් ඒකේ ප්‍රයෝජනයක් ලබා ගෙන තමන්ගේ විපක්ෂය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම විපක්ෂයේ කාර්යයක්. ඒ නිසා මම ඒ පිළිබඳව කාටවත් දොස් කියන්න යන්නේ නැහැ. විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයෙක් නිරන්තරයෙන්ම උත්සාහ ගන්නේ තමන්ට වාසි දායක අයුරින් ඒ යෝජනාව හරවා ගැනීමට. මහේෂ් අල්මේදා ගරු මන්ත්රීතුමාගේ යෝජනාව පිළිබඳව වැඩිම අදහස් දැක්වුණේ, ඩෙංගු මදුරු උවදුර පිළිබඳවයි. අද පාසල් පද්ධතිය ගැන අපට කථා කරන්න සිද්ධ වෙන කොට විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, බස්නාහිර පළාත තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා විශාල දියුණුවක් ලබන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා. පසුගිය අවුරුදු කිහිපය තුළ. එහෙම කියන්නේ, මේ අවස්ථාවේදී මට අධ්‍යාපන මට්ටම ගැනත් කථා කරන්න සිද්ධ වෙනවා. අධ්‍යාපන ප්‍රතිඵල දිහා බලන කොටත් ඉතාමත්ම ඉහළ තත්ත්වයකට ගේන්නට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, මේ බස්නාහිර පළාත තුළ. අධ්‍යාපනය ඉහළට ගේන කොට බස්නාහිර පළාත ගැන මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කරන විට ඒකේ අගය කිරීමක් කිරීම අපේ යුතුකමක් වෙනවා. අනිවාර්යයෙන්ම අපි දන්නවා මේ බස්නාහිර පළාත් සභාවේ ඒ පාසල්වල තිබෙන කැන්ටින් තුළින් දරුවන්ගේ රෝග නිධානයන් ඇති කිරීමට බහුලවම උපකාර වෙනවාය කියන එක අපි විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. මේ රටේ දරුවන්ගේ කෑම වේල පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ දෙමව්පියන්ට. අද දෙමව්පියන් අවුරුදු පහ වන කොට දරුවාව පාසලට භාර දීලා, පළමුවන වසරට ඇතුළත් කරලා, එය අවුරුදු 8, 9 වන කොට ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් කරන්න දෙමව්පියෝ විශාල කැපවීමක් කරනවා. මම හිතන්නේ, මම නම් දකින්නේ ඒක මව්වරුන්ගේ විභාගයක් හැටියට. අම්මලා ඒ තරම් මහන්සි වෙනවා. හැබැයි, ශිෂ්‍යත්ව විභාගයෙන් පස්සේ ඒ දරුවන් පිළිබඳව අර අධ්‍යාපනයට දක්වපු උනන්දුව, සහයෝගය එක්තරා ප්‍රමාණයකට අඩු වෙනවා. දරුවා සාමාන්‍ය පෙළට යන කොට අපි දකින්නේ, මේක නිකම් ගුරුවරුන්ගේ විභාගයක් හැටියට. ඒ නිසා මේ රටේ අද අධ්‍යාපන මට්ටම දියුණු කරන්න දෙමව්පියෝ කැප වෙනවා වාගේම, විශේෂයෙන්ම දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව වැඩි අවධානයක් දෙමව්පියන්ට අද වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, පසුගිය කාල සීමාව තුළදී දරුවන්ට වුණු අතවර. මේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා කමිටු පිහිටුවනවා වාගේම එදිනෙදා පුවත්පතක් අරගෙන බැලුවොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනන්ත අප්‍රමාණ දරුවන්ට වන ප්‍රශ්නවලට, කාටද? මේවාට පිළියම් යොදන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේවාට වැරදිකාරයෝ බවට පත් වෙන්නේ දෙමව්පියෝ. මම දැක්කා දවසක් තංගල්ල ප්‍රදේශයේ නීතිඥ මහත්මයෙක් තමන්ගේ රාජකාරියට යන්න වාහනය රිවස් කරන කොට තමන්ගේ වාහනයටම දරුවා යට වෙනවා. සමහර දෙමව්පියෝ පෞද්ගලික ගමන්බිමන් යන්න දරුවන්ව අහළ පහළ ගෙවල්වල නවත්වනවා. මම දැක්කා ජාතික පුවත්පතක

[ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා]

තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දරුවන්ට වැරදි දේවල් සිද්ධ වෙන්නේ 95% ක්ම මේ රටේ දන්නා, හිතවත් අසල්වාසීන්ගෙන් කියලා. ඇත්ත කථාව. ඇයි? ඒ පිළිබඳව අවධානයක් යොමු කරන්නේ නැහැ. සමහර වෙලාවට අධ්‍යාපනය පමණයි. දරුවාගේ ආරක්ෂාව පිළිබඳව කිසිම අවධානයක් යොමු කරන්නේ නැහැ. ඒ තුළින් දරුවන්ට වන දේවල් පිළිබඳව අපි දිගින් දිගටම කථා කරන්න ඕනෑ නැහැ. එහෙම නම් දෙමව්පියන්ගේ වටිනාකමක් තිබෙනවා. මේ සෞඛ්‍ය කමිටුවක් පිහිටුවන්නට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කළ යෝජනාව, ඉතාමත්ම කාලීන යෝජනාවක්. අපි දන්නවා. දැන් සමහර අවස්ථාවලට බෝ වෙන රෝගයක් හැදිලා තිබුණු දරුවාව සනීප වුණාට පස්සේ යවන්න ඕනෑ වුණත්, සමහර දෙමව්පියෝ දරුවාගේ ඒ අසනීපය භාගයට සුව වෙලා තියෙද්දීත් දරුවාව පන්තියට පිටත් කරලා යවනවා. ලෙඩේට වඩා අධ්‍යාපනය ලබන්න ඕනෑය කියලා. ඒ තුළින් සමහර අවස්ථාවල ඒ බෝ වන රෝගය පන්තියේ ඉන්න තවත් දරුවන්ට බෝ වීමට අවකාශ තිබෙනවා. දෙමව්පියන්ගේ තමයි මේකේ සම්පූර්ණ වගකීම තිබෙන්නේ. දෙමව්පියන්ට ලොකුම වගකීමක් තිබෙනවා. අපි මේ මොන සෞඛ්‍යය සමාජ කමිටු පිහිටෙව්වත් දරුවන්ට වඩා දරුවන් පිළිබඳව විශාල වශයෙන් වගකීමක් පැවරෙන්නේ මේ රටේ දරුවන් ලෙඩ රෝගවලින් බේරා ගැනීම පිළිබඳව වගකීම පැවරෙන්නේ ඔවුන්ගේ දෙමව්පියන්ට.

මම පසුගිය දවස්වල මේ දේශපාලන වාසියක් ලබා ගැනීම සඳහා නොවෙයි. මගේ ප්‍රතිපාදනවලින් රුපියල් ලක්ෂ 10 ක් වෙන් කරලා, මේ ඊයේ පෙරෙයිදා ඩෙංගු මදුරු උවදුරින් අපේ දරුවන් බේරා ගැනීම සඳහා පෙර පාසල්වල ඉන්න දරුවෝ 1000 කට මදුරු දැල් ලබා දීමට කටයුතු කළා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි සියලු දෙනාගේම යුතුකමක්. මේක ජනාධිපතිතුමාගෙන් පටන් අරගෙන, දීර්ඝ කාලයක් තිස්සේ මේ කටයුත්ත මේ රටෙන් නිම කරන්නට විශාල වැඩ කොටසක් කර ගෙන ගියා. මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමතිතුමා, මෛත්‍රීපාල සිරිසේන ගරු අමාත්‍යතුමා අප්‍රමාණ වෙහෙසක් දැරුවා. අපේ බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍යතුමා විශාල වැඩ කොටසක් කළා. සමහර අවස්ථාවලදී එතුමා කර ගෙන යන වැඩ ගැන එතුමා එක්ක මම සාකච්ඡා කරද්දී යම්කිසි ව්‍යාපෘති, ඩෙංගු මදුරු උවදුර නැති කිරීම සඳහා ව්‍යාපෘති කළුතර දිස්ත්‍රික්කයේ කෙරෙනවා. ගම්පහත් නැහැ. කොළඹත් නැහැ. මම ඇහුවා. ඇමතිතුමා මෙහෙම වෙන්න හේතුව ඇයි? නිලධාරීන් පිටින් දාලා අපට මේවායෙන් නිදහස් වෙන්න පුළුවන්කමක් නැහැ. දේශපාලඥයින් හැටියට අපි හැම කෙනාගේම යුතුකම, පක්ෂයක් පාටක් බලන්නේ නැතිව මේ කටයුත්තට විශාල දායකත්වයක් ලබා දෙන එකයි. ඒ වුණාට මම කිව්වේ ඒකයි. සමහර අවස්ථාවල මේ කොයි දේ කළත් අවසාන වශයෙන් අර මම දැක්කා මන්ත්‍රීවරුන් - මම නම් කියන්න යන්නේ නැහැ. මම දැක්කා. සමහර මන්ත්‍රීවරු ඉතාමත් වැදගත් යෝජනා ඉදිරිපත් කරලා අර අන්තිමට කිරි කලයක් දොවලා ගොම් බෙට්ටක් දා ගත්තා වාගේ වැඩක් තමයි වුණේ. මම ඒකයි කිව්වේ. සාමාන්‍යයෙන් පක්ෂයක් වුණාම ඉතින් පක්ෂයට මතක් වෙන්නත් පොඩි වචනයක් ගහන්නත් එපැයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

නැහැ. නැහැ. මම චින්තනය ගැන විතරයි කිව්වේ. චින්තනය ගැන. වෙන මුකුත් කිව්වේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ වර්තමාන සෞඛ්‍ය ඇමතිතුමාටත්, අධ්‍යාපන ඇමතිවරයා හැටියට කටයුතු කරන ප්‍රධාන අමාත්‍යතුමාටත් මේ සෞඛ්‍ය සමාජ කමිටු පිහිටුවලා, මේවා පිහිටෙව්වාට මදි වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පිහිටුවන්න පුළුවන්. මේවා පිහිටුවලා ඒවා හරියාකාර කෙරෙනවාද කියන එක බලන්න තමයි ඊළඟ ප්‍රශ්නය වෙන්නේ. අපි මෙහෙන් යෝජනා සම්මත කළාට පස්සේ ලබන මාසේ වෙන කොට මේවා පිහිටුවයි. ඒ පිහිටෙව්වාට පස්සේ ඒවාට අවශ්‍ය කරන සියලුම සම්පත් අපි ලබා දීමට පළාත් සභාව කටයුතු කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් අමාත්‍යවරුන් දෙපළට දැනුම් දීමට කටයුතු කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.04]

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂ ස්තුතියක් පිරිනමනවා මහේෂ් අල්මේදා අපේ ගරු මන්ත්‍රීතුමාට,

මේ සෞඛ්‍ය සමාජ පාසල් හරහා පිහිටුවීමට ගෙනෙන ලද යෝජනාව සම්බන්ධයෙන්. ඒ වාගේම විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමන්ලා රාශියක් මේ සම්බන්ධව විවිධ අදහස්, යෝජනා, කළ යුතු දේවල් සමහර වෙලාවට චෝදනා ලෙස, චෝදනා කළ යුතු තැන්වල සමහර දේවල් ඒ මාතෘකාවෙන් බැහැරව පුද්ගලික අරමුණු ඉෂ්ට කර ගන්න - නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා එහෙම පේන්න නැහැ. ඒ වාගේ දේශපාලන හැඟීම්වලිනුත් කථා කළා. හැබැයි, මම හිතනවා, ඩෙංගුවලට දේශපාලනයක් නැහැ. ඩෙංගුවලට පක්ෂයක්, කණ්ඩායමක් නැහැ. ඩෙංගු මදුරුවා පිළිබඳව සහ ඩෙංගු මදුරු උවදුර පිළිබඳව අපි අවංකවම පිළිගත යුතු කරුණු රාශියක් තිබෙනවා. ඒ නිසාවෙන් අවුරුදු දහයක් මේ ඩෙංගු මර්දන ව්‍යාපාරය ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේ විවිධ රටවල්වල මේ ඩෙංගු බෝ වීම අධි අවදානම් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලංකාවේ ගරු මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා පළමු කොට ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවලා ඒ හරහා අති දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. මෙවර නිරිතදිග මෝසම් වැසි සමයත් එක්ක 2012 ට පස්සේ ඩෙංගු අධි අවදානම් තත්ත්වයක් ඇති වෙනවාය කියන සංඥාව සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබුණාම එතුමා අපිවත් කැඳවලා, ගරු මහ ඇමතිතුමාත්, අපි සියලු අමාත්‍යවරුත් ජනාධිපති කාර්ය සාධක බලකාය හරහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. එසේ නොවුණා නම්, අද බස්නාහිර පළාතේ 60% ක් දක්වා වර්ධනය වුණු ඩෙංගු උවදුර මීට වඩා ඉහ වහා ගිය තැනකට යන්න තිබුණා. දැන් 40% ක් දක්වා මෑත කාලයේ අඩු වෙලා තිබෙනවා.

ඒ නිසා විශේෂයෙන් ගාමිණී තිලකසිරි අපේ ගරු සභානායකතුමා මතක් කළා වාගේ අපි දිස්ත්‍රික්ක තුනටම නිසියාකාර සමාන්තර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. දැන් ජූනි මාසේ 20, 21, 22 දින තුනේ බස්නාහිර පළාතේ විධිමත් ඩෙංගු මර්දන වැඩ සටහනක් අපි ක්‍රියාත්මක කළා. ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඩෙංගු අධි අවදානම් ප්‍රදේශ හඳුනාගෙන තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ. ඊට පස්සේ මාසේ, 3, 4, 5, 8, 9, 10 ආපසු 18. ආපසු මේ මාසේ 7, 8, 9, 10 දැන් මේ වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ලොකු මහන්සියක් වෙහෙසක් දරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ බස්නාහිර පළාතේ මධ්‍යම රජයේ සමගාමීත්වය ඇතිව ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාල හරහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා, ත්‍රිවිධ හමුදාවේ සහයෝගය ලබා ගෙන පළාත් පාලන ආයතනවල සහයෝගය ලබා ගෙන ස්වේච්ඡා සංවිධාන හරහා, කොළඹ මහ නගර සභාව හරහා විවිධ නගර සභා හරහා, විවිධ පළාත් පාලන ආයතන හරහා විධිමත් වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත්මක වෙනවා. මම ඒ ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ. මොකද, මෙකේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේම මම පිළිගන්නවා. ඒක කියන්න ඕනෑ. මගේ උපදේශක කාරක සභාවේදී බොහොම අවංකවම මම කිව්වා. අපට ඕනෑ එකිනෙකාට ගෙනෙන යෝජනාවලට එරෙහි වෙන්න නොවෙයි. මගේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා හෝ මෙතැන ඉන්න අනෙකුත් මන්ත්‍රීතුමන්ලා ගෙනෙන යහපත් යෝජනා ඉතාමත් නිහතමානීව පිළිගන්නා බව ප්‍රකාශ කළා.

අපේ ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා දන්නවා. එතුමාත් ඩෙංගු ප්‍රශ්නයක් ගැන මට කථා කරපු ගමන් මම අනික් පැත්තට ඒකට අවශ්‍ය යහපත් ක්‍රියාමාර්ග ගත්තා. මට ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා කථා කළා. මම ක්‍රියාමාර්ග ගත්තා. මට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කළා. දින තුනක්. එතුමාට ඒක අමතක වුණා. එතුමා කථා කළේ නැහැ ඒ ගැන. මම විශේෂයෙන් හංවැල්ල ප්‍රදේශයේ පාසල්වලට ගිහිල්ලා, ඔය ගෙනෙන යෝජනාවේ මූලික බීජය ඇතුළත් කළේ මම. පාසල්වලට කථා කරලා, විදුහල්පතිවරුන්ට කථා කරලා, විදුහල්පතිවරු දැනුවත් කරලා, ඩෙංගු සම්බන්ධව පාසල් පවිත්‍රතා කමිටු - ඩෙංගු සම්බන්ධව විතරක් නොවෙයි, බෝ නොවන රෝග සම්බන්ධව විතරක් නොවෙයි බස්නාහිර පළාත් සභාව හැටියට මත්ද්‍රව්‍ය සම්බන්ධව පවා විධිමත් වැඩ පිළිවෙළක් අපි නුදුරු කාලයේදී ක්‍රියාත්මක කරන බව මගේ උපදේශක කාරක සභාවට පැමිණි සියලුම ගරු මන්ත්‍රීවරු දන්නවා. මම එතුමන්ලාගේ අදහස් මේ සඳහා භාර ගත්තා. අපේ ගරු විපක්ෂ නායකතුමා දන්නවා. අපි ඒක ක්‍රියාත්මක කර ගෙන යනවා. කිසි පැකිලීමක් නැහැ. ඒ නිසා මතක් කරන්න ඕනෑ, මේක එකිනෙකා අතර, හෘද සාක්ෂියත් එක්ක තිබෙන ගනුදෙනුවක්. මේ ඩෙංගු මර්දන ව්‍යාපාරය සහ බෝ නොවන රෝග සම්බන්ධව අපි ගත යුතු ක්‍රියාමාර්ග. අපේ ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා කිව්වා වාගේ බරපතළ උවදුරු සියල්ල දරුවන්ට තමයි පැමිණෙමින් තිබෙන්නේ.

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

මේ විවෘත ආර්ථික ක්‍රමය එන කොට ඒ කාලේ අපි කිව්වා, මේ විවෘත ආර්ථික ක්‍රමය හරහා ලෝකයේ තිබෙන සියලුම කුණු කන්දල් ලංකාවට එනවාය කියලා. හැබැයි, ඒක පිළිගත්තේ නැහැ. විවෘත ආර්ථිකය ඇවිල්ලා ජේව්මන්ට් එකේ ඔය බඩු පිරවෙන කොට ඒ කාලේ මතකයි නේද? ඒ කාලේ නොතිබුණු දේවල් ඔක්කොම ඇවිල්ලා. අද විවෘත ආර්ථිකය හරහා තමයි මේ කුඩු ගලාගෙන එන්නේ. කුඩු ගලාගෙන එන්නේ විවෘත ආර්ථිකය හරහා. ඒ නිසාවෙන් ලංකාවේ අද පාලනය කර ගත නොහැකි විවිධ උවදුරු ඇති වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට මම එක දෙයක් කියන්න ඕනෑ. එක උදාහරණයක්. ඩෙංගු වැළඳෙන්න පුළුවන්. ඩෙංගු රෝගීන් වැඩි වෙන්න පුළුවන්. බෝ නොවන රෝග වැඩි වෙන්න පුළුවන්. මත්ද්‍රව්‍ය පිළිබඳව විවිධ බලපෑම් වෙන්න පුළුවන්. සියල්ලටම අපට පුළුවන් උපරිම විධියට මුහුණ දෙනවා. මේ වන විට ඩෙංගු සම්බන්ධව වැදගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා වාගේම පොඩි උදාහරණයක් කියන්න ඕනෑ, විපක්ෂයේ පිටිපස්සේ ඉන්න ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට. මීගමුව රෝහලේ අපි පිහිටුවලා තිබෙන - ගරු මහ ඇමතිතුමාගේ උපදෙස් ලැබුණා ඒ කාලේ. ඩෙංගු ඒකකයට ඇතුළත් කරන කිසිදු රෝගියෙක් මිය ගිහිල්ලා නැහැ. ඒ තරම් අපි විධිමත් විධියට වැඩ කරනවා. ගම්පහත් එහෙමයි. කළුබෝවිලත් එහෙමයි. ඒ තරම් මහන්සි වෙනවා මේ සම්බන්ධව. බෝ වෙන්න පුළුවන්. හැබැයි, මරණ සංඛ්‍යාව අපි උපරිම විධියට අඩු කරන්න කැප වෙනවා.

බෝ නොවන රෝග සඳහා අපේ හිටපු ඇමතිතුමා විශේෂයෙන් ජගත් අංගගේ අමාත්‍යතුමා ඉන්න කාලේ හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. මේ රෝග හඳුනා ගැනීම සඳහා. දැන් අපි සුව දිවි සායනය. සුව දිවි සායන වැඩ පිළිවෙළවල් ප්‍රාදේශීය වශයෙන් අපේ ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාල හරහා අපේ වෛද්‍යවරු දාලා පර්යන්ත රෝහල්වල වෙනම ඒකක පිහිටුවලා, ඒ වාගේම ග්‍රාමීය ප්‍රදේශවල අපේ සායනවල වෙනම ඒකක පිහිටුවලා අපි ක්‍රියාත්මක කර ගෙන යනවා. මම අද මතක් කරන්න ඕනෑ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව හොඳයි. මම හිතන්නේ, පළාත් සභාවට ගෙනෙන යෝජනා හුඟක් ක්‍රියාත්මක වෙලා නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනෙන මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න, පසුගිය කාලේ මම ගරු මහ ඇමතිතුමාගෙනුත් උපදෙස් පැතුවා. මේ යෝජනාව ගේන්නට පෙර. මම එතුමාට කිව්වා ගරු මහ ඇමතිතුමනි, අපි අධ්‍යාපන අමාත්‍යාංශයයි, සෞඛ්‍ය අමාත්‍යාංශයයි ඒකාබද්ධව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමු. එතුමාගෙන් ලැබුණු උපදෙස් බොහොම ඉහළින් අගය කරනවා. අපි දැනට කැබිනට් පත්‍රිකාවක් සකස් කරමින් ඉන්නවා. අපි ඉතාමත් නුදුරේදී කැබිනට් පත්‍රිකාවකින් මේ කාරණාව ස්ථාපිත කරලා, පාසල් හරහා සෞඛ්‍ය සමාජ පිහිටුවන්න කටයුතු කරනවා. ඔය කියනවාටත් වඩා විධිමත් විධියට පිහිටුවන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ බව මතක් කරමින් මේ සඳහා යෝජනා ඉදිරිපත් කරන ලද, මේ යෝජනාව ගෙනෙ ලද මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට විශේෂ ස්තුතියක් කරනවා. හංවැල්ලේ ගිහිල්ලා එතුමාට මම වැඩ කොටසක් භාර දුන්නා. එතුමා ඒක කළා. පාසල්වලට ගියා. ඒ වාගේම මම ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට, ඒ වාගේම නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියටත්, ඒ වාගේම අපේ හිටපු ඇමතිවරයෙක් වන ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමාටත් විශේෂ ස්තුතියක් කරනවා. අපේ කෝකිලා ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමියටත් විශේෂ ස්තුතියක් කරනවා. මේ සඳහා අපට අවශ්‍ය මග පෙන්වීම තමයි තිබෙන්නේ. අපේ සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මහ ඇමතිතුමා (බාධා කිරීමක්) අභගෙන - මහ ඇමතිතුමාටත්

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

අමාරුවෙන් අහගෙන හිටියාට.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අහගෙන හිටපු සියලු දෙනාටත් විශේෂ ස්තුතියක් පිරිනමනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.12]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම ස්තුතිවන්ත වෙනවා සියලුම ගරු මන්ත්‍රීවරුන්ට. විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාට. අමාත්‍යතුමා කිව්වා හුඟක් යෝජනා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නමුත් මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කටයුතු

කරනවාය කියලා. ඒ වාගේම මේ යෝජනාව පෝෂණය කරන්න කථා කරපු සියලු මන්ත්‍රීවරුන්ටත් අපි ස්තුතිවන්ත වෙනවා. බොහෝ වැදගත් කරුණු සාකච්ඡා කරමින් මේ යෝජනාව පෝෂණය කිරීම සඳහා මන්ත්‍රීවරු ගණනාවක් අදහස් දැක්වූවා.

ඒ වාගේම මම කනගාටු වන කාරණාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි යම් යෝජනාවක් ගේන කොට ඒ යෝජනාවේ අන්තර්ගතය හඳුනාගෙන ඒ යෝජනාවට අදාළ අමාත්‍යාංශවල නිලධාරීන් මේ නිලධාරීන්ගේ පෙට්ටියේ අපි යෝජනාව සාකච්ඡා කරන වෙලාවේ ඉන්නවා නම් ඉතාමත් වැදගත් වෙනවා. මොකද, සමස්ත යෝජනාව නැතත් මන්ත්‍රීවරු කියන විවිධ අදහස් අරගෙන, ඒ අදහස් ඔස්සේ යම් අබමල් රේණුවක දෙයක් පළාත තුළ ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා නම්, ඒක මේ සභාවේ සියලු දෙනාගේ කථා බහ කරපු ඒවායේ අවසාන ප්‍රතිඵලය බවට පත් වෙනවා. ඒ නිසා නිලධාරීන්ගේ පෙට්ටියේ අධ්‍යාපන අමාත්‍යාංශයෙනුත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙනුත් වගකිවයුතු කවුරුත් නොසිටීම පිළිබඳව අපි විශේෂයෙන් කනගාටු වෙනවාය කියන කාරණයත් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, දරුවෝ කියලා කියන්නේ, ළමයි කියලා කියන්නේ තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලා ගන්න සටන් කිරීම සඳහා වූ විඥානයක් නැති අය. ඒ අයට තේරෙන්නේ නැහැ පාරේ බෝඩ් උස්සාගෙන යන්න. ලයිට් කණු උඩ නගින්න. වතුර ටැංකි උඩ නගින්න. තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලා ගන්න. ඒ නිසා රටක වැඩිහිටියන්ට තමයි වගකීම පැවරෙන්නේ ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා, ළමයිට ළමා කාලයත්, ළමයින්ගේ අනාගතයත් සුරක්ෂිත කරලා දෙන්න. දැන් ඒ වෙනුවෙන් තමයි අපි මේ යෝජනාව ගෙනාවේ. හැබැයි, සමහරුන්ට තේරුණේ නැහැ, මේක ළමයින් ආරක්ෂා කරන්න ගෙනෙන යෝජනාවක් කියලා. සමහරු හිතුවේ ළමයි පාවිච්චි කරන්න මේ යෝජනාව ගේනවා කියලා. මොකද, මේ දේශපාලන පක්ෂය තමන්ගේ ඉතිහාසය පුරාම කරලා තිබෙන්නේ තමන්ගේ දේශපාලන මල්ල පුරවා ගන්න ළමයි පාවිච්චි කරපු එකයි. ළමයි පාරට ගෙනැල්ලා, ළමයින්ව මරලා දාලා, ඒ මළ මිනී උඩින් තමන්ගේ බෝඩ් ලැල්ල උස්සාගෙන යන එක තමයි මේ දේශපාලන පක්ෂය කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ අය හිතුවා මේ ළමයි පාවිච්චි කරන්න හදනවා කියලා. හැබැයි, අපි ඔය දේශපාලන කාලකණ්ණි වැඩේ කරන්නේ නැහැයි කියලා නැවත වතාවක් මේ සභාවේ මතක් කරලා දෙන්න ඕනෑ.

ඒ වාගේම මේ දොස්තරලා මොනවාද ඉතිහාසයේ කරලා තිබෙන්නේ. මම ඉගෙන ගන්න කියලා දෙන්න ඕනෑ දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ ගැන. දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ. දොස්තරලාට තිබෙන වගකීම මොකක්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලාංකීය වාම ව්‍යාපාරයේ මුල් බීජ පැළ කර ගත්තේ දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ සෞඛ්‍යමය කාරණා පාවිච්චි කරලා. තුන් කෝරළයේ හට ගත්තා මැලේරියා වසංගතයක්. මේ මැලේරියා වසංගතය හට ගත්ත වෙලාවේ තුන් කෝරළයට එස්.ඒ. වික්‍රමසිංහ වාම නායකයෙක් විධියට මතු වුණු එන්.එම්. පෙරේරලා, පිලිප් ගුණවර්ධනලා මේ සියලු දෙනා එක්ක ගිහිල්ලා ආණ්ඩුවට දොස් කිය කියා ඉන්නේ නැතිව. එවකට ආණ්ඩු තිබුණා. අධිරාජ්‍යවාදීන් හිටියා. ආණ්ඩුව එක්ක ප්‍රශ්න තිබුණා. විරෝධතා තිබුණා. නමුත් ඒවාත් කරන්නේ නැතිව වාමවාදීන් විධියට, මානව හිතවාදීන් විධියට තමන්ගේ සමාජ වගකීම ඉෂ්ට කළා. තුන් කෝරළයේ මහ පොළොවට බැහැලා, හැම ගෙයක් ගානේම ඇවිදලා, මැලේරියාවට ලක් වෙලා හිටිය මිනිස්සු සොයලා, බෙහෙත් දීලා, ඒ මිනිස්සුන්ට කරුණු කියලා, රෝගයෙන් වැළැක්වෙන්න ඕනෑ ආකාරය කියලා, තුන් කෝරළයේ මැලේරියා මර්දන ව්‍යාපාරය වැළැක්වීම හරහා තමයි මානව හිතවාදී බව ප්‍රදර්ශනය කරලා, වමේ නායකයෙක් විධියට මතු වෙලා, ලාංකීය වාම ව්‍යාපාරයේ මුල් බීජ මේ මහ පොළොව මත පැළ කර ගත්තේ. අද ඒක වැරදි විධියට පාවිච්චි කරලා තමයි අවසානයේ, ඒක මිනී මරණ ව්‍යාපාරයක් බවට පත් කරලා, ලාංකීය වාම ව්‍යාපාරයෙන් මිනිස්සු ඈත් කරන කාලකණ්ණි වැඩේ කළේ. ඒ කාලකණ්ණි වැඩේ තවදුරටත් කරන්නේ නැතිව අපි යෝජනාවක් ගෙනාවට පස්සේ - අපටත් ප්‍රශ්න තිබෙනවා ආණ්ඩුවත් එක්ක. අපට ප්‍රශ්න තිබෙනවා ආණ්ඩුවත් එක්ක. අපට විවේචන තිබෙනවා ආණ්ඩුවත් එක්ක. හැබැයි, ඒ විවේචන හැම එකක්ම පාවිච්චි කර කර ඉඳලා හරියන්නේ නැහැ. යම් ප්‍රශ්නයක් මතු වෙනවා නම් ඒකට උත්තරයක් සොයන්න මැදිහත් වීමේ උවමනාවකුත් මිනිස්සු විධියට, මානවවාදීන් විධියට, මානව හිතවාදීන් විධියට වාමාංශිකයෝ විධියට තිබෙන්න ඕනෑ. ඉතින් ඒ කාරණාව මම මතක් කරනවා.

[ගරු මහේෂ් අල්මේදා]

ඒ වාගේම මේ සභාවේ කිව්වා සමහර සමාජ පද්ධති වැඩ කරලා නැහැයි කියලා. ඇත්තටම සමස්තයක් විදියට බැලුවාම හැම පද්ධතියක්ම මේ වෙනුවෙන් වැඩ කරලා තිබෙනවා. විශේෂයෙන් මාධ්‍ය ලොකු වැඩක් මේ වෙනුවෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් ලක්හඬ සහ ස්වාධීන රූපවාහිනී ආයතනය. විශේෂ වැඩ සටහන් ගෙන ගියා ඩෙංගු ව්‍යාප්ත වුණු වෙලාවේ. ඒ අය එනවුන්ස් කරලා, ඒ අය ගම්වලට ගිහිල්ලා, ඒ ගම්වලට එනවා කියලා කියලා, ගම් ඇතුළේ ඉඳගෙන ව්‍යාපාර ගෙන ගියා මේක කරන්න. ඒ වාගේම සිරස මාධ්‍ය ආයතනයත්. මම විශේෂයෙන් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඒ අය ප්‍රචාරක පට නිකුත් කරමින් මේ වෙලාවේ මේ ඩෙංගු මතු වුණු වෙලාවේ ඒ අය ඩෙංගු මර්දනය සඳහා කටයුතු කළා. ඒ සඳහා වූ සම්මාන ඒ අය දිනා ගත්තා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සිරස විශේෂ සහයෝගයක් දුන්නා මේ සම්බන්ධයෙන්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු අමාත්‍යතුමාත් මතක් කරනවා සිරස මාධ්‍ය ආයතනය දීපු සහයෝගය පිළිබඳව. ඉතින් එවැනි සහයෝගයක් දීලා මාධ්‍ය ආයතන වැඩ කළා. විවිධ සමාජ පද්ධති වැඩ කළා. ඒ නිසා මේ සමාජයේ හැමෝටම ඒ වෙනුවෙන් වැඩ කරන්න පුළුවන්කම තිබෙනවා. තමන්ගේ විවේචනය තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ විවේචනය කුහක විදියට හැම තැනම පාච්චි කරන්නේ නැතිව තමන්ට සමාජයේ යමක් කාර්ය භාරයක් කරන්න අවස්ථාවක් මතු වන කොට ඒ අවස්ථාවේ වැඩ කිරීම තමයි මානව හිතවාදීන් විදියට මතු වෙන්න පුළුවන්. පක්ෂයක් විදියට තමන් බලාපොරොත්තු වෙනවා නම් දේශපාලනයේ යම් ඉහළට යන්න. ඒක මතු කර ගන්න පුළුවන්. ඒ නිසා ළමයි පාවිච්චි කරලා, ළමයි මර මරා තමන්ගේ දේශපාලන මල්ල තර කර ගන්න කරන කුහක දේශපාලනය නතර කරලා, ළමයින් බේරා ගන්න තමන්ට යම් අබමල් රේණුවක තරම්වත් දායකත්වයක් දෙන්න පුළුවන් නම් ඒක ඉෂ්ට කරන්නය කියන ආරාධනයත් කරමින් ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ඉල්ලා සිටිනවා. මේ යෝජනාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවටත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවටත් යොමු කරලා, ඒ හරහා යම් ප්‍රමාණයක ක්‍රියාත්මක වීමක් සටහන් කරලා දෙන්නය කියලා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රායනුකූලව දෙවැනි යෝජනාව තිබෙන්නේ අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ. නමුත් කාල වේලාව හරස් වෙලා තිබෙනවා. කල් වේලාව මදි නිසා, මීළඟට අපට තිබෙනවා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් සහ ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කරන්න. ඒ සඳහා සභාව කල් තැබීමේ යෝජනාව ගේන්න ගරු සභානායකතුමාට මම ආරාධනා කරනවා.

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

# කල් තබන අවස්ථාවේ අසන ප්‍රශ්නය
## QUESTION ASKED AT THE TIME OF COUNCIL ADJOURNMENT

**01.**

**නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් රීති අංක 30 යටතේ අසන ලද ප්‍රශ්නය :**

අ. කොළඹ විසාකා විද්‍යාලය, සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය හා ඩී.එස්. සේනානායක විද්‍යාලය යන පාසල් අයත් වන්නේ කවර අධ්‍යාපන කලාපවලටද?

ආ. එම පාසල්වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල ඔබතුමාට පවතින බව පිළිගන්නේද?

ඇ. පසුගිය ජූලි 31 වැනිදා එම පාසල්වල කාල්ටන් රග්බි තරග ප්‍රවර්ධන හෝ ප්‍රචාරක වැඩ සටහන් පැවැත්විද?

ඈ. එම වැඩ සටහන් සංවිධානය කළේ කවුරුන් හෝ කවර සංවිධානයක් විසින්ද?

ඉ. එම වැඩ සටහන් සඳහා ඉහත පාසල්වලට සම්බන්ධ වූ පාසලෙන් බාහිර පුද්ගලයන් කවුද?

ඊ. එම වැඩ සටහන පැවැත්වීමට හා බාහිර පුද්ගලයන් සම්බන්ධ කර ගැනීමට අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් අනුමැතිය ලබා දී තිබේද?

උ. එම අනුමැතිය ඉල්ලීමේ හා ලබා දීමේ ලිපි සභාවට ඉදිරිපත් කරන්නේද?

ඌ. එම වැඩ සටහන අතරතුරදී කොළඹ 07, සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ කිසියම් නොසන්සුන්තාවයක් ඇති වූ බව ඔබතුමා දන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. කොළඹ අධ්‍යාපන කලාපය.

ආ. පරිපාලන කටයුතු රේඛීය අමාත්‍යාංශය මගින් සිදු කරන අතර, අධ්‍යාපනය සංවර්ධනය, අදාළ ගුරු භවතුන් පුහුණු කිරීම, වාර විභාග කටයුතු හා අධීක්ෂණ කටයුතු අප අමාත්‍යාංශය මගින් කරනු ලැබේ.

ඇ. නොදනිමි. පුවත්පත් මගින් වාර්තාව දක්නට ලැබුණා.

ඈ. නොදනිමි.

ඉ. නොදනිමි.

ඊ. නැත.

උ. අදාළ නොවේ.

ඌ. නොදනිමි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හොඳයි. බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීම්) ඒක තමයි, සභාවේ සිනා. දා ගන්න හැන්සාඩ් එකට. සභාවේ සිනා. හරිද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ ඉතින් ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නවලට මම පිළිතුරු දීලා තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔබතුමා ආ ප්‍රශ්නයට උත්තර දුන්නා, ඔබතුමා මේක මාධ්‍ය මගින් දැන ගත්තා කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එතකොට ඔබතුමා මාධ්‍ය මගින් දැක්කේ මොකක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. මම ප්‍රවෘත්තිය දැක්කා. නමුත් ඒවායේ සත්‍යතාවය අසත්‍යතාව මම දන්නේ නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔබතුමා දැක්කේ මොකක්ද? ඒකයි අපි අහන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මට මතක නැහැ. ගරු මන්ත්‍රීතුමා, මම ඒවා එපමණ අවධානය යොමු කරන්නේ නැහැ. අදාළ නැහැ නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මම මතක් කරලා දෙන්නම්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ ප්‍රශ්නවලින් තව ආයිත් ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අතුරු ප්‍රශ්න නැහැ. අහපු ප්‍රශ්නවලට උත්තර දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අතුරු ප්‍රශ්න අහන්න බැහැ. ඔබතුමා අහපු ප්‍රශ්නවලට පිළිතුරු හරි නම් එතැනින් නවත්වන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

පිළිතුරු වැරදියි නේ? ඒක නේ ප්‍රශ්නේ? මේ පිළිතුරු කාටද භාර ගන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක අදාළ නැහැ. පාර්ලිමේන්තුවේදීවත් අහන්න කියන්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අතුරු ප්‍රශ්න අහන්න දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අහලා තිබෙන ප්‍රශ්නවලට අතුරු ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කල් තබන අවස්ථාවේ අහන්න බැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හරි. මම කියන්නම් කෝ. දැන් මේ කාල්ටන් රග්බි ප්‍රවර්ධන වැඩ සටහනට, නාමල් රාජපක්ෂ, ඉරාජ් වික්‍රමරත්න කියන දෙන්නා -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

බැහැ. ඔබතුමා මේ -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම දැන් මෙතුමා යෝජනාවක් ගෙනාවා, පාසල් දරුවෝ රැක ගන්න ඕනෑය කියලා. නේද? පාසල් දරුවෝ රැක ගන්න ඕනෑ කියලා දැන් යෝජනාවක් ගෙනැල්ලා සාකච්ඡා කරලා ඉවර වුණා විතරයි. මේකත් පාසල් දරුවන් සම්බන්ධ ප්‍රශ්නයක්. බස්නාහිර පළාතේ තිබෙන ප්‍රධාන පාසලක සිදු වුණු.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, මේවා ජාතික පාසල් ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ජාතික පාසලක් වුණත් මෙහෙමයි. දැන් ඔබතුමා අයවැය ඉදිරිපත් කරන කොට ඉදිරිපත් කළේ මේක දාලා. වැඩේ තිබෙන්නේ මේකේ චෝදනාවක් එල්ල වෙලා තිබෙනවානේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමායි, ඉරාජ් වික්‍රමරත්න මහත්මයායි (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි. ඔබතුමාගේ කථාව දැන් නවත්වන්න. ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු සැහීමකට පත් වෙනවා කියලා හිතනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

කවුද සැහීමකට පත් වෙන්නේ? කවුද සැහීමකට පත් වෙන්නේ කියන්න කෝ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගිය සභා වාරයේ අහපු ප්‍රශ්නයක් මේක. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න වෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මොන රීතිය ද කියන්න බලන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ඔබතුමාට අවස්ථාව දෙන්නේ. වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

රීතිය පෙන්වන්න. සභා රීතිය පෙන්වන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් කාර්ය පටිපාටි රීති අංක 31(ආ) යටතේ සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාව. මේකට විනාඩි 20 ක කාලයක් තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයට විනාඩි 10 කුත්, විපක්ෂයට විනාඩි 10 කුත් දෙනවා. ඒ නිසා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

# කල් තබන අවස්ථාවේ කළ යෝජනාව

## MOTION PRESENTED AT THE TIME OF ADJOURNMENT

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"මධ්‍යම පරිසර අධිකාරිය, බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, පානදුර ප්‍රාදේශීය සභාව හා බස්නාහිර පළාත් සභාව යන ආයතන 04 එක්ව කළුතර දිස්ත්‍රික්කයේ පානදුර මාලමුල්ල ප්‍රදේශයේ ගල්ගොඩහේන නමැති රජයේ ගල්වලවල් 02 ක් ද ඇති ඉඩමේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ඇරඹීමට කටයුතු කරමින් සිටී. පානදුර හා කළුතර නගර සභා හා ප්‍රාදේශීය සභා සීමාවන් තුළ එකතු වන කුණු කසල යොදා ගෙන කොරියානු සමාගමක් විසින් මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිතය. දිනෙන් දින ජනාකීර්ණ වන මෙම ප්‍රදේශයේ මෙවැනි ව්‍යාපෘතියක් ඇරඹීම තුළින් ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම, සෞඛ්‍ය හා පාරිසරික ගැටළු මතු වීමේ අවදානම නිසා මේ වන විටත් යෝජිත ව්‍යාපෘතියට ජනතා විරෝධයක් එල්ල වෙමින් තිබේ. කරුණු මෙසේ හෙයින් යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මාලමුල්ල ප්‍රදේශයෙන් ඉවත් කර ගන්නා ලෙසත්, එය ජනාවාසවලින් තොර වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කර ගන්නා ලෙසත් බස්නාහිර පළාත් සභාවට යෝජනා කර සිටිමි."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[අ.භා. 01.25]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අපි අද උදෑසනත් සභාවේ අවධානය යොමු කළා. අපි දන්නවා,

[ගරු නලින්ද ජයතිස්ස]

විශේෂයෙන් අපේ නාගරික ප්‍රදේශවල මේ කැළි කසළ ප්‍රශ්නය බරපතළ වෙමින් පවතිනවා. අපි විශ්වාස කරනවා. මේ කැළි කසළ උවදුරට, කැළි කසළ වසංගතයට ඉතාම ක්ෂණිකව කඩිනමින් මැදිහත් වෙලා විසඳුමක් දෙන්න ඕනෑය කියලා. එහෙම නැත්නම් මේ කුණුවලින් අපේ නගර වසාගෙන යන තැනට ඇද වැටෙන්න පුළුවන්. ඒ නිසාමයි අපි හිතන්නේ, මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැදගත්. කෙසේ නමුත් 2008 දී මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ සැලසුම් සකස් කරලා තිබෙනවා. ඊට පස්සේ 2011 හතර වැනි මාසයේදී කොරියන් එක්සිම් බැංකුවෙන් ණය ගැනීම සඳහා කැබිනට් අනුමැතියත් ලැබිලා තිබෙනවා.

ඒ වාගේම තමයි 2013 ජුලි මාසයේදී අපේ රටේ මුදල් අමාත්‍යාංශයත්, කොරියානු ආනයන අපනයන බැංකුවත් අතර ගිවිසුමක් ගහලා ඩොලර් මිලියන 35.5 ක් මේ සඳහා ණය ගන්නත් අනුමත වෙලා තිබෙනවා. ඒ අනුව තමයි අපේ රටේ ස්ථාන හතරක අනුරාධපුරය, හික්කඩුවේ මොන්රෝවියා වත්තේ උඩුනුවර සහ පානදුර මාලමුල්ල කියන ප්‍රදේශවල මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ඇති කිරීම සඳහා යෝජනා කරන්නේ. ඒකට අදාළ ගිවිසුම 2012.07.17 වැනිදා අත්සන් කර තිබෙනවා. පාර්ශවකරුවන් හතර දෙනෙක් සහිතව. ඒ තමයි මධ්‍යම පරිසර අධිකාරිය, බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, පානදුර ප්‍රාදේශීය සභාව සහ බස්නාහිර පළාත් සභාව කියන ආයතන හතර. ඒකට වැය වෙනවා කියලා ඇස්තමේන්තු කරලා තිබෙන්නේ, ඩොලර් මිලියන 3.6 ක්. ඒ අනුව පානදුර නගරයේ සිට කිලෝ මීටර් හතරක් ඈත ප්‍රදේශයේ හෙක්ටයාර 1.648 ක් වෙන් කර ගෙන මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ගල්ගොඩහේන ප්‍රදේශයේ ඉදි කරන්න තමයි යෝජනා කරලා තිබෙන්නේ. දැන් ගැටළුව තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රදේශය ඉතා ජනාකීර්ණ ප්‍රදේශයක්. වර්ග කිලෝ මීටරයකට 1000 ක පමණ ජන ඝනත්වයක් තිබෙන තැනක්. එතකොට අර උදේ කිව්වා වාගේම පළමුවැනි ගෙදර, මේ ව්‍යාපෘතියේ සිට මීටර් තුනක් ආසන්නයේ තමයි තිබෙන්නේ. මීටර් 10 ක සීමාවේ ගෙවල් 35 ක් 40 ක් තිබෙනවා. ඒ වාගේම මේ ප්‍රදේශයේ ජනතාව පාවිච්චි කරන ප්‍රජා ශාලාවත්, පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයත් තන්තිරිමුල්ල ප්‍රාථමික විද්‍යාලයත් තිබෙන්නේ මීටර් 200 ක දුර සීමාවේ. ඒ විතරක් නොවෙයි. මේකේ තිබෙන බරපතළම ගැටළුව තමයි දවසකට කුණු ටොන් 42 ක් ගේන්න සැලසුම් කරලා තිබෙන නිසා මේ ප්‍රදේශයේ තිබෙන ජල මූලාශ්‍රවලට බරපතළ හානියක් වෙන්න පුළුවන්. මොකද, අර අවුරුදු ගණනක් තිස්සේ ගල් කඩපු ගල් වලවල් දෙකක් තිබෙනවා. මේවායේ කාලයක් තිස්සේ ගල් කඩපු නිසාම පැලුම් ඇති වෙලා තිබෙන්න පුළුවන්. ඒ පැලුම් නිසා මේ ප්‍රදේශයේ බීමට ජලය ගන්නා ළිංවලටත්, පොකුණුවලටත් බරපතළ හානියක් වෙනවා. ඒ වාගේම සිදුවෙන පරිසර හානිය සහ මීතේන් වායුව විමෝචනය වීමෙන් වන සෞඛ්‍ය ගැටළු. මේ පිළිබඳව අවධානය යොමු කරලා තමයි මේ ප්‍රදේශයේ ජනතාව මේක මෙතැනින් අයින් කර ගන්න කියලා කියන්නේ. ඔවුන් විරුද්ධ වෙන්නේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට නොවෙයි. ඔවුන් ඉල්ලා සිටින්නේ, මේ ජනාකීර්ණ ප්‍රදේශයෙන් මේක ඉවත් කරලා, වෙනත් ජනාවාසවලින් තොර ප්‍රදේශයක මේක දාන්නය කියලා. දැන් හික්කඩුවේ බැලුවොත් එහෙම හික්කඩුවේ මොන්රෝවියාවත්ත කියලා කියන්නේ එහෙම ප්‍රදේශයක්. උඩු නුවර එහෙම ප්‍රදේශයක්. අනුරාධපුරයේ දාලා තිබෙන්නේ එහෙම ප්‍රදේශයක. මෙවැනි ජන ඝනත්වයක් සහිත ප්‍රදේශයක නොවෙයි. ඒ නිසා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම රතුපස්වල ආවා වාගේ තුන්නානේ ආවා වාගේ විශාල පාරිසරික ප්‍රශ්නයක්, සෞඛ්‍ය ප්‍රශ්නයක් ඇති වෙලා ප්‍රදේශයේ විශාල නොසන්සුන්තාවයක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා තමයි අපි මේ උවදුර පටන් ගන්න යෝජනා කරන පළමුවැනි වෙලාවේදී මේ පළාත් සභාවේ අවධානය යොමු කරන්නේ. මොකද, මේ ව්‍යාපෘතියට අදාළ කරන පාර්ශවකරුවන් හතර දෙනාගෙන් දෙන්නෙක් - එක්කෙනෙක් පානදුර ප්‍රාදේශීය සභාව. අනික් එක්කෙනා අපේ බස්නාහිර පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය. ඒ නිසා මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලා, මේ ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධය සලකලා - මේ වන කොටත් ඔවුන් 500 කට වැඩි ප්‍රමාණයක් අත්සන් කරලා ඉදිරිපත් කරපු පෙත්සමක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, විනාඩියක් ඉන්න. කාලය දික් කරන්න ඕනෑ.

# රීති අංක 30 හා 31(ආ) යටතේ යෝජනාව

MOTION UNDER RULE NO. 30 AND 31(B)

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

සභාවේ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කරන ලෙස යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question having put, agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලයත් අවසන් වෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හොඳයි. 500 කට වඩා ජනතාව අත්සන් කරලා ඉදිරිපත් කරපු පෙත්සම මම සභාගත කරනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉල්ලීම තිබෙන්නේ මේ අදාළ ඇමතිවරයාගෙන් මෙන්න මේ කියන ව්‍යාපෘති පිළිබඳව නැවත සලකා බැලීමක් කරලා - තුන් වරක් විතර මේක කරන්න උත්සාහ කළා. මේ ප්‍රදේශයෙන් මේක අයින් කරලා මේ ජන ජීවිතය සාමකාමීව පවත්වාගෙන යාමට ඉඩ දෙන්න සහ මේ ව්‍යාපෘතිය කරන්න ඕනෑ නම් ඊට අවශ්‍ය ඉඩම් අපි පෙන්වලා දෙන්නම්. කළුතර දිස්ත්‍රික්කයේ කළුතර පානදුර ප්‍රදේශයේ ඕනෑ තරම් ඉඩම් තිබෙනවා. මේක ආරම්භ කරන්න. ඒකට අවස්ථාව ගන්නය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.31]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O W Prasanna sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති 31(ආ) යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව, සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළ යෝජනාව යටතේ අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන එම යෝජනාව පිළිබඳව මම හිතන්නේ දිගින් දිගටම රට තුළ ඇති වන මේ කැළි කසළ ප්‍රශ්නය පිළිබඳව අපි දෙපාර්ශවයක් විසින් ඉතාමත් සාර්ථකව මේ සභාව තුළට යෝජනා ගෙනැල්ලා කථා කර ගෙන යනවා. මේ කථා කර ගෙන යන අතරවාරය තුළදී මේවාට යම්කිසි විසඳුම් ගෙනාවාට පස්සේ ඒ විසඳුමටත් හැම වෙලාවේම එක්කෝ විපක්ෂය, නැත්නම් ආණ්ඩු පක්ෂයේ සමහර ස්ථානවල, නැත්නම් ප්‍රදේශයේ ඉන්න ජනතාව හැමදාම යම්කිසි දෙයක් කරන්න ගියොත් මුලින්ම මේකට විරුද්ධ වෙන එක තමයි කරන්නේ. හැබැයි, මේක කර ගෙන යද්දී මේකට වන හානියක්, නැත්නම් මෙතැනදී යම්කිසි දෝෂයක් සිදු වෙනවා නම් මම හිතන්නේ අන්න ඒ අවස්ථාවේදී තමයි අපි මේවාට යම්කිසි පිළිතුරක් නැත්නම් යම් කාර්යයක් සිදු කරන්න පුළුවන් වෙන්නේ. නැත්නම් අපේ ප්‍රතිපත්තිමය වශයෙන් බැලුවාම, උදාහරණයක් වශයෙන් ගත්තොත් අල්ලපු ගෙදරත් එක්ක අපේ ගෙදර බැලුවොත්, අපේ ගෙදරත් එක්ක අල්ලපු ගෙදර තරහයි. මුළු ලෝකයේම එහෙමයි. එහෙම හැම ගෙදරකම ඒ වාගේ වැඩ පිළිවෙළවල් තිබෙනවා. දැන් උදාහරණයක් ගත්තොත් මෙවන් වූ වැඩ කටයුත්තක් කරන්න ගියොත් මේ විපක්ෂය බැලුවොත් මොනවා හරි හොඳ යෝජනාවක් ගෙනාවොත් විපක්ෂයේ කාර්යභාරය තමයි හැම දේටම විරුද්ධ වන එක. එක්කෝ හොඳ යෝජනාවක් කර ගෙන යන එකට විරුද්ධව කටයුතු කිරීම. නැත්නම් ජනතාව වීදි බැස්සවීම.

මම හිතන්නේ අද මේ ක්‍රියාත්මක වන කළුතර දිස්ත්‍රික්කයේ පානදුර මාලමුල්ල යෝජිත සනීපාරක්ෂක බිම් පිරවීම පිළිබඳව මේ වන කොට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ස්ථාන පරීක්ෂණයක් කරලා, ඒකට අවශ්‍ය කරන මෙම ජාතික මට්ටමේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගෙන යන්න යම් වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. මේ ව්‍යාපෘතිය මාලමුල්ල ගල්වලෙහි සනීපාරක්ෂක බිම් පිරවීම පිළිබඳව මම හිතන්නේ, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවත් එක්ක කථා කරලා මේ ඉන්න හැම කෙනා සමහම දේශපාලන අධිකාරියත් එක්ක කථා කරලා, මේවාට යම්කිසි වැඩ පිළිවෙළක් මේ වන කොට දියත් කරලා තිබෙන්නේ. හැබැයි මේවාට විරුද්ධ වන කට්ටියත් ඉන්නවා. නමුත් මේක ක්‍රියාත්මක කර ගෙන යන කොට තමුන්නාන්සේලාටම තේරෙයි, මේකේ තිබෙන වගකීම. අපේ කළුතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, අද මේ කොළඹ කුණු කන්ද පිළිබඳව තමුන්නාන්සේලා පසුගිය සභාවාරයේදී කථා කළා. අපි බලන්නේ, හැම කෙනාටම අවශ්‍ය කරන කටයුත්ත කරන්න තමයි. මේක හරියට කළමනාකරණය කරගෙන නැති නිසා තමයි මේ ප්‍රශ්නය උදා වෙලා තිබෙන්නේ. අද ඒක නිසා තමයි ඒ කුණු කන්ද

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

අපට වෙනත් දිහාවකට ගෙනියන්න වෙලා තිබෙන්නේ. ගෙදරින් තමුන්නාන්සේලාගේ කුණු ටික හරියට ලබා දෙනවා නම්, මම හිතන්නේ දිරන ටික වෙනමයි, නොදිරන ටික වෙනමයි ලබා දෙනවා නම්, මම හිතන්නේ මේක මධ්‍යම රජයටවත්, මේක පළාත් සභාවටවත්, මේ කථා කරන අපිටත්, මම හිතන්නේ අපේ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා නගර සභාවලටත් මේ ප්‍රශ්නය අවම වෙනවා. හැබැයි, මම හිතන්නේ, ඒකට වැඩ පිළිවෙළක් දියත් කරන්න තමුන්නාන්සේලාත් මේ යෝජනාවට එක්ව කටයුතු කරන්න කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ. අද මෙතුමා පෙත්සමක් ගෙනැල්ලා ඉදිරිපත් කරලා ඒක සභාගත කිරීම නොවෙයි කළ යුතු වන්නේ. මම හිතන්නේ මීට ඉස්සෙල්ලාත් කර ගන්න යන කොට විරුද්ධ වෙලා තිබෙනවා.

මම හිතන්නේ ජාතික වැඩ පිළිවෙළක්, අද අධිකාරිය ඉදිරියේ බිම් පිරවීම, සකසුරුවම් කරන ලෙස මම හිතන්නේ පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කරන ඒ කොම්පෝස්ට් අංගනයක්, නැත්නම් ඒ අවශ්‍ය කරන තත්ත්වය, මම හිතන්නේ නෙට් එකක් දාලා, ඒ ගලාගෙන යන වතුර ටික එක තැනකට ගෙනැල්ලා එතැනින් මම හිතන්නේ ඒ පිරිසිදු ජලය බවට පත් කරන්න වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. අන්න එවන් වූ කටයුතු නිර්මාණය කරන්න මම හිතන්නේ අපි වැඩක් කරන්න ඉස්සෙල්ලා මේකට විරුද්ධ වෙලා කථා කරනවාට වඩා හොඳයි, අපි මේක ටිකක් කල් කරන්න දීලා අවශ්‍ය කරන ශක්තිය අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන අපේ පළාත් සභාවේ අපි මේ ඉන්න මධ්‍යම පරිසර අධිකාරියත් එක්ක එකතු වෙලා, මේ කටයුතු කරන්න - තමුන්නාන්සේලාත් මේකත් එක්ක එකතු වෙලා තමයි මේ වැඩ පිළිවෙළ කරන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේලාට අයිතියක් තිබෙනවා, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාව වෙතට ගිහිල්ලා, විරෝධ වන ජනතාව ගෙනැල්ලා තවත් වැඩමුළුවක් කරන්න පුළුවන් නම්, තවත් ඔවුන්ව දැනුවත් කරන්න පුළුවන් නම් තමයි මෙන්න මේකේ වටිනාකම දැනුවත් වෙන්නේ. අල්ලපු ගේ ළඟ තිබෙනවා නම් ඒකට විසඳුමක් තිබෙනවා. ඒකට අවශ්‍ය කරන කටයුතු නිර්මාණය කරන්න මම හිතන්නේ අප තුළ වැඩ සටහනක් දියත් වෙලා තිබෙනවා. ඔවුන්ව දැනුවත් කිරීමේ වැඩ සටහන. අන්න ඒ දියත් වීමේ වැඩ සටහන කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉල්ලා සිටිනවා ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාව නැවත ඕනෑ නම් ගෙනැල්ලා දැනුවත් කරලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් මම හිතන්නේ කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන ඒ පළාත් පාලන ආයතනවල තිබෙන ප්‍රශ්නය විසඳ ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ පුළුවන්කම ලැබුණාට පස්සේ, අප ද්‍රව්‍ය විවෘත බිම්වල තැන්පත් කිරීමෙන් සිදු වන විශාල පරිසර හානිය අවම කර ගෙන යන්න මම හිතන්නේ අපට පුළුවන්කම ලැබෙනවා. එදාට මම හිතන්නේ, එතැනින් ඒ ආරම්භ කර ගෙන යන වැඩ පිළිවෙළට අර මහා විශාල ගල් වල, නිකම් තිබිලා, ඒකේ වතුර ටික පිරිලා, එතැන මදුරුවෝ බෝ වෙනවාට වඩා අවශ්‍ය කරන ශක්තිය මම හිතන්නේ මේ තුළින් නිර්මාණය කිරීමේදීත් විපක්ෂයේ සහාය මීට අවශ්‍ය වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මේ වැඩ කටයුතු සාර්ථකව කර ගෙන යාමේදී කළුතර දිස්ත්‍රික්කයේ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා මධ්‍යම රජයෙන් සෘජු දායකත්වයක් මත ලබා දෙන මෙවැනි පහසුකම් ආශිර්වාදයක් වෙනවා. එබැවින් මධ්‍යම රජය මගින් බස්නාහිර පළාත් සභාවේ සිදු කර ගෙන යන උක්ත ව්‍යාපෘතියට බස්නාහිර පළාත් සභාව විසින් අපි හැම දෙනාම එකතු වෙලා ලොකු ශක්තියක් දුන්න එක, මෙය මෙතැනින් ආරම්භ කරන්නේ. ඊළඟට අනිකුත් පළාත් පාලන ආයතන. මෙය බස්නාහිර පළාත් සභාව ආදර්ශයක් කර ගෙන මම හිතන්නේ අනෙකුත් පළාත් සභාවල මේ වාගේ කාර්යයක් කර ගෙන යන්න ඉදිරියට පුළුවන්කම ලැබෙයි කියලා මා ඉල්ලා සිටිමින්, මේකට තමුන්නාන්සේලාගේ දැඩි සහයෝගය ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.36]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද උදෑසන පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මා විසින් කරන ලද පැහැදිලි කිරීමට අදාළව සහෝදර නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ගෙනෙන මේ යෝජනාව ප්‍රදේශයේ ජනතාවට බලපාන බව, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර, බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශ දෙකේ මහජන නියෝජිතයෝ විධියට එහි බරපතළතාවය අපට දැනිලා තිබෙන නිසා මේ කාරණය ඉතාමත්ම කාලෝචිත වෙනවා. හැබැයි, ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා අඳුරේ අතපත ගාමින් මේ කාරණයට ගන්න

හඳුපු ප්‍රවේශය එතුමාට ගන්න බැරි වුණා. එතුමා මේ භූමිය දැකලත් නැහැ. මේ ප්‍රදේශයේ ජන සනත්වය දැකලත් නැහැ. මේ ප්‍රදේශය පිළිබඳව නිසි අවබෝධයක් නැතිකමයි එතුමාගේ කථාව තුළින් පැහැදිලි වුණේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම උදේ කරන ලද පැහැදිලි කිරීමට වැඩිමනක් වශයෙන් මේ අදහස් ඉදිරිපත් කරන්නේ. මේ භූමිය කියලා කියන්නේ පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේදී අවස්ථා දෙකකදී අධිකරණයේ සැලකිල්ලට, නඩු කටයුත්තකට භාජනය වුණු තැනක්. පළමුවැනි අවස්ථාවේ තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂයේ පළාත් පාලන ආයතනය නියෝජනය කරන පානදුර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් මේ කටයුත්තට අදාළව ප්‍රදේශයේ ජනතාවත් එක්ක එකතු වෙලා මේ කටයුත්තට මෙවැනි ජනගහනයක් සිටින මෙවැනි ජන සනත්වයක් තිබෙන ජනතාව අධික ලෙස ජීවත් වන මේ බිම නොවෙයි සුදුසු තැන කියලා ඒ මන්ත්‍රීවරයා ඒ ප්‍රදේශයේ ජනතාව පෙළගැස්සුවා. පානදුර අධිකරණය තුළ ඒ සම්බන්ධයෙන් යම් නඩු කටයුත්තක් මෙහෙයෙව්වා. ඉන් අනතුරුව එම ස්ථානයේ පවුල් 43 ක් පදිංචි කරනු ලැබුවා. ඒ 43 සම්බන්ධයෙන් පානදුර ප්‍රාදේශීය ලේකම්තුමිය, පානදුර අධිකරණයේ නඩුවක් ගෙනාවා. අවසානයේ පානදුරේ ප්‍රාදේශීය ලේකම්තුමියටම සිද්ධ වුණා නඩුව ඉල්ලා අස් කර ගන්න. එහි නෛතික භාවයක්, නීත්‍යානුකූල භාවයක් ඇති කරලා දුන්නා. ඒ ප්‍රදේශයේ පදිංචි ජනතාව සඳහා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අධිකරණ ක්‍රියාමාර්ග ගත්ත මේ භූමිය මේ කටයුත්ත සඳහා නුසුදුසු බව පමණයි ඉතාමත්ම ගෞරවයෙන් අපි සඳහන් කර සිටින්නේ. මේ යෝජනාව ගෙනාපු නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාත්, මමත් මේ ස්ථානය නිරීක්ෂණය කළා. පරීක්ෂා කළා. අපේ ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කියන විධියට කුණු ප්‍රශ්නය විසඳන්න ඕනෑ. ඒ විසඳන්න ඕනෑ තැනට නියමිත තැනක්, භූමියක් තෝරා ගන්න ඕනෑ. මේ තෝරා ගෙන තිබෙන භූමියේ නුසුදුසුභාවය මිස මේ යෝජනාවේ වැරැද්දක් පිළිබඳව අපි කියන්නේ නැහැ. කුණු ප්‍රශ්නය ප්‍රශ්නයක්. කුඩු ප්‍රශ්නය තරමට මේ කුණු ප්‍රශ්නයත් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඒකට සුදුසු බිම සහ සුදුසු ස්ථානය තෝරා ගන්න ඕනෑ. මම විශ්වාස කරනවා, මේ භූමිය පිළිබඳව නිසි පාරිසරික ඇගයීමක් කළා නම්, නිසි පාරිසරික තත්ත්ව වාර්තාවක් ගත්තා නම් කවදාවත් මොනම හේතුවක් නිසාවත් මේ භූමිය තෝරා ගන්නේ නැහැ. මේ ව්‍යාපෘතිය දියත් කරන්න සුදුසු භූමිය විධියට. ඒකට ප්‍රධාන හේතුව. මගේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙහි ජන සනත්වය වර්ග කිලෝ මීටරයක් තුළ පවුල් 1000 කට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මේ ව්‍යාපෘතියේ භූමියත්, පළමුවැනි ගේත් අතර පරතරය මීටර් 3 යි. අනෙක් තැන්වල මේ ව්‍යාපෘතිය සිද්ධ කරලා තිබෙනවා. දොම්පේ ප්‍රදේශයේ මේ ව්‍යාපෘතිය සිද්ධ කරලා තිබෙනවා. දොම්පේ මේ ව්‍යාපෘතිය කරපු තැන විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙන තැනක්. ජන ශූන්‍ය ප්‍රදේශයක තමයි මේක කරලා තිබෙන්නේ. අනුරාධපුරේ කරලා තිබෙනවා. අලි වැටක් පැත්තෙන් පේනවා. ඒ පෙන්වන ඡායාරූපවල පිටිපස්සේ අලි වැට තිබෙනවා. අලි වැටක් සහිත අනුරාධපුර ප්‍රදේශයේ මේක කරලා තිබෙනවා. පානදුර මාලමුල්ල කියලා කියන්නේ සීඝ්‍රයෙන් දියුණු වන, ජන සනත්වය වැඩි, විශාල ජනතාවක් ජීවත් වන භූමි භාගයක්. ඒ නිසා මේ සඳහා සුදුසු තැන මේක නොවෙයි කියන එක අපි කියනවා. දිනකට මෙට්‍රික් ටොන් 5 ක් මෙතැනට ගේන්න සූදානම් කරනවා. ඒක පානදුරෙත් කළුතරත් කුණුවල එකතු වන යට සාරය ගෙනිහිල්ලා මෙතැන තැන්පත් කරන්න හදන්නේ. මම උදේ කිව්වා වාගේම මෙතැන තමයි මීට අවුරුදු සිය ගණනකට ඉස්සෙල්ලා කොළඹ මල්වත්ත පාරේ බිමට අල්ලලා තිබෙන කළුගල් කඩලා ගෙනාවේ මේ කළුගල් වලෙන්. එතැන විශාල පැලුම් තිබෙනවා. මේ සාරය, මේ කුණු ටික මේක ඇතුළට දැම්මාට පස්සේ පොළොවේ ජල ප්‍රමාණය මොන ආස්තර දැම්මත්, ඒක යටට මොන ස්ථරයන් දාලා කුණු දැම්මත් ඒකේ පාරිසරික හානියක් පානීය ජලය සඳහා සිද්ධ වෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණයේදී වෙන තැන්වල නම් මම කිව්වා වාගේ ජනතාව පමණයි. මේ ස්ථානයේ වටිනා සත්ව කොට්ඨාශ ඉන්නවා. මේ වලේ ජීවත් වෙනවා වසර 100 කට වඩා පැරණි ඉබ්බන් ප්‍රමාණයක්. ඒ වාගේම ඉත්තෑවා, මීමින්නා, හඳුන් දිවියා, පිඹුරා, හාවා, නරියා වැනි සතුන් මේ ආශ්‍රිත තිබෙන කැලේ, මේ වනයේ ජීවත් වෙනවා. අනික් තැන්වල හානිය සිද්ධ වෙන්නේ මිනිස්සුන්ට පමණයි. මේකේදී පරිසරයේ ජීවත් වන, පරිසර සමතුලිතතාවය රකින, සතා සිව්පාවාට, ගහකොළයට පවා මේකේ හානිය ගෙන දෙනවා. ඒ නිසා මේ කාරණය නුසුදුසු තත්ත්වයක් බව තමුන්නාන්සේලාට තේරී යන්න ඕනෑ.

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ ගේන කුණුවල එකතු වන ප්ලාස්ටික් සහ අනෙකුත් පොලිතීන් ද්‍රව්‍ය එම ස්ථානයේම පිච්චීමටත් මේ යෝජිත ව්‍යාපෘතිය තුළ තිබෙනවා. ඒ ප්ලාස්ටික් සහ පොලිතීන් පිච්චුවාට පස්සේ ඉන් පරිසරයට එකතු වන, වායු ගෝලයට එකතු වන ඒ හානිකර විෂ වායු ප්‍රමාණය නිසා අධික ජන සනත්වයකින් යුතු මේ ප්‍රදේශයේ මිනිස්සුන්ට හුස්ම ගන්න පවා නිදහසක් නැති තැනට යනවා. එක පැත්තකින් ඒ කාර්යය නිසා හුස්ම ගැනීමට අපහසු වෙනවා. පොළොවට පැලුම් සහිත බිමක ආස්තරයක් දැම්මත්, නොදැම්මත්, ඒ ආස්තරය මත දැම්මත් පානීය ජලයට, භූගත ජලයට එකතු වන නිසා බොන වතුර ටිකටත් මිශ්‍ර වෙනවා. හුස්ම ගන්න තිබෙන වාතයත් හානියට පත් වෙනවා. මේ කාරණා දෙකම නිසා අපි ගෞරවයෙන් කියන්නේ, අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පානදුර, බණ්ඩාරගම සහ කළුතර දිස්ත්‍රික්කයේ විශාල භූමි භාගයන් තිබෙනවා. මේ ජන සනත්වයක් නැති ජන ශූන්‍ය ප්‍රදේශ තිබෙනවා. එවන් තැනක් මේකට යොදා ගැනීම කුණු ප්‍රශ්නයට සරිලන විසඳුම දෙන්න සුදුසු තැනක් බවට පත් වෙනවා. ඒ නිසා ඉතාමත්ම ගෞරවයෙන් කියන්නේ. මහජනතාව විරුද්ධයි. ප්‍රදේශයේ ජනතාව විරුද්ධයි. දූවා දරු දැරියන්ගේ අනාගතයට, අධ්‍යාපනයට මෙය බලපාන නිසා නූපන් දරුවාටත් බලපාන මේ කාරණය පිළිබඳව පළාත් සභාවේ සහ මහ ආණ්ඩුවේ විෂය භාර අමාත්‍යවරු සහ ඒ වගකිවයුතු උදවිය මේ කාරණය කල්පනා කරලා නිසි පිළියමක් යොදන්නය කියලා නැවත වරක් කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.44]

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න ගරු මන්ත්‍රීවරු කටයුතු කළා. මෙතැනදී නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාත්, අපේ ගරු මන්ත්‍රීතුමාත්, විරුද්ධ පක්ෂය නියෝජනය කරමින් එතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කරද්දී ජනතා විරෝධය පිළිබඳව එතුමන්ලා කරුණු ඉදිරිපත් කළා. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මේ කාරණාව ඉදිරිපත් කරනකොට මම මේ කාරණාව පිළිබඳව දැනුවත් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ජාතික මට්ටමේ ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘතිය මාලමුල්ල, ගල්වලේ සනීපාරක්ෂක බිම් සැලැස්මක් හැටියට තමයි ක්‍රියාත්මක කරන්න යෝජනා කරලා තිබෙන්නේ. මේක අක්කර 05 ක ඉඩමක්. මේ ව්‍යාපෘතිය හඳුනා ගැනීමේදී පළාත් සභාව සම්බන්ධ වෙන්න ප්‍රථම පරිසර අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය සෘජුව මැදිහත් වෙලා ඒ ආයතනවල සෘජු අධීක්ෂණය යටතේ බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සහයෝගය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒක අපි පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා මේ ව්‍යාපෘතිය මීට අවුරුදු - මම හිතන්නේ රෙජිනෝල්ඩ් කුරේ ප්‍රධාන අමාත්‍යතුමා, මේ විෂයය භාර ඇමැතිවරයාව සිටියදී හඳුනාගෙන ආරම්භ කරපු වැඩ පිළිවෙළක්. එදා තිබුණු තත්ත්වයයි, අද තිබෙන තත්ත්වයයි අතර ඔබතුමන්ලා කියන කාරණා සනාථ වෙන්න පුළුවන්. නමුත් එදා මෙය ආරම්භ කරනකොට මෙවැනි තත්ත්වයක් මේ පසුබිමේ තිබුණේ නැහැයි කියන තොරතුරු සම්බන්ධයෙන් තමයි මා දැනුවත් වෙලා තිබෙන්නේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි යම්කිසි කාරණාවක් කරද්දී අපේ ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මම විශ්වාස කරන්නේ මෙයට විරුද්ධ වන්නේ නැතිව - මට පුළුවන් ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන්න. ඔබතුමන්ලාට මේ ව්‍යාපෘතිය පිළිබඳව කෙරෙන ක්‍රමය, තාක්ෂණය පිළිබඳව - මොකද, තාක්ෂණය පිළිබඳව මෙතැන දැනුවත් කරන්න මට අවබෝධයක් නැහැ. ඒ පිළිබඳව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ, තාක්ෂණය පිළිබඳව ඔබතුමන්ලාව දැනුවත් කරන්න පුළුවන්. මෙයට නිකම්ම විරුද්ධ වනවාට වඩා. මොකද, ගිය පාර පළාත් සභාවේදී නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කථා කළා කරදියානේ ව්‍යාපෘතිය පිළිබඳව. මේ හැම එකකටම විරුද්ධ වෙලා, විරුද්ධ වෙලා ගියාම අවසානයේදී අපි කොතැනද නවතින්නේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අපට ලෙහෙසියි. මොකද, ආණ්ඩු පක්ෂයක ඉන්නකොට, රජයක් කරනකොට - ඒ වාගේම මේ විවේචන, අඩුපාඩු පෙන්වලා දෙන්න විරුද්ධ පක්ෂයට ලෙහෙසියි. නමුත් මෙහි අනාගතය ගැන හිතලා අපි ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් හැටියටයි මම දකින්නේ. මොකද, මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් අපි මීට අවුරුදු 40 කට, 50 කට උඩදී ගත යුතු තීන්දුවක් නොගැනීම නිසා තමයි අද පළාතක්

හැටියට අපට කුණු ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. නමුත් අද අපි මේ ප්‍රශ්නයෙන් මඟහැරලා ගියොත් අපේ අනාගත පරපුරටත් අපි මේ ප්‍රශ්නය ඉතුරු කරලා යනවා. ඒ නිසා මම විශ්වාස කරනවා. ඔබතුමා කියපු කරුණු කාරණාත් සැලකිල්ලට අරගෙන පළාතේ, මධ්‍යම රජයේ පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය, අපේ අධිකාරිය එකතු වෙලා ඔබතුමන්ලාට මේ ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න පුළුවන්. ඒ දැනුවත් කිරීම හරහා මේක මෙතැනට සුදුසුද නැද්ද? මොකද මම හිතන්නේ මේ වන විට ගිවිසුම් පවා අත්සන් කරලා තිබෙනවා. මෙයට ප්‍රතිපාදන දෙන්නේ කොරියන් රජයෙන්. මම හිතන්නේ මේක අපට ආධාරයක් හැටියට ලබා දෙන එකක්. ණයක් නොවෙයි.

මම හිතන්නේ ඒක නිසා මේ පිළිබඳව ඔබතුමන්ලාගේ, කැමැතිනම් ඔබතුමන්ලා එකඟතාවය දක්වනවා නම් මට ලැහැස්ති කරලා දෙන්න පුළුවන්. මේ අදාළ පාර්ශව පිළිබඳව අදාළ බලධාරීන්ව සම්බන්ධ කරලා මෙය පිළිබඳව ඔබතුමන්ලාව දැනුවත් කරන්නම්. එතැනදී මේ ව්‍යාපෘතිය කළ යුතුයි කියලා අපි හිතනවා නම් - දැන් ඔබතුමන්ලාගේ කථාවේදීම කිව්වා, එදා අපේම පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විරෝධතාවය දක්වලා එතුමා මොකද කළේ, පවුල් ප්‍රමාණයක් පදිංචි කළා කියලා. මොනයම් හෝ බලපෑමක් උඩ නඩුව ඉවත් කරගන්න ඇති. නමුත් ඇත්ත කථාව, එතුමන්ලාට ඕනෑ වුණ දේ ඔබතුමන්ලාට තේරෙනවා. මේක මේ දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. හැමෝම කැමැතියි, තමන්ගේ ප්‍රතිරූපය ගොඩනඟාගන්න. ඊට එහා ගිය කාරණාවක් එතැන තිබෙනවා. මට ඒවා මේ ප්‍රසිද්ධියේ කථා කරන්න බැරි වුණාට. එහෙමනම් ඒ අයට විකල්ප ස්ථාන ලබා දීලා හරි මේ යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි කියන මතයේ තමයි මම ඉන්නේ. ඒ නිසා මේ පිළිබඳව අදාළ නිලධාරීන් සාකච්ඡාවට සම්බන්ධ වෙලා තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමන්ලා එකඟතාවය දක්වනවා නම් ඒ අදාළ ආයතනත් සම්බන්ධ කරගෙන සාකච්ඡාවක් තියලා මෙහි තිබෙන තාක්ෂණය සහ මෙහි තිබෙන ගැටලු, එතකොට ඔබතුමන්ලාට යම් ගැටලුවක් තිබෙනවා නම්, සැකයක් තිබෙනවා නම් ඒක නිවැරදි කරගන්න පුළුවන්. ඒ වාගේම ඔබතුමන්ලා අහන ප්‍රශ්න තුළින් ඒ ප්‍රදේශයට හානියක් වෙනවා නම් ඒකට විකල්පයකුත් අපට සකස් කරගන්න පුළුවන් කියන විශ්වාසය මා තුළ තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. පිළිතුරු කථාව සඳහා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාට විනාඩි දෙකක් තිබෙනවා.

[අ.භා. 01.49]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, බොහොම ස්තුතියි. අපි හිතන්නේ ඔබතුමා මෙහි නිවැරදි කාරණය හඳුනාගත්තා කියලා. ඒ කියන්නේ මෙහි ප්‍රශ්නය තිබෙන්නේ, 2008 දී මේ ව්‍යාපෘතිය යෝජනා කරනකොට ගත්ත ශක්‍යතා අධ්‍යයන වාර්තාවයි, අද තත්ත්වයයි අතර වෙනසක් පවතිනවා. දැන් වන කොට ඒක සීඝ්‍රයෙන් ජනාවාස වෙමින් පවතිනවා. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. අපි හිතන්නේ නැහැ වන්දි දුන්නත් ඒක බේරන්න පුළුවන් වෙයි කියලා. මොකද, පිටින් ප්‍රදේශවල ජනතාව ඇවිල්ලා නිවාස ඉදි කරගෙන පදිංචි වෙලා තිබෙනවා. එතකොට අපට අවශ්‍ය කරන්නේ, මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට විරුද්ධ වීම නොවෙයි. මේක වෙනත් ස්ථානයක පිහිටුවන්න. මේ ස්ථානය දැන් ඒකට සුදුසු නැහැයි කියන එක. ඒ වාගේම තමයි ඔය දැනුවත් කිරීම අපි දෙන්නාට විතරක් නොවෙයි. ඒ ප්‍රදේශයේ ජනතාවටත් සිද්ධ වෙන්න ඕනෑ. ඒ නිසා -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමා ඒ ප්‍රදේශයට කළා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

නමුත් දැන් වෙලා තිබෙන්නේ මෙහෙම නේ. ඒ පන්සලේ නායක හාමුදුරුවෝ ඇතුළු 500 ක් අත්සන් කරලා තිබෙනවා. ජනතා විරෝධයක් තිබෙනවා. ඒ නිසා අන්න ඒ ජනතාවට කරුණු කියලා දෙන්න ඕනෑ. අපි කල්පනා කරනවා මේ පාර්ශවයන් හතරම එකතු වෙලා එතැනට එන්න පුළුවන් නම් හොඳයි කියලා. එතකොට ඔබතුමන්ලා

[ගරු නලින්ද ජයතිස්ස]

එනකොට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාවත් අරගෙන එන්න කියලා යෝජනා කරනවා. එතුමාගේ කථාව එතැනට කියන්නත් ඕනෑ. නැතත් අපි කොහොමත් හැන්සාඩ් එක දෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අපි ඕනෑ තැනක කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 31 (ආ) යටතේ ගෙනා යෝජනාවේ වැඩ කටයුතු අවසන් වෙනවා.

# කල් තැබීම
ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.50 ට, 2014 අගෝස්තු මස 19 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 01.50 p.m till 9.30 a.m. on 19.08.2014*